# කැලණිය විශ්වවිද්‍යාලය

## ශ්‍රී ලංකාව

## වාර්ෂික වාර්තාව හා ගිණුම්
## 2022



අර්බුදය හමුවේ නොසැලෙමින්

# මෙම වාර්තාව පිළිබඳව...

මෙම වාර්තාව මගින් 2022 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කෙරේ. ඒ සඳහා ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රවේශය යොදා ගන්නා ලද අතර, 2022 ජනවාරි 1 සිට 2022 ජනවාරි 31 වන දින දක්වා විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපාය, පාලන කාර්යසාධනය සහ අපේක්ෂාවන් මෙමගින් ආවරණය කෙරේ.

මෙම වාර්තාවේ ශිෂ්‍ය තොරතුරු, උපාධි ප්‍රතිඵල, මානව සම්පත් පිළිබඳ තොරතුරු, පර්යේෂණ හා නවෝත්පාදන, සම්මාන හා ජයග්‍රහණ, ක්‍රීඩා කටයුතු හා ජයග්‍රහණ, සුහසාධන පහසුකම්, යටිතලපහසුකම් සංවර්ධන ව්‍යාපෘති හා මූල්‍ය කාර්යසාධන, වාර්ෂික ගිණුම් සහ තිරසර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත කටයුතු පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. මෙම වාර්තාවේ දක්වා ඇති දත්ත සහ තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන අංශ,අධ්‍යයන අංශ, ඒකක හා මධ්‍යස්ථාන හරහා එක්රැස් කර ගත් ඒවා වේ. මෙම වාර්තාව ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශවලට අනුව, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාය මාර්ග සැලසුම්කරණ සහ විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන සඳහා වන කේන්ද්‍රය සහ පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් සම්පාදනය කරන ලදී.



# දැක්ම

" තිරසර සංවර්ධනය උදෙසා දැනුම නිර්මාණය කිරීමේ සහ බෙදාහැරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම. "

# මෙහෙවර

" නිර්මාණශීලීත්වය හා නව්‍යකරණය තුළින් ජාතික සංවර්ධනය උදෙසා බුද්ධිමත් පුරවැසියන් බිහි කිරීම. "

# පරමාර්ථ

**01**

ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

**02**

විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරාලනු වස් ඉහළම ගුණාත්මකභාවයෙන් යුත් පීඨ සහ කාර්ය මණ්ඩල යක් ගොඩනැගීම.

**03**

ගෝලීය පිළිගැනීමක් ඇති බහු විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීමට.

**04**

ආර්ථික සහ සමාජීය සහභාගීත්ව පරාසයන් පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.

**05**

කාර්යක්ෂම සහ ඵලදායී පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැංවීම.

# උපකුලපතිතුමියගේ පණිවුඩය

**මෑත ඉතිහාසයේ අප මුහුණ දී ඇති උග්‍රතම අර්බුදය වන මෙම ආර්ථික අර්බුදයෙන් අප යළි නැඟී සිටින බවට මට විශ්වාසයි. කෙසේ වෙතත්, හැකිතාක් ඉක්මනින් එලෙස සිදු කිරීමට, අප සියලුදෙනා ම ජාතික ප්‍රයත්නයට සහාය වෙමින්, තවත් වෙහෙසී ක්‍රියා කළ යුතුයි.**



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති,
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලය යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතන අතරින් එකකි. ජාතික සංවර්ධනය උදෙසා කැපවීමේ ප්‍රකාශිත මෙහෙවරක් අප සතු වන අතර, සුවිශේෂී සේවයක් සඳහා අපි කැපවී සිටින්නෙමු.

2022 වසර මැද භාගයේ දී, ශ්‍රී ලංකාව තුළ කොවිඩ් - 19 වසංගතයෙන් හට ගත් සෞඛ්‍යමය බලපෑම ක්‍රමයෙන් පහව යෑමත් සමඟ, විදේශ සංචිත හිඟ වීමෙන් හටගත් ආර්ථික අර්බුදය හේතුවෙන් අධ්‍යාපන අංශයට නොයෙක් අභියෝග එල්ල කරමින්, උග්‍ර විදුලිබල සහ ඉන්ධන හිඟයන් ඇති විය. කෙසේ වෙතත්, කොවිඩ් - 19 වසංගතය කළමනාකරණය කර ගැනීම සඳහා ආදර්ශමත් අයුරින් මුහුණ දීමට හැකි වූ පරිදි ම, මෙම අභියෝගයන්ට ද සාර්ථකව මුහුණ දීමට කැලණිය විශ්වවිද්‍යාලයට හැකි විය.

අපමණ අභියෝග ගණනක් එල්ල වුව ද, 2022 වර්ෂය කැලණිය විශ්වවිද්‍යාලය සඳහා සුවිශේෂී වර්ෂයක් විය. 2020 මාර්තු මාසයෙන් පසු පළමු වරට, සියලු පන්ති කාමර සහ විෂය බාහිර ක්‍රියාකාරකම් 2022 සැප්තැම්බර් මාසයේ පටන් විශ්වවිද්‍යාලය තුළ යළි ඇරඹීමට අපට හැකියාව ලැබුණි. තවද, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද පර්යේෂණ සහ නවෝත්පාදන ක්‍රියාකාරකම් හේතුවෙන්, අවම වශයෙන් වසරකට සුචිගත කළ ලිපි 150ක් සහිතව, ආසන්නතම පූර්ව වසර පහක කාලය තුළ දී කැලණිය විශ්වවිද්‍යාලය SCOPUS හි සුචිගත කළ ප්‍රකාශන 1000ක සීමාව අභිබවා ගියේය. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලයට 2023 වර්ෂය සඳහා Times උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් තුළ වාර්තාකරු තත්ත්වය පිරිනැමුණු අතර, එක්සත් ජාතීන්ගේ තිරසාරාත්මක සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන Times උසස් අධ්‍යාපන බලපෑම ශ්‍රේණිගත කිරීම් තුළ 600 වැනි - 700 වැනි ස්ථානයෙහි ලැයිස්තුගත කෙරිණි. විශ්ව විද්‍යාල ඉතිහාසයේ ප්‍රථම වරට, ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ (WIPO) පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ජාත්‍යන්තර පේටන්ට් අයදුම්පත් තුනක් සාර්ථකව ගොනු කිරීමට අපට හැකි වියි

2022 වසර කැලණිය විශ්වවිද්‍යාලයට තවත් සාර්ථක වසරක් බවට පත්කිරීමට අතිශය අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළ දී පරාර්ථකාමී කැපවීමෙන්, උද්යෝගයෙන් හා වෙහෙස මහන්සි වී කටයුතු කළ අධ්‍යයන, විධායක, අධ්‍යයන සහාය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත මාගේ ස්තූතිය පුද කරමි.

# තොරතුරු සහ සංඛ්‍යා

## විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය







| | |
|---|---|
| Acadamic Staff | 700 \| 44.8% |
| Administrative,Financial & Other Staff | 35 \| 2.2% |
| Acadamic support Staff | 48 \| 3.1% |
| Non-Academic Staff | 779 \| 49.9% |

| | |
|---|---|
| Female | 721 \| 46.2% |
| Male | 841 \| 53.8% |

1 රූපසටහන : වර්ගයට අනුව කාර්ය මණ්ඩල ය (අධ්‍යයන කාර්ය මණ්ඩලය පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වේ.)

2 රූපසටහන : ස්ත්‍රී/පුරුෂභාවයට අනුව කාර්ය මණ්ඩලය




| | Female | Male |
|---|---|---|
| Senior Professor | 15 | 37 |
| Professor | 53 | 62 |
| Senior Lecturer Grade 1 | 76 | 67 |
| Senior Lecturer Grade 2 | 100 | 88 |
| Lecturer | 42 | 19 |
| Lecturer Probationary | 81 | 48 |

3 රූපසටහන : විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය හැර, තනතුරට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය

# තොරතුරු සහ සංඛ්‍යා




| | | | |
|---|---|---|---|
| Doctoral Degree | 15 \| 45.5% | Master's Degree | 15 \| 25.9% |
| Mphil Degree | 53 \| 9.7% | Diploma/Bachelor's Degree/PG Diploma | 53 \| 18.9% |

4 රූපසටහන : කාර්ය මණ්ඩල යේ සුදුසුකම් - අධ්‍යයන කාර්ය මණ්ඩල ය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල ය, පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය




| | | | |
|---|---|---|---|
| Master's Degree | 05 \| 0.6% | Passed GCE A/L Examination | 336 \| 43.1% |
| Bachelor's Degree | 85 \| 10.9% | Passed GCE O/L Examination | 181 \| 23.2% |
| Completed Diploma | 45 \| 5.8% | Up to GCE O/L | 127 \| 16.3% |

5 රූපසටහන : කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අනධ්‍යයන කාර්ය මණ්ඩල ය




6 රූපසටහන : වසර ගණනාවක් තුළ අධ්‍යයන කාර්ය මණ්ඩල යේ සමස්ත සංඛ්‍යාව (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර)

# තොරතුරු සහ සංඛ්‍යා

## විශ්වවිද්‍යාලයේ සිසුන්




| | | |
|---|---|---|
| FCMS | 3438 | 23.6% |
| FSS | 3284 | 22.5% |
| FSC | 2657 | 18.2% |
| FMED | 1432 | 9.8% |
| FHU | 2850 | 19.5% |
| FCT | 933 | 6.4% |

7 රූපසටහන : 2022, දෙසැම්බර් 31 දින වන විට පීඨයට අනුව සමස්ත ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් සිසුන් බඳවා ගැනිම

| | | |
|---|---|---|
| PG Diploma | 28 | 0.9% |
| Mphil Degree | 108 | 3.4% |
| Master's Degree | 28476 | 90.5% |
| Doctoral Dgree | 167 | 5.3% |




8 රූපසටහන : 2022, දෙසැම්බර් 31 දින වන විට වැඩසටහන් වර්ගය අනුව සමස්ත පශ්චාද් උපාධි සිසුන් බඳවා ගැනීම

# තොරතුරු සහ සංඛ්‍යා




9 රූපසටහන : අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා නව බඳවා ගැනීම




10 රූපසටහන : සමස්ත අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීමෙහි ප්‍රවණතාව

# තොරතුරු සහ සංඛ්‍යා

## විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද සුදුසුකම්




| | | | | |
|---|---|---|---|---|
| FCMS | 665 \| 23.3% | | FMED | 211 \| 7.4% |
| FSS | 857 \| 30.1% | | FHU | 604 \| 21.2% |
| FSC | 486 \| 17.1% | | FCT | 27 \| 0.9% |

11 රූපසටහන : පීඨයට අනුව උපාධි අපේක්ෂක නිමැවුම




| | |
|---|---|
| PG Diploma | 51 \| 3% |
| Mphil Degree | 32 \| 1.9% |
| Doctoral Dgree | 26 \| 1.5% |
| Master's Degree | 1576 \| 93.5% |

12 රූපසටහන : පශ්චාද් උපාධිධාරී නිමැවුම




| | | | | |
|---|---|---|---|---|
| FCMS | 95 | 308 | 178 | 84 |
| FCT | | 8 | 3 | 16 |
| FHU | 74 | 381 | 68 | 81 |
| FMED | 5 | 24 | 72 | 110 |
| FSC | 72 | 145 | 86 | 183 |
| FSS | 54 | 714 | 45 | 44 |

13 රූපසටහන : සාධන මට්ටමට අනුව උපාධි අපේක්ෂක නිමැවුම

# තොරතුරු සහ සංඛ්‍යා

## පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණය සඳහා සනාතන සහා සම්මාන




14 රූපසටහන : පර්යේෂණ සහා අරමුදලින් සෑදූ සම්මාන ගණන




15 රූපසටහන : ප්‍රකාශන සහ පේටන්ට් සඳහා සනාතන සහා සම්මාන

# පටුන


iii උපකුලපතිතුමියගේ පණිවුඩය

iv 2022 තොරතුරු සහ සංඛ්‍යා

x පටුන

01 හැඳින්වීම

08 විශ්වවිද්‍යාල පාලනය

27 විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්

36 උපාධිධාරී නිමවුම සහ ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය

43 විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය

46 පර්යේෂණය සහ සංවර්ධනය

52 ශිෂ්‍ය සුබසාධන පහසුකම්

56 ක්‍රීඩා කටයුතු

61 පීඨ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය සහ පුස්තකාලය

104 තිරසර සංවර්ධනය

112 2022 මූල්‍ය ප්‍රකාශ

162 විගණන තොරතුරු ආශ්‍රිත වාර්තා

163 විගණකාධිපතිවරයාගේ වාර්තාව

170 විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය

177 විගණන කමිටු වාර්තාව


# රූපසටහන් ලැයිස්තුව


**රූපසටහන 01**
වර්ගය අනුව කාර්යමණ්ඩලය (අධ්‍යයන කාර්යමණ්ඩලය පුස්තකාල කාර්යමණ්ඩලයේ සාමාජිකයන් 12 දෙනෙකි) iv

**රූපසටහන 02**
ස්ත්‍රී පුරුෂභාවය අනුව කාර්යමණ්ඩලය iv

**රූපසටහන 03**
පුස්තකාල කාර්යමණ්ඩලය හැර, තනතුර අනුව අධ්‍යයන කාර්යමණ්ඩලය iv

**රූපසටහන 04**
කාර්යමණ්ඩලයේ සුදුසුකම් v

**රූපසටහන 05**
කාර්යමණ්ඩලයේ සුදුසුකම් - අනධ්‍යයන කාර්යමණ්ඩලය v

**රූපසටහන 06**
වසර ගණනාවක් පුරා අධ්‍යයන කාර්යමණ්ඩලයේ මුළු සංඛ්‍යාව (පුස්තකාල කාර්යමණ්ඩලය හැර) v

**රූපසටහන 07**
2022 දෙසැම්බර් 31 දිනට පීඨය මගින් සිදු කළ මුළු උපාධි අපේක්ෂක බඳවා ගැනීම vi

**රූපසටහන 08**
2022 දෙසැම්බර් 31 වන විට වැඩසටහන් වර්ගය අනුව මුළු පශ්චාත් උපාධි සිසුන් බඳවා ගැනීම vi

**රූපසටහන 09**
අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා නවකයින් vii

**රූපසටහන 10**
සමස්ත අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රවණතාවය vii

## රූපසටහන 11
පීඨය අනුව උපාධි නිමැවුම viii

## රූපසටහන 12
පශ්චාද් උපාධි නිමවුම viii

## රූපසටහන 13
ජයග්‍රහණ මට්ටම අනුව උපාධි අපේක්ෂක  නිමවුම viii

## රූපසටහන 14
පර්යේෂණ සභාවේ අරමුදල්වලින් සාදන ලද සම්මාන ගණන ix

## රූපසටහන 15
ප්‍රකාශන සහ පේටන්ට් බලපත්‍ර සඳහා සනාතන සම්මාන ix

## රූපසටහන 16
ආයතනික ව්‍යුහය 03

## රූපසටහන 17
2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ සිසුන් 28

## රූපසටහන 18
සේවක වර්ගීකරණය 43


# වගු ලැයිස්තුව


## වගුව 01
සභාවේ සාමාජිකයන් 10

## වගුව 02
2022 වසරේ දී පවත්වන ලද රැස්වීම් ගණන 13

## වගුව 03
වසරේ ප්‍රතිශක්තීකරණ වැඩසටහන් 17

## වගුව 04
තොරතුරු දැන ගැනීමේ පනතට අනුව 2022 දී තොරතුරු නිකුත් කිරීම 20

## වගුව 05
එළවළු වගාවෙහි මුළු එලදාව 23

## වගුව 06
විශ්වවිද්‍යාලය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය 25

## වගුව 07
විශ්වවිද්‍යාලය තුළ කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය 25

## වගුව 08
අවබෝධතා ගිවිසුම් සහ එකඟතා 26

## වගුව 09
අභ්‍යන්තර උපාධි වැඩසටහන් සඳහා මුළු ශිෂ්‍ය බඳවා ගැනීම – දේශීය සිසුන් (2022, දෙසැම්බර් 31 වන දිනට) 29

## වගුව 10
මුළු ශිෂ්‍ය බඳවා ගැනීම - බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන් 31

## වගුව 11
මුළු ශිෂ්‍ය බඳවා ගැනීම - පශ්චාද් උපාධි වැඩසටහන් – දේශීය සිසුන්(2022, දෙසැම්බර් 31 දිනට) 31

## වගුව 12
විදේශීය සිසුන් - ප්‍රථම උපාධි වැඩසටහන් 34

## වගුව 13
විදේශීය සිසුන් - පශ්චාද් උපාධි වැඩසටහන් 35

## වගුව 14
ප්‍රථම උපාධි නිමවුම - අභ්‍යන්තර උපාධි වැඩසටහන් 37

## වගුව 15
ප්‍රථම උපාධි නිමවුම - බාහිර උපාධි වැඩසටහන් 39

## වගුව 16
පශ්චාද් උපාධි නිමවුම් සාරාංශය 39

## වගුව 17
පශ්චාද් උපාධි නිමවුම 40

## වගුව 18
උපාධි ප්‍රදානෝත්සව සහ උපාධි ප්‍රදානය කරනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 42

## වගුව 19
විශ්වවිද්‍යාලයේ වත්මන් කාර්යමණ්ඩලය 44

## වගුව 20
විශ්වවිද්‍යාලයේ ඉහළතම අධ්‍යාපනික සුදුසුකම් 45

**වගුව 21**
විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන නිමවුම 47

**වගුව 22**
පර්යේෂණ සභාව විසින් අරමුදල් සපයන ලද 2022 වසරේ දී පවත්වනු ලැබූ පර්යේෂණ සමුළු 47

**වගුව 23**
අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදානවල විස්තර 48

**වගුව 24**
2022 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය වෙත ලද පේටන්ට් බලපත්‍ර 49

**වගුව 25**
2022 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර 50

**වගුව 26**
2022 වසරේ දී විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමවුම 51

**වගුව 27**
මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව 53

**වගුව 28**
2022 දී නේවාසිකාගාරලාභීන් සංඛ්‍යාව 55

**වගුව 29**
ක්‍රීඩා පහසුකම් 56

**වගුව 30**
ක්‍රීඩා අවස්ථා 57

**වගුව 31**
2022 දී පවත්වන ලද අවස්ථා සහ සහභාගීත්වය 57

**වගුව 32**
තරගවල දී දක්වන ලද දස්කම් 58

**වගුව 33**
අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවයන්හි දී දක්වන ලද දස්කම් – 2022 (2022 දෙසැම්බර් 31 වන දිනට) 58

**වගුව 34**
ජාතික කණ්ඩායම් නියෝජනයන් 59

**වගුව 35**
කාර්යමණ්ඩලය විසින් පවත්වන ලද වෙනත් තනතුරු 60

**වගුව 36**
පරිගණක සහ තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම් 67

**වගුව 37**
පරිගණක සහ තාක්ෂණ පීඨයේ කාර්යමණ්ඩලය 67

**වගුව 38**
මානව ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන අනුව සිසුන් 78

**වගුව 39**
පුස්තකාලය පරිශීලනය කිරීමේ සංඛ්‍යාලේඛන 95

**වගුව 40**
2022 වසරේ දී පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවවල දී උපාධි පිරිනමන ලද බාහිර විද්‍යාර්ථීන් සංඛ්‍යාව 102

**වගුව 41**
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය 113

**වගුව 42**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 115

**වගුව 43**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 117

**වගුව 44**
සමකොටස්වල සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය 118

**වගුව 45**
වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීව කාලය 125

**වගුව 46**
අධිකරණ නඩු 126

**වගුව 47**
වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම 127

**වගුව 48**
විශ්‍රාම පාරිතෝෂිකවල ආයුගණක තක්සේරුව 132

**වගුව 49**
AHEAD ව්‍යාපෘති කටයුතු 135

**වගුව 50**
STHRD ව්‍යාපෘති කටයුතු 137

**වගුව 51**
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 140

**වගුව 52**
අයවැයගත සහ සත්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය 160




# 01. හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයේ මූලාරම්භය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා උදෙසා අධ්‍යාපනික කේන්ද්‍රයක් ලෙස 1875 දී පිහිටුවන ලද ඓතිහාසික විද්‍යාලංකාර පිරිවෙනින් ඇරඹිණි. 1940 සහ 1950 වසරවල දී ශ්‍රී ලංකාවේ නූතන විශ්වවිද්‍යාල පිහිටුවීමත් සමඟ, විද්‍යාලංකාර පිරිවෙන 1959 වසරේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවට පත් වූ අතර, පසු කාලීනව ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ලෙසත්, අවසානයේ දී 1978 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය බවටත් පත් විය.

අධ්‍යයන අංශ 56ක්, අනෙකුත් අධ්‍යයන ඒකක හතරක්, පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාද් උපාධි ආයතනය සහ මෙම විශ්වවිද්‍යාලය සහ පුරා විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ආයතනය වශයෙන් අනුබද්ධිත ආයතන දෙකක් මෙම විශ්වවිද්‍යාලය සතු වේ.

වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, මානවශාස්ත්‍ර පීඨය, විද්‍යා පීඨය සහ සමාජ විද්‍යා පීඨය විශ්වවිද්‍යාලයේ දළුගම ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇති අතර, වෛද්‍ය පීඨය රාගම පිහිටා ඇත. පරිගණක හා තාක්ෂණ පීඨය වර්තමානයේ දී කුලිය මත ලබා ගත් පෑලියගොඩ පිහිටි භූමියක පවත්වා ගෙන යන අතර, 2023 වසරේ දී කැලණිය ප්‍රදේශයේ බුළුගහ හන්දියේ නව ගොඩනැඟිලි සංකීර්ණයක යළි පිහිටුවනු ඇත.

අනෙකුත් පහසුකම් සලකා බැලීමේ දී, විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය, වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන අංශය, ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කේන්ද්‍රය සහ ප්‍රධාන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කේන්ද්‍රය හා ප්‍රධාන පරිපාලන අංශ ද විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. තවද, භික්ෂු නේවාසිකාගාරය මෙන්ම කාන්තා නේවාසිකාගාර සංකීර්ණය දළුගම පරිශ්‍රය තුළ පිහිටා ඇති අතර, පිරිමි නේවාසිකාගාරය සහ කාන්තා නේවාසිකාගාර කිහිපයක් ප්‍රධාන විශ්විද්‍යාල භූමියෙන් පිටත ඊට සමීපව පිහිටා ඇත. වෛද්‍ය පීඨයේ පරිපාලන අංශ, නේවාසිකාගාර සංකීර්ණය, ක්‍රීඩා පහසුකම් සහ පීඨ පුස්තකාලය රාගම පරිශ්‍රයේ පිහිටා ඇත.

විද්‍යා පාඨමාලා සිංහල භාෂාවෙන් පිරිනැමීමට ආරම්භ කළ ප්‍රථම ආයතනය කැලණිය විශ්වවිද්‍යාලය යි. විශ්වවිද්‍යාලය අදාළ අධ්‍යයන ධාරාවල අධ්‍යයන අංශ පිහිටුවීමේ දී ද පුරෝගාමී කාර්යභාරයක් ඉටුකර ඇත. විද්‍යා පීඨයේ කාර්මික කළමනාකරණ අංශය සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය එහි ආරම්භයන් විය. වාග්විද්‍යාව, ලලිත කලා, නූතන භාෂා සහ හින්දිවලට අදාළ විෂයයන් මානවශාස්ත්‍ර පීඨය විසින් ප්‍රථම වරට පිරිනමනු ලැබූ අතර, සමාජ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජන සන්නිවේදන අංශය සහ පුස්තකාල සහ තොරතුරු විද්‍යා අංශ්‍ය පිහිටුවීමෙහිලා පුරෝගාමීත්වය ගෙන කටයුතු කළේය. 2022 වසරේ දී, සමාජ විද්‍යා පීඨයේ තොරතුරු තාක්ෂණ අංශය කැලණිය විශ්වවිද්‍යාලයේ නවීනතම පීඨය ලෙස හඳුන්වා දෙන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් වෙත විශේෂ ඒකක සහ කේන්ද්‍රයන් ඔස්සේ විශේෂිත සේවා සැපයෙයි. ශිෂ්‍ය කටයුතු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, පෞද්ගලික උපදේශන ඒකකය (කළණ මිතුරු සේවන), වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන කේන්ද්‍රය, සංස්කෘතික මධ්‍යස්ථානය, කලා සභාව, පුස්තකාලය (පීඨ පුස්තකාල ඇතුළුව), තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය හා ජාත්‍යන්තර ශිෂ්‍ය කටයුතු ඒකකය මීට ඇතුළත් වේ. කැලණිය විශ්වවිද්‍යාලය නිශ්චිත කාර්යයන් සඳහා විශේෂිත මධ්‍යස්ථාන කිහිපයක් ද පිහිටුවා ඇත. තත්ත්ව සහතිකරණ මධ්‍යස්ථානය(CQA), ක්‍රමෝපායික සැලසුම්කරණය සහ විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන සඳහා මධ්‍යස්ථානය(CSPS), මාධ්‍ය ඒකකය, කාර්ය මණ්ඩල  සංවර්ධන මධ්‍යස්ථානය, තාක්ෂණික හා නවෝත්පාදන අනුග්‍රාහක මධ්‍යස්ථානය, තිරසර සංවර්ධන කේන්ද්‍රය, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE) ක්‍රමෝපායික සන්නාම අනන්‍යතා සංවර්ධනය සඳහා විශිෂ්ඨත්ව කේන්ද්‍රය(CBID), මොඩියුල පද්ධතිය සම්බන්ධීකරණය සඳහා වන අන්තර් පීඨ කේන්ද්‍රය (ICCMS) සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක පියස මීට ඇතුළත් වේ.

විශ්වවිද්‍යාලයේ මානව සම්පතට අධ්‍යයන කාර්යමණ්ඩලය, පරිපාලන කාර්යමණ්ඩලය, අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය අයත් වේ. පහත රූපය මගින් විශ්වවිද්‍යාලයේ සංවිධානාත්මක ව්‍යුහය නිරූපණය කෙරේ(රූප සටහන 1)






Figure 16 : Organizational Structure

# සමාලෝචන වර්ෂය

## හැඳින්වීම

අධ්‍යාපනය කොවිඩ් - 19 වසංගතය හේතුවෙන්, වත්මන් ආර්ථික අර්බුදයට පෙර සිට ම අර්බුදකාරී තත්ත්වයක පැවතිණි. කොවිඩ් - 19 වසංගතය එහි තෙවන වසරටත් ව්‍යාප්ත වීමත් සමඟ කැලණිය විශ්වවිද්‍යාලය සිය සිසුන් හට මාර්ගගත අධ්‍යාපනය සැපයීමේ කාර්යභාරය භාරගත් අතර, ඩිජිටල් පද්ධති සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලි වෙත විතැන් වීම වේගවත් කළේය. මාර්ගගත අධ්‍යාපන කටයුතු සහ සම්පත් සඳහා ඉහළ ගිය ඉල්ලුම, විවිධ ඇගයීම් වර්ග, රැස්වීම් හා සම්මන්ත්‍රණ සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ වේදිකා සහ පුහුණුවීම් කටයුතු සිදු කිරීම සඳහා සහාය ලබා දීමට එහි ඩිජිටල් යටිතල පහසුකම් වර්ධනය කිරීමට විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ඒ හා සමඟ ම, ශිෂ්‍ය නේවාසිකාගාර සහ වෙනත් පොදු ස්ථාන නවීකරණය අලුත්වැඩියා සහ වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය සිසුන් භෞතිකව නොපැමිණීමේ හේතුවෙන් ඇති වූ මෙම අවස්ථාවේ වාසිය ලබා ගත්තේ ය.

සමාලෝචනය යටතේ පවතින වර්ෂයේ දී දී නායකත්වය පිළිබඳ සුවිශේෂී වෙනස්කම් කිහිපයක් සිදු වුණි. පරිගණක තාක්ෂණ පීඨයේ නව පීඨාධිපති ලෙස ආචාර්ය චමිලි පුෂ්පකුමාර මහතා පත් වූ අතර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න මහතා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ නව පීඨාධිපති වශයෙන් පත් කෙරිණි.  මහාචාර්ය එම් එම් ගුණතිලක සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස යළි තෝරා පත් කෙරුණු අතර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ආර්. ඩී. කාලිංගමුදලි විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස යළි තෝරා පත් කෙරිණි.

කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රඥයන් කිහිපදෙනෙකු වෙනත් ආයතන සහ සංවිධානවල ඉහළ ධූරයන්ට පත් කෙරිණි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න, රුසියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස මහාචාර්ය ජේ. ඒ ලියනගේ, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති ලෙස මහාචාර්ය කේ. ඒ. එස්. ධම්මික, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය පී.ඒ. පරණගම, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය එච්.ටී.සී.එස්. අබේසේන, කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛව විද්‍යාව සහ ජෛව තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය පී.ඩී. ගල්හේන මහතා, ඉංග්‍රීසි විෂය පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ලෙස ආචාර්ය රමෝලා රසූල්, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස මහාචාර්ය ඒ.කේ. මනතුංග යන පත්වීම් මීට ඇතුළත් විය.

## අධ්‍යයන කටයුතු, ශිෂ්‍ය ඇතුළත්වීම් සහ උපාධිය ලැබීම

කැලණිය විශ්වවිද්‍යාලය අධ්‍යයන කටයුතු යළිත් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී ම සිදු කර ගෙන යෑම 2022, සැප්තැම්බර් 5 වන දින ආරම්භ කළ අතර, එදින පටන් බොහෝ දේශන භෞතිකව පැවැත්විණි. පන්තිකාමර ඉඩකඩ හිඟවීම්වලට හිලව් වීම සඳහා දේශන කිහිපයක් මාර්ගගත ව පැවැත්වුණි.

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නව අභ්‍යන්තර උපාධි අපේක්ෂක සිසුන් 4,129ක් ලියාපදිංචි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ මුළු අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 14,548ක් දක්වා ඉහළ ගියේය. 2020/21 අධ්‍යයන වර්ෂය තුළ විදේශීය සිසුන්ගේ නව ලියාපදිංචි කිරීම 23ක් විය. බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ සමස්ත සිසුන් ගණන 102,402ක් වූ අතර, කැලණිය විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා සිසුන් 3,179ක් ලියාපදිංචි විය.

2022 වසර සඳහා උපාධිධාරී නිමවුම අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා උපාධිධාරීන් 3040ක් ද, විදේශීය උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා 3,315ක් සහ පශ්චාත් උපාධි වැඩහටහන්වලින් 1,685ක් විය. තවද, 2022 වසර තුළ දී උපාධි ප්‍රදානෝත්සව 10ක් පවත්වා ඇත.

# කාර්ය මණ්ඩලය, පත් කිරීම් සහ සේවයෙන් ඉල්ලා අස්වීම්

2022 වසරේ දී බඳවාගත් සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩල  සාමාජිකයින් ගණන 42ක් වූ අතර, අධ්‍යයන කාර්ය මණ්ඩල  සාමාජිකයින් 35කු ඉල්ලා අස් වී සහ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල  සාමාජිකයින් දෙදෙනෙකු බඳවා ගැනුණු අතර, දෙදෙනෙකු සේවයෙන් ඉල්ලා අස් විය. අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස පුද්ගලයන් දෙදෙනෙකු බඳවා ගැනුණු අතර, සාමාජිකයන් 17ක් සේවයෙන් ඉල්ලා අස් වූ අතර, වසර තුළ දී විශ්වවිද්‍යාලයෙන් අනධ්‍යයන සාමාජිකයන් පස් දෙනෙකු ඉල්ලා අස් විය. ඒ අනුව, විශ්වවිද්‍යාලය විසින් සමස්තයක් ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයින් 46කු බඳවා ගෙන ඇති අතර, (59) දෙනෙකු විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස් වී හෝ සේවයෙන් විශ්‍රාම ලබා ඇත.

# පර්යේෂණ සහ සංවර්ධනය හා සම්මාන

2022 වසරේ දී, කැලණිය විශ්වවිද්‍යාලය විද්‍යුත් ජර්නල ඇතුළුව SCOPUS සුචිගත නිර්දේශක ශාස්ත්‍රීය සඟරාවල පූර්ණ පර්යේෂණ පත්‍රිකා, විද්‍යුත් ජර්නල ඇතුළුව සුචිගත නොකළ නිර්දේශක නිර්දේශක ශාස්ත්‍රීය සඟරාවල පූර්ණ පර්යේෂණ පත්‍රිකා, සම්මන්ත්‍රණ කටයුතුවල සාර සංක්ශේප සහ පූර්ණ පර්යේෂණ පත්‍රිකා, ග්‍රන්ථ පරිච්ඡේද, 218 SCOPUS සුචිගත නිර්දේශක ප්‍රකාශන වන, කතුවරයෙකු හෝ ප්‍රකාශකයෙකු විසින් ප්‍රකාශනය කරන ලද පෙළ පොත් යනාදී වශයෙන් විවිධ ප්‍රවර්ග ගණනාවකට අයත් ප්‍රකාශන 884ක් පළ කර ඇත.

ශාස්ත්‍රඥයන් පර්යේෂණ සිදු කිරීමට දිරිමත් කිරීම සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රයත්න ඇගයීම සඳහා 2019, 2021 සහ 2022 යන වර්ෂවල දී  විද්‍යා උපුටන අනුක්‍රමනිකාව (SCI) සමාජ විද්‍යා උපුටන අනුක්‍රමනිකාව (SSCI) කලා සහ මානවශාස්ත්‍ර උපුටන අනුක්‍රමනිකාවෙහි සුචිගත කළ ශාස්ත්‍රීය සඟරාවලි ප්‍රකාශිත පර්යේෂණ ලිපි සඳහා සෙනට් සම්මාන 121ක් සහ මුදල් ත්‍යාග පිරිනැමිණි. තවද, SCOPUSහි සුචිගත කළ ජර්නලයන්හි තම පර්යේෂණ ලිපි පළ කළ ශාස්ත්‍රඥයන් වෙත සෙනට් සම්මාන 58ක් සහ මුදල් ත්‍යාග පිරිනැමුණු අතර, 2020 සහ 2021 යන වසරවල දී SCOPUS සුචිගත පර්යේෂණ සැසි කටයුතුවල දී පළ කළ පූර්ණ පත්‍රිකා සඳහා සෙනට් සම්මාන 20ක් සහ මුදල් ත්‍යාග පිරිනමනු ලැබීය. පේටන්ට් බලපත්‍ර ලබා ගත් පුද්ගලයන් සඳහා සමස්තයක් ලෙස සෙනට් සම්මාන 15ත් සහ මුදල් ත්‍යාග පිරිනමා ඇති අතර, විදෙස් සංචාර 2ක් ද පිරිනමා ඇත.

2022 ඔක්තෝබර් 10 වන දින පළ කළ සම්මත උපුටන දර්ශකවල  යාවත්කාලීන කළ විද්‍යා ව්‍යාප්ත කතුවර දත්ත සමුදායන් තුළ ලොව විශිෂ්ටතම විද්‍යාඥයන් 2% අතරට කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් මහාචාර්යවරුන් සිව් දෙනෙකු ශ්‍රේණිගත වී ඇති අතර, ඔවුන් නම් වශයෙන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනක ද සිල්වා (වෛද්‍ය අධ්‍යයන අංශය), ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා (පරපෝෂවේද අධ්‍යයන අංශය සහ උප කුලපති), මහාචාර්ය අනුරාධනී කස්තුරිරත්න (මහජන සෞඛ්‍ය අධ්‍යයන අංශය) සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අසිත ද සිල්වා ( ඖෂධවේද අධ්‍යයන අංශය) වූහ.  එල්සෙවියර් (Elsevier) විසින් තම SCOPUS දත්ත සමුදාය මගින් සපයන ලද දත්ත භාවිත කරමින් ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් මෙම විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම මහාචාර්යවරු සිව්දෙනා මෙම ලැයිස්තුවේ ඇතුළත් කළ ශ්‍රී ලංකාව පදනම් කරගත් විද්‍යාඥයන් 38 දෙනා අතර සිටිති.

# ශ්‍රේණිගත කිරීම්

2022 වසරේ දී UI GreenMetric ශ්‍රේණිගත කිරීම සඳහා අයදුම් කළ විශ්වවිද්‍යාල 1050 අතරින්, කැලණිය විශ්වවිද්‍යාලය 2021 වසරේ පැවති තම ගෝලීය ශ්‍රේණිය වන 247 සිට 2022 වසරේ දී 241 දක්වා ඉදිරියට යමින්, 2022 UI GreenMetric ශ්‍රේණිගත කිරීමේ දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර ප්‍රමුඛතම හරිත විශ්වවිද්‍යාලය ලෙස ශ්‍රේණිගත කෙරිණි.

කැලණිය විශ්වවිද්‍යාලය UI GreenMetric ශ්‍රේණිගත කිරීම සඳහා තිරසර විසඳුම සඳහා වන මධ්‍යස්ථානය (CSS) ඔස්සේ අයදුම් කළ අතර, පාරිසරික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සහ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ස්වකීය උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක පෙළගස්වා ගැනීමට ක්‍රියා කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය අංශ විශ්වවිද්‍යාලය බවට එය පත්විය. UI GreenMetric ශ්‍රේණිගත කිරීම් 2021 ඔක්තෝබර් සිට 2022 ඔක්තෝබර් දක්වා වූ කාර්යසාධනය මත පදනම් විය.

මීට අමතරව, ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම්වල (Times Higher Education ))Impact Rankings - THE) ගෝලීයව 601-800 යන කාණ්ඩයෙහි ද කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ තෙවන ස්ථානය ද ශ්‍රේණිගත විය. මෙය එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළව කාර්යසාධනය මත පදනම්ව, THE බලපෑම් ශ්‍රේණිගත කිරීම (The Impact Rankings) සඳහා කැලණිය විශ්වවිද්‍යාලය අයදුම් කළ ප්‍රථම අවස්ථාව යි. තවද, කැලණිය විශ්වවිද්‍යාලය 2022 වසරේ දී THE (Times Higher Education) ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් සඳහා අයදුම් කළ අතර, 'වාර්තාකරු' තත්ත්වය ලබා ගැනීමට හැකියාව ලැබිණි.

මෙම විශ්වවිද්‍යාලය 2022 වසරේ දී (SCIMAGO) ආයතන ශ්‍රේණිගත කිරීම විසින් දේශීය විශ්වවිද්‍යාල අතර සිව්වන ස්ථානයටත්, ගෝලීය විශ්වවිද්‍යාල අතර 691 වන ස්ථානයටත් ශ්‍රේණිගත කර ඇත. SCIMAGO යනු පර්යේෂණ කාර්යසාධනය, නව්‍යකරණ නිමවුම් සහ සමාජගත බලපෑම විශ්ලේෂණය කරන, අන්තර් ක්‍රියාකාරී විවෘත ප්‍රවේශය සහිත වේදිකාවකි. කැලණිය විශ්වවිද්‍යාලය පසුගිය සය වසර තුළ SCOPUS සූචිගත කළ ප්‍රකාශනයන්හි මනා ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

තවද, කැලණිය විශ්වවිද්‍යාලය දේශීය වශයෙන් 6 වන ස්ථානයේ සහ QS ආසියානු විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල 451-500ත් අතර ශ්‍රේණිගත කර ඇත. මෙම 2022 ශ්‍රේණිගත කිරීම් සඳහා අධ්‍යයන සහ සේවා යෝජක කීර්තිනාමයන්, ආචාර්ය උපාධියක් සතු කාර්යමණ්ඩල සාමාජිකයන් ගණන සහ ජාත්‍යන්තර ශිෂ්‍ය ප්‍රතිශතය ඇතුළුව ප්‍රධාන දර්ශක 11ක් මත ලකුණු ලබා දෙන ලදී.

THE Impact Rankings

University Green Metric Rankings

Webometrics

QS Asian University Rankings

# අනෙකුත් සුවිශේෂී අවස්ථා

ක්‍රීඩා සම්බන්ධව සලකා බැලීමේ දී, රග්බි (පිරිමි), කරාතේ (පිරිමි), අත්පන්දු (පිරිමි) සහ කැරම් (පිරිමි) යන ක්‍රීඩාවල ක්‍රීඩා අවස්ථා හතරක දී අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවයන්හි ශූරයන් බවට පත්වීමට කැලණිය විශ්වවිද්‍යාලයට හැකි විය. තවද, මෙම විශ්වවිද්‍යාලයට පැසිපන්දු (පිරිමි), අත්පන්දු (කාන්තා), බැඩ්මින්ටන් (පිරිමි) සහ කරාතේ (කාන්තා) යන ක්‍රීඩාවල අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවයන්හි 1 වන අනුශූරයන් බවට පත් වීමට හැකි විය. එමෙන්ම, විශ්වවිද්‍යාල කණ්ඩායම්වලට මල්ලව පොර (පිරිමි), පැසිපන්දු (කාන්තා) සහ ධාවන පථය සහ ක්ෂේත්‍රය (කාන්තා) හි 2 වන අනුශූරතාව සහ බැඩ්මින්ටන් (කාන්තා). ටෙනිස් (කාන්තා), දැල්පන්දු (කාන්තා) සහ හොකී (කාන්තා) හි 3 වන අනුශූරතාව ලබා ගැනීමට හැකි විය.

"ක්‍රීඩා අංශයෙන් ලබා ගත් ජයග්‍රහණවලට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලය "අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන නව්‍ය ක්‍රමවේද" උදෙසා වූ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයෙන් පවත්වන ලද තරඟයේ දී දෙවන ස්ථානයට පත් විය.

# අනාගතය සඳහා ඉදිරි දැක්ම

වර්තමානයේ දී, කැලණිය විශ්වවිද්‍යාලය තෙවසරක චක්‍රවලින් උපාය මාර්ගික සැලැස්ම පිළියෙළ කරන අතර, වත්මන් චක්‍රය 2022- 2024 වේ. ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික පදනමක් මත පිළියෙළ කෙරෙන අතර, වාර්ෂිකව ප්‍රතිශෝධනය කෙරේ. මෙම විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මෙහි ඉලක්ක පහක් ඇත (පහත බලන්න).

| | |
|---|---|
| 1 **ඉලක්කය:** | උසස් තත්ත්වයකින් සහ නම්‍යශීලී ඉගැන්වීමේ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට |
| 2 **ඉලක්කය:** | විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක අත්කර ගැනීම සඳහා උසස්තම තත්ත්වයෙන් යුත් පීඨය සහ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීමට. |
| 3 **ඉලක්කය:** | ගෝලීය මට්ටමේ බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීමට. |
| 4 **ඉලක්කය:** | ආර්ථික සහ සමාජ බැඳියාව පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වර්ධනය කිරීමට |
| 5 **ඉලක්කය:** | කාර්යක්ෂම සහ සඵලදායී පරිපාලන සහ මූල්‍ය කළමනාකරණයක් ඔස්සේ විශිෂ්ට පාලන පද්ධතියක් සංවර්ධනය කිරීමට |

කොවිඩ්-19 වසංගතය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය විසින් නිර්මාණය කරන ලද අසාමාන්‍ය තත්ත්වයන් නොතකමින් 2030 වසරෙන් ඔබ්බට ගමන් කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ප්‍රයත්න දරයි. කැලණිය විශ්වවිද්‍යාලය දැනටමත් 2022 වසරේ දී QS ආසියානු විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වෙත සහ ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම සඳහා පිවිසී ඇත. ඉදිරියේ දී කැලණිය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීම සඳහා අපි අඛණ්ඩව වෙහෙසී ක්‍රියා කරන්නෙමු. පවතින මෙම ආර්ථික අර්බුදය ශ්‍රී ලංකා රජයෙන් හිමි වන අරමුදල් උග්‍ර ලෙස පහළ වැටීමට හේතු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, වත්මන් ආර්ථික පසුබිම සලකා බැලීමේ දී දැනුම කාර්යසාධන දර්ශක අත්කර ගැනීම සහ උපාය මාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්මෙහි කටයුතු සම්පූර්ණ කිරීම පසුබට කරවනසුලු කර්තව්‍යයක් වී තිබේ.

විශ්වවිද්‍යාලය 2030 වසරෙන් ඔබ්බට සැලසුම් කිරීමත් සමඟ, උපාය මාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්ම නැඟී එන අධ්‍යාපන පසුබිම කරා පහසුකම් සැලසීමට සකස් කර ඇති නමුත්, පවතින අර්බුදය මගින් මෙම සැලැස්මන් තුළ ඇතුළත් කර තිබෙන කටයුතුවල ප්‍රගතිය අවහිර කිරීමට බෙහෙවින් ඉඩ ඇත. ජාතික තිරසර සංවර්ධන වැඩසටහන වෙත දායක වීම සහ උපාධිධාරී සේවා නියුක්තිය වැඩි දියුණු කිරීම අඛණ්ඩව මෙම විශ්වවිද්‍යාලයේ මුඛ්‍ය ප්‍රමුඛතාවන් වනු ඇත. යටිතලපහසුකම්වල සීමාවන් මගින් විශ්වවිද්‍යාලයේ කෙටි කාලීන-මැදි කාලීන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම නිසි පරිදි සිදු නොවනු ඇත.

දැනට පවතින අභියෝග නොතකමින්, කීර්තිමත් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සමඟ සහයෝගාත්මක හවුල්කාරිත්වයන් කිහිපයක් ආරම්භ කිරීමට විශ්වවිද්‍යාලයට හැකි වී ඇත. විශේෂයෙන් ම, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ඔස්සේ වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන එක් අවුරුදු ශාස්ත්‍රපති මට්ටමේ වැඩසටහනෙන් පශ්චාද් උපාධිධාරී සහ වෙනත් සුසුදුකම් ලබා ගැනීම සඳහා චීන සිසුන් සඳහා අවස්ථාව සැපයීමට මහජන චීන ජනරජයෙන් වර්ධනය වන උනන්දුවක් ඇත. විශ්වවිද්‍යාලය පර්යේෂණ නිමවුම සහ ජාත්‍යන්තර ශිෂ්‍ය බඳවා ගැනීම වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, ඉදිරි වසරවල දී ජාත්‍යන්තර අවස්ථා ගවේෂණය කිරීමට අඛණ්ඩව ක්‍රියා කරනු ඇත.



# 02. විශ්වවිද්‍යාල පාලනය

කැලණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි දක්වා ඇති ආයතනික ව්‍යුහය සහ වගකීම් සමඟ මෙන්ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ මගින් කලින් කලට සපයනු ලබන රෙගුලාසි සහ මාර්ගෝපදේශ සමඟ අනුකූල වේ.

පාලක සභාව, සනාතන සභාව සහ පීඨ මණ්ඩල, විවිධ මට්ටම්වල දී මාර්ගෝපදේශන සම්පාදනය කරනු ලබන ව්‍යවස්ථාපිත ආයතන වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ ආයතනික සටහන එහි සියලු කාර්ය මණ්ඩලයේ තනතුරු සහ ඔවුන්ගේ රාජකාරි, වගකීම් සහ වාර්තාකරණ රේඛාවන් නිර්වචනය කරයි.



# කුලපති, උප කුලපති සහ විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

කුලපති යනු උපාධි ප්‍රදානෝත්සවය මෙහෙයවන විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වන අතර, උප කුලපතිවරයා යනු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා, සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා වේ. උප කුලපතිවරයා නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකු වන අතර, විශ්වවිද්‍යාල සභාවේ සභාපති සහ සෙනට් සභාව එම දෙපාර්ශ්වය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකියනු ලැබේ. පීඨාධිපතිවරයා එක් එක් පීඨයේ අධ්‍යයන සහ පරිපාලන ප්‍රධානියා වන අතර, එහි අදාළ පීඨ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සභාපතිවරයා වේ. ඔවුහු සභාවේ සහ සෙනට් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ වෙති. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා විසින් සෙනට් සභාවේ මඟපෙන්වීමට සහ පාලනයට යටත්ව, පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු මෙන්ම, විශ්වවිද්‍යාලය තුළ සිදු කෙරෙන විශේෂිත හෝ බහු විෂය පර්යේෂණ සම්බන්ධීකරණය සහ නියාමනය කිරීමේ වගකීම දරනු ලබයි. ලේඛකාධිකාරීවරයා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය ක්‍රියාමාර්ග සඳහා වගකියන අතර, විශ්වවිද්‍යාලයේ ලේඛන සහ දේපළ ඔහු භාරයේ පවතියි. ඔහු පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් පත් වූ ලේකම්වරයා යි. පුස්තකාලයාධිපති විශ්වවිද්‍යාල පුස්තකාලයේ මෙහෙයුම් කටයුතු සඳහා වගකීම දරන අතර, ඔහු ද සනාතන සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකි. මූල්‍යාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ මූල්‍යයන් කළමනාකරණය කිරීමේ සහ ගිණුම් පවත්වා ගෙන යෑමේ වගකීම දරනු ලබයි.

# විශ්වවිද්‍යාල පාලක සභාව

මෙම සභාව විශ්වවිද්‍යාලයේ විධායකය සහ පාලන අධිකාරිය යි. කැලණිය විශ්වවිද්‍යාලයේ සභාව උප කුලපතිවරයා, පීඨාධිපතිවරුන් හත් දෙනෙකු, සනාතන සභාව එහි සාමාජිකයන් අතරින් පත් කළ සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන් එකොළොස්දෙනෙකු ගෙන් සමන්විත වේ. උපකුලපතිවරයා සභාවේ සභාපතීත්වය දරන අතර, ලේඛකාධිකාරීවරයා ලේකම් ලෙස කටයුතු කරයි. සභා සාමාජිකයන් අධ්‍යයන කාර්යමණ්ඩලය බඳවා ගැනීම සහ ප්‍රවර්ධනය සඳහා තේරීම්කාරක කමිටුවලට මෙන්ම, පහත දක්වා ඇති ව්‍යවස්ථාපිත කමිටුවලට ද සහභාගී වේ:

- මූල්‍ය කමිටුව
- විගණන කමිටුව
- දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා වන මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව

| නම | රැස්වීම් සඳහා සහභාගීත්වය 01.01.2022 සිට 31.12.2022 |
|---|---|
| **උපකුලපති** | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ආර්. ද සිල්වා මිය | 13 |
| **පීඨයන්හි පීඨාධිපතිවරුන්** | |
| ආචාර්ය පී. එන්. ඩී. ප්‍රනාන්දු/ වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | 13 |
| ආචාර්ය ආර්. එල්. සී. එස් පුෂ්පකුමාර/ පරිගණක සහ තාක්ෂණ පීඨය | 12 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.ඩී ආරියරත්න[1] | 4 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඒ. කේ. පී. ජේ. සෙනෙවිරත්න/ පශ්චාද් අධ්‍යයන පීඨය | 9 |
| ආචාර්ය යූ. එස්. සෙනරත්/ මානවශාස්ත්‍ර පීඨය | 13 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ජේ. ද එස්. හේවාවිසෙන්ති/ වෛද්‍ය පීඨය | 11 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ආර්. ඩී, කාලිංගමුදලි/ විද්‍යා පීඨය | 13 |
| මහාචාර්ය එම්. එම්. ගුණතිලක/ සමාජ විද්‍යා පීඨය | 13 |
| **සෙනට් නියෝජිත** | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඉන්දුරාගාරේ ධම්මරතන හිමි | 9 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඒ. කේ. පී. ජේ. සෙනෙවිරත්න[2] | 4 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. එච්. සුමතිපාල | 8 |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පත්වීම්ලාභීන්** | |
| මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන | 11 |
| රඛිත ශ්‍රී දර්ශන අබේගුණවර්ධන | 13 |
| මහාචාර්ය රන්ජිත් අර්තනායක | 12 |
| සංජය බණ්ඩාර මහතා | 6 |
| එස්. එම්. ගෝඨාභය ජයරත්න | 12 |
| මහාචාර්ය ආනන්ද පටබැඳිගේ | 12 |
| මහාචාර්ය නිමල් පෙරේරා | 4 |
| මහාචාර්ය රොහාන් රාජපක්ෂ | 12 |
| එල්. ඊ. සුසන්ත සිල්වා මහතා | 12 |
| එස්. කේ. සිරිල් සුදුවැල්ල මහතා | 12 |
| උපාලි විජයවීර මහතා | 12 |
| **සභාවේ ලේකම් – ලේඛකාධිකාරි (නිල බලයෙන්)** | |
| කේ. කේ. කේ. ධර්මතිලක මහතා | 13 |

වගුව 1 : සභා සාමාජිකයන්

1 ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.ඩී. ආරියරත්න මහතාගේ ධූර කාලය 2022, මාර්තු 08 වන දින අවසන් විය.

2 මහාචාර්ය එන්. ඒ.කේ.පී. ජේ. සෙනෙවිරත්න මහතා 2022, ජනවාරි 1 සිට 2022, මාර්තු 08 දක්වා සෙනට් නියෝජිතයෙකු ලෙස සේවය කර ඇත.

# සනාතන සභාව

සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය වන අතර, නිල බලයෙන් පත් වූ සභාපතිවරයා වන උපකුලපතිවරයා, PGIAR සහ PGIPBS හි අධ්‍යක්ෂවරුන්, පීඨයන්හි පීඨාධිපතිවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ මහාචාර්යවරුන්, පුස්තකාලයාධිපති, සෑම පීඨයකින් ම අදාළ පීඨයේ ස්ථිර ශාස්ත්‍රඥයන් අතරින් තෝරා පත්කර ගත් අධ්‍යයන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. සෙනට් සභාව, එහි රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී පහත අංශ සඳහා ස්ථාවර කමිටු කිහිපයක් පත් කර ඇත.

- තත්ත්ව සහතිකකරණය
- විෂය මාලාව, ඉගැනීම, ඉගැන්වීම සහ ඇගැයීම
- පුස්තකාලය
- නිවාඩු සහ ප්‍රදාන
- පර්යේෂණ හා ප්‍රකාශනි
- ශිෂ්‍ය බඳවා ගැනීම
- ගෞරව උපාධි

# පීඨ මණ්ඩල

පීඨ මණ්ඩල සනාතන සභාවේ පාලනයට යටත්ව, අදාළ පීඨවල ඉගැන්වීම, විභාග පරීක්ෂණ සහ පර්යේෂණවලට අදාළ කරුණු නියාමනය කරයි. සියලුම අධ්‍යයන අංශ අදාළ පීඨ මණ්ඩලයේ විෂය පථය යටතට අයත් වේ. අධ්‍යයන අංශය විෂයමාලාව සංවර්ධනය කිරීම, ඉගැන්වීම, ඇගයීම්, පර්යේෂණය සහ එක් එක් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අදාළ අධ්‍යයන කරුණු සඳහා වගකියනු ලැබේ.

# පාලන ලේඛනඃ උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

2022 වසරේ දී, කැලණිය විශ්වවිද්‍යාලය වසර 5ක ආයතනික සැලැස්මක් වෙනුවට වසර 3ක උපාය මාර්ගික සැලැස්මක් අනුගමනය කිරීමට තීරණය කළේය. 2022- 2024 සඳහා වන උපාය මාර්ගික සැලැස්ම ඉදිරි තෙවසර සඳහා විශ්වවිද්‍යාලයේ හවුල්කරුවන් සමඟ එහි සමස්ත දැක්ම බෙදා ගන්නා අතරතුර විශ්වවිද්‍යාලයේ ඉතා වැදගත් ආයතනික තීරණ බලපවත්වමින් සහ කාර්ය මණ්ඩලය සහ සිසුන් යන දෙපාර්ශ්වයේ ප්‍රමුඛත්වය දී ඇති අවශ්‍යතාවන්ට පිළියම් යොදන, ප්‍රායෝගිකව සලකා බලන, යතාර්ථවත් සහ යෝග්‍ය උපාය මාර්ගික සැලැස්මක් ලෙස නිර්මාණය කර ඇත. ඉදිරි තෙවසරක කාලය පුරා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු සඳහා මඟපෙන්වන හරයන් එකතුවක් සම්බන්ධ කිරීම සඳහා වේදිකාවක් ද මෙමගින් තැනෙයි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2022 - 2024 යන කාලය සඳහා විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්ම හා අනුකූලව, 2022 සඳහා වන කටයුතු මත ඍජුව ඉලක්කගත කෙරේ. උපායමාර්ගික සැලැස්ම විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කර ඇත.

# ව්‍යවස්ථාපිත කමිටු

## මූල්‍ය කමිටුව

කැලණිය විශ්වවිද්‍යාල සභාව එම සභාව සඳහා සහාය ලබා දීමට මූල්‍ය ආශ්‍රිත කරුණු සලකා බලමින් නිර්දේශ සිදු කිරීමට මූල්‍ය කමිටුවක් පත් කර ඇත. මූල්‍ය කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

- උප කුලපති - සභාපති
- පීඨාධිපතිවරුන්
- පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු
- ලේඛකාධිකාරී
- මූල්‍යාධිකාරී (කැඳවුම්කරු)

මූල්‍ය කමිටුව මසකට වරක් මුණ ගැසෙන අතර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා බැඳුණු සියලු විෂයයන්ට අදාළව තීරණ ගනී. වැඩසටහන් අයවැය ඇතුළුව සියලු මූල්‍ය කාරණා පාලන නියාමන සහ විශ්වවිද්‍යාල සංවර්ධන සැලැස්මට අනුකූලව නිසි පරිදි ඇගයීමට ලක් කෙරේ. මූල්‍ය කමිටුවේ නිර්දේශ පාලක සභාවේ අනුමැතිය සඳහා යොමු කෙරේ. උපකුලපති, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී,අධ්‍යයන අංශ ප්‍රධානීන්, අංශ ප්‍රධානීන් හෝ සනාතන සභාව විසින් යොමු කරන ගැටලු මූල්‍ය කමිටුව වෙත ලැබේ. මූල්‍ය කමිටුව පාලක සභාවේ අනු කමිටුවලින් එකකි.

## ප්‍රසම්පාදන කමිටු

2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ එහි පසුකාලීන සංශෝධනයන්ට අනුකූලව අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් පත්කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ. එබැවින්, මෙම විශ්වවිද්‍යාලයට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු දෙකක් ඇත. ඒවා නම්, ප්‍රධාන දෙපාර්තමේන්තු කමිටුව සහ සුළු දෙපාර්තමේන්තු කමිටුවයි. ප්‍රධාන දෙපාර්තමේන්තු කමිටුව විසින් රුපියල් මිලියන 50ට අඩු ප්‍රසම්පාදන භාර ගන්නා අතර, සුළු දෙපාර්තමේන්තු කමිටුව විසින් වත්මන් මාර්ගෝපදේශවලට අනුව රුපියල් මිලියන 200ක් දක්වා ප්‍රසම්පාදන භාර ගැනේ. සභාපති වශයෙන් උප කුලපතිවරයා ද, අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් පත්කළ සාමාජිකයෙකු සහ 3වන සාමාජිකයා ලෙස මූල්‍යාධිකාරීවරයාගෙන් ප්‍රධාන දෙපාර්තමේන්තු කමිටුවේ සංයුතිය සෑදී ඇත. සභාපති වශයෙන් උප කුලපතිවරයා ද, සාමාජිකයන් වශයෙන් ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී යන පාර්ශ්වයන්ගෙන් මෙම සුළු දෙපාර්තමේන්තු කමිටුවේ සංයුතිය සෑදී ඇත. මේ අතර, රු. 500, 000/-ක් දක්වා ප්‍රසම්පාදන භාර ගැනීමට පාලන ආයතනයක් විසින් පත් කරන ලද සැපයුම් කමිටුවක් ද ඇත. මීට අමතරව, ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන AHEAD ව්‍යාපෘතිය යටතේ සිදු කළ ප්‍රසම්පාදන පාලනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් පත් කරන ලද ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවක් ද විශ්වවිද්‍යාලය සතු ය.

# විගණන කමිටුව

මහජන ව්‍යාපාර චක්‍රලේඛ අංක P.E.D./31ට අනුව, විගණන කමිටු රැස්වීම වසරකට අවම වශයෙන් සිව් වරක්වත් පැවැත්විය යුතුය. මෙම සභාවට විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාර්යයන් සහ ආශ්‍රිත කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව සිදු කර ගෙන යෑම සඳහා සහාය වීම විගණන කමිටුවේ ප්‍රධාන අරමුණයි.

විගණන කමිටුවේ ප්‍රධාන වගකීම් වන්නේ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය සහ අධීක්ෂණය, මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලි අඛණ්ඩව සිදු කර ගෙන යෑම, විශ්වවිද්‍යාලයේ මූල්‍යයට අදාළ ඕනෑම කරුණක් පරීක්ෂා කිරීම, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන්වල අනුමැතිය, අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන අධීක්ෂණය, බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය සහ නිර්දේශ අනුව ක්‍රියා කිරීම යි. ඔවුන්ගේ සමාලෝචනය, අධීක්ෂණය සහ සාර්ථක කාර්යසාධනයක් තහවුරු කිරීමට පද්ධති පාලන සමඟ අනුකූලත්වය පරීක්ෂා කිරීම, පිරිවැය පිරිමැසුම්දායක බව සඳහා කාර්යසාධනය නිත්‍ය පරාසයන්වල දී සමාලෝචනය කිරීම සහ අපතේ යන වියදම් මුලිනුපුටා දැමීම යනාදිය, ව්‍යවස්ථාවන්, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛ සමඟ අනුකූල වන බව නිසැකව දැන ගැනීම, විගණන කමිටුවේ සියලු වගකීම් වේ.

වගුව 2 : 2022 වසරේ දී පවත්වන ලද රැස්වීම් ගණන

| ව්‍යවස්ථාපිත කමිටු | පවත්වන ලද රැස්වීම් ගණන |
|---|---|
| පාලක සභාව | 13 |
| සෙනට් සභාව | 12 |
| මූල්‍ය කමිටුව | 12 |
| විගණන කමිටුව | 4 |

# පර්යේෂණ සඳහා සදාචාරාත්මක ප්‍රමිති

සදාචාරාත්මක සමාලෝචන කමිටු දෙකක් විශ්වවිද්‍යාලය සතු වේ. විද්‍යාර්ථීන්, පශ්චාත් උපාධි සිසුන්, ශාස්ත්‍රඥයන් සහ පුළුල් පර්යේෂක ප්‍රජාව අතර පර්යේෂණ ආචාර ධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා වෛද්‍ය පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව 1995 වසරේ දී පිහිටුවන ලදී. පෙජව වෛද්‍ය පර්යේෂණය සඳහා සහභාගී වන මිනිසුන් රැක ගැනීම එහි මූලික අරමුණයි. ශ්‍රී ලංකාවේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවල මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කෙරෙන සමාලෝචන සහ නියාමන ක්‍රියාවලි සහ අදාළ අනෙකුත් ජාතික සහ ජාත්‍යන්තර ව්‍යවස්ථා සම්පාදන සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලබන සමාලෝචන සහ නියාමන ක්‍රියාවලි ඔස්සේ මෙය සාක්ෂාත් කෙරේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සමාලෝචන කමිටුව උසස් තත්ත්වයෙන් යුත් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා 2016 දී පිහිටුවනු ලැබූ අතර, විශ්වවිද්‍යාලයීය දැක්ම සහ මෙහෙවරෙහි දක්වා ඇති පරිදි උසස්තම සදාචාරාත්මක ප්‍රමිති පවත්වා ගෙන යෑම සඳහා කැප වී සිටියි. කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සමාලෝචන කමිටුව මගින් වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, මානවශාස්ත්‍ර පීඨය, විද්‍යා පීඨය සහ සහ සමාජීය විද්‍යා පීඨය විසින් පවත්වනු ලබන පර්යේෂණවලට අදාළව පර්යේෂණ ආචාරධර්ම පැතිකඩ කිහිපයක් ආවරණය කෙරේ.

# සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම

විශ්වවිද්‍යාලයීය සෞඛ්‍යය සේවය එහි සිසුන්ට සහ කාර්යමණ්ඩලයට සෞඛ්‍යමත්, ක්‍රියාශීලී දිවිපෙවෙතක් ගත කිරීමට සහාය වීම සඳහා වෙර දරයි. එය සිසුන්ගේ සමාජීය යහපැවැත්ම සඳහා දායක වන අතර, පූර්ණ, නිවාරක සෞඛ්‍ය සේවයක් සපයයි. “ප්‍රමාණවත් වෛද්‍ය ප්‍රතිකාර සහ කුඩා රෝගාබාධවලට පවා සැලකිල්ල යොමු කිරීම මගින් බරපතල රෝග හට ගැනීම වළක්වා ගත හැකි වීම, දේශනවලට සහභාගී නොවීමේ අනුපාතය අවම කිරීම සහ බෝවන රෝග ව්‍යාප්තිය පාලනය කිරීම”, විශ්වවිද්‍යාලයීය වෛද්‍ය මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වයේ ප්‍රධාන අරමුණු වේ.

වෛද්‍ය මධ්‍යස්ථානය විසින් බාහිර රෝගීන් සඳහා උපදේශනය, දෛනික වෛද්‍ය ප්‍රතිකාර සහ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා හදිසි වෛද්‍ය ප්‍රතිකාර සපයනු ලබන අතර, රෝගීන්ගේ අවශ්‍යතා සහ අවස්ථාවන්ට අනුව අදාළ වෛද්‍ය සායන වෙත යොමු කිරීම හෝ රෝහල්වල තෘතියික රැකවරණය සඳහා මාරු කෙරේ. මෙම සේවාවන් සැපයීම සඳහා, සුදුසුකම්ලත් කාර්යමණ්ඩලයක්, මනා උපාංගවලින් සමන්විත රසායනාගාරයක්, ඔසුසැලක් සහ අනෙකුත් නවීන පහසුකම් යනාදිය මෙම වෛද්‍ය මධ්‍යස්ථානය සතු වේ. දන්ත සායන සහ ආයුර්වේද වෛද්‍ය පහසුකම් ද මෙම වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකිය.

2022 ජනවාරි මාසයේ සිට, විශ්වවිද්‍යාලයීය වෛද්‍ය මධ්‍යස්ථානය විසින් මනෝ චිකිත්සා අංශය සහ වෛද්‍ය පීඨය විසින් පහසුකම් සපයන ලද, විශේෂයෙන් ම එහි අරමුණු වූයේ මානසික සෞඛ්‍යය සායනයක් ආරම්භ කරනු ලැබූ අතර, තුරුණු ප්‍රජාව අතර පවතින මානසික ගැටලු සඳහා පිළියම් යෙදීම ය. විශේෂඥ මනෝචිකිත්සකයන් විසින් සියලු උපදේශන සැසි සහ ප්‍රතිකාරයන් සිදු කරනු ලබන අතර, දැඩි රහස්‍යභාවය පවත්වා ගෙන යනු ලැබේ.

වෛද්‍ය මධ්‍යස්ථානය නිවාරණ වෛද්‍ය රැකවරණයෙහි සහ පසු විපරම් කිරීම සහ නිරීක්ෂණය ඔස්සේ විශ්වවිද්‍යාලයීය ප්‍රජාවගේ ප්‍රජා සෞඛ්‍ය කෙරෙහි ද නියැලෙයි. කොවිඩ් - 19, ඩෙංගු උණ, ආහාර මගින් හට ගන්නා රෝග වැනි සංක්‍රාමික රෝග ව්‍යාප්ත වන අවස්ථාවේ දී, විශ්වවිද්‍යාලයීය වෛද්‍ය මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා නිවාරණ ක්‍රියාමාර්ග සහ සෞඛ්‍ය අධ්‍යාපනික කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

## කොවිඩ් - 19 වසංගත කාලය තුළ සහ පශ්චාද් කොවිඩ් - 19 කාලය තුළ සෞඛ්‍ය කළමනාකරණය

කොවිඩ් - 19 වසංගතය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය වෙත සුවිශාල අභියෝග එල්ල කළේය. සෞඛ්‍ය අමාත්‍යංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ජාතික මාර්ගෝපදේශ අනුගමනය කිරීම මගින්, කැලණිය විශ්වවිද්‍යාලය මෙම ගෝලීය වසංගතයට සාර්ථකව මුහුණ දුන් අතර, 2022 වසර මුළුල්ලේ මාර්ගගත හෝ භෞතික ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු, විභාග පරීක්ෂණ සහ පර්යේෂණ සිදු කිරීම ඇතුළුව, එහි සිසුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් අඛණ්ඩව සිදු කළේය. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලයට ඉතා සුළු ප්‍රමාදයක් සහිතව එහි අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව සිදුකර ගෙන යෑමට හැකි වූ අතර, 2022 සැප්තැම්බර් මාසයේ දී අපගේ සියලු සිසුන් යළිත් වරක් විශ්වවිද්‍යාලය කරා ගෙන ඒමට හැකි විය.

කැලණිය විශ්වවිද්‍යාලය 2022 වසරේ දී ජාතික වැඩසටහන හා එක්ව, එම විශ්වවිද්‍යාල භූමිය තුළ කොවිඩ්-19 නිශ්චිතව පාලනය කිරීමේ වැඩසටහනක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.



# අ අවදානම අවම කිරීම සඳහා වන කොවිඩ්-19 ප්‍රතිචාර කමිටුව

වෛද්‍ය පීඨයේ මහජන සෞඛ්‍ය පිළිබඳ මහාචාර්ය, රාජිත වික්‍රමසිංහ මහතා විසින් මෙම කමිටුවේ සභාපතීත්වය දරනු ලැබූ අතර, ප්‍රධාන වෛද්‍ය නිලධාරී, වෛද්‍ය චින්තක රත්නායක මහතා විසින් මෙහි සම්බන්ධීකරණය සිදු කරන ලදී. උපකුලපතිනිය වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය මෙම කමිටුවේ රැස්වීම් සඳහා නිතිපතා සහභාගී වූවාය.

මෙම කමිටුව පීඨාධිපතිවරුන් 7 දෙනෙකු, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති, මහජන සෞඛ්‍ය පරීක්ෂක, එක් එක් පීඨයෙන් සාමාජිකයන් දෙදෙනෙකු අධ්‍යයන සහ අනධ්‍යයන, අධ්‍යක්ෂවරුන්, සමිති නායකයන්, වෛද්‍ය පීඨයේ වෛද්‍ය ක්ෂුද්‍ර ජීවවිද්‍යා අංශ ප්‍රධානී, වෛද්‍ය ක්ෂුද්‍ර ජීවවිද්‍යා මහාචාර්ය සහ කැලණියේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා ඇතුළුව, සාමාජිකයන් 65 දෙනෙකු ගෙන් සමන්විත විය. කමිටු රැස්වීම් දෙසතියකට වරක් පවත්වන ලදී.

සැලසුම් කිරීම, මාර්ගෝපදේශ සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සමීක්ෂණය සහ අවස්ථාව සමාලෝචනය කිරීම හා කාලීන ක්‍රියාමාර්ග ගැනීම මෙම කමිටුවේ මෙහෙවර විය.

විශ්වවිද්‍යාලය විසින් ගත යුතු වඩාත් උචිතම ක්‍රියාමාර්ග සම්බන්ධව තීරණය කිරීම පිළිබඳව කමිටුව විසින් සපයන ලද උපදේශය සහ මාර්ගෝපදේශය සහ එවැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සහ එවැනි ක්‍රියාමාර්ග අඛණ්ඩව අධීක්ෂණය සහ සමීක්ෂණය කිරීම සඳහා කමිටු සාමාජිකයන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මගින් දෙවසරකට වැඩි කාලයක් පුරා මෙම ගෝලීය වසංගත මගින් එල්ල වූ අභියෝග සාර්ථකව කළමනාකරණය කිරීමට මෙන්ම, අපගේ සිසුන් සහ කාර්යමණ්ඩලය මත ඉන් ඇති වූ බලපෑම අවම කිරීමට හැකියාව ලැබුණි.

2022 දෙසැම්බර් 28 වන දින පවත්වන ලද එහි රැස්වීමේ දී, යළි අවශ්‍යතාවක් ඇතිවුවහොත් නැවතත් ආරම්භ කිරීමේ කොන්දේසිය මත, කමිටුව විසින් තවදුරටත් රැස්වීම් පැවැත්වීම සහ කොවිඩ්-19 ආශ්‍රිත කටයුතු තාවකාලිකව අත්හිටුවීමට තීරණය කළේය.

# අධ්‍යාපනික කටයුතු: ආ

කොවිඩ් - 19 ව්‍යාප්ත වීමේ අවදානම අවම කිරීම සඳහා, බොහෝ සිසුන් සඳහා වසරේ මුල් භාගය තුළ දී අධ්‍යයන කටයුතු අඛණ්ඩව මාර්ගගත සිදු කෙරිණි. කෙසේ වෙතත්, අවම එක්රැස් වීමේ ප්‍රමාණයක් සහ නිසි අවදානම් තක්සේරුවකින් අනතුරුව "ජීව බුබුල" ප්‍රවේශය අනුගමන කරමින්, සෞඛ්‍ය අවශ්‍යතාවන්ට අනුකූලව, අවශ්‍ය පරිදි විභාග පරීක්ෂණ සහ ප්‍රායෝගික පන්ති විශ්වවිද්‍යාල භූමියේ දී සිදු කෙරිණි.

2022 සැප්තැම්බර් සිට, සියලු අධ්‍යයන කටයුතු සහ අනෙකුත් විෂයබාහිර කටයුතු දැඩි කොවිඩ් - 19 අධීක්ෂණ ක්‍රියාමාර්ග යටතේ යළි ආරම්භ කෙරිණි. ශ්වසන රෝග ලක්ෂණ සහිත සිසුන් වෙන් වෙන් වශයෙන් හුදෙකලා කෙරුණු අතර, ඔවුන් සාමාන්‍ය කටයුතු සඳහා මුදා හැරීමට පෙර දින 5-7ක කාලයක් සඳහා වෛද්‍ය මධ්‍යස්ථානය විසින් අධීක්ෂණය කරනු ලැබිණි.



## ඇ වෛද්‍ය මධ්‍යස්ථානය

සෞඛ්‍ය කාර්යමණ්ඩලයේ සියලු ප්‍රවර්ගයන් උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ වෛද්‍ය පීඨයේ ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ පවුල් වෛද්‍ය අංශයන්හි සහ කැලණිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඔවුන්ට අදාළ ක්ෂේත්‍රයන්හි අනුගමනය කළ යුතු ක්‍රියාමාලාවන් සම්බන්ධව අඛණ්ඩව පුහුණු කෙරිණි.

පහත දක්වා ඇති පාලන ක්‍රියාමාර්ග සඳහා අතිරේක අරමුදල් සපයන ලදී:

- මුහුණු ආවරණ ඇතුළුව පෞද්ගලික ආරක්ෂණ උපකරණ මිල දී ගැනීම
- දේශන ශාලා, නේවාසිකාගාර, පන්තිකාමර සහ වාහන (කොවිඩ් ආසාධිත පුද්ගලයන් සහ ඔවුන්ගේ ආශ්‍රිතයන් ප්‍රවාහන කරන ගිලන් රථ) සඳහා සනීපාරක්ෂක සහ විෂබීජ නාශක.
- පෝස්ටර ( සියලු ඒකකයන්හි ප්‍රදර්ශනය කෙරිණි)
- පාදයෙන් ක්‍රියාත්මක වන දෑත් සේදීමේ ඒකක ප්‍රමාණවත් පරිදි යෙදීම
- සියලු ප්‍රවේශයන් සඳහා අධෝරක්ත උෂ්ණත්වමාන
- විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයේ වැඩිදියුණු කළ පහසුකම්

## ඈ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂාව:

SARS CoV-2 සඳහා වන ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂාව සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ දී සහ වෛද්‍ය පීඨයේ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශයේ රසායනාගාර තුළ නොමිලයේ සිදු කරන ලදී. වෛද්‍ය මධ්‍යස්ථානය සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂාවන් 1,117ක් පවත්වන ලදී.

## ඉ ආර් ටී -පී සී ආර්:

විශ්වවිද්‍යාල ප්‍රජාවට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය පරිදි මහජන සාමාජිකයන් සඳහා වෛද්‍ය පීඨයේ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශයේ රසායනාගාරයන් තුළ SARS CoV - 2 පරීක්ෂණ සඳහා ආර් ටී - පී සී ආර් නොමිලයේ සිදු කරන ලදී.

## ඊ Covitriage SL ජංගම යෙදවුමේ භාවිතය:

අවදානම තක්සේරු කිරීම සහ වෛද්‍ය කළමනාකරණ සැලැස්ම හඳුනා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ වෛද්‍ය සහ විද්‍යා පීඨ උගතුන් කණ්ඩායමක් විසින් කොවිඩ් ආසාධිත රෝගීන් සඳහා Covitriage SL නම් වූ ජංගම යෙදවුම සංවර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාලය තුළ කොවිඩ් ආසාධිත රෝගීන් නිරෝධායන මධ්‍යස්ථානය වෙත මාරු කිරීමට පෙර අවදානම තක්සේරු කිරීම සඳහා එය විශේෂයෙන් ම ප්‍රයෝජනවත් විය.

## ට කැලණිය විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ නිවාස පදනම් කරගත් රැකවරණ මධ්‍යස්ථානය(IHBCC):

විශ්වවිද්‍යාල ආගන්තුක නිවාසය විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය අතර කොවිඩ් ආසාධිත රෝගීන් සඳහා මනා උපාංගවලින් සමන්විත නිවාස නිරෝධායන මධ්‍යස්ථානයකට පරිවර්තනය කෙරිණි. 2022, මාර්තු 10 වන දින තෙක් කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර සමස්තයක් ලෙස කොවිඩ් - 19 ආසාධිත කාර්ය මණ්ඩල සාමාජිකයන් 24 දෙනෙකු හට ප්‍රතිකාර ලබා දුන් අතර, ඉන් අනතුරුව මෙම මධ්‍යස්ථානය එහි මුල් අරමුණ වූ විශ්වවිද්‍යාලයීය ආගන්තුක නිවාසය බවට ප්‍රතිවර්තනය කෙරිණි.

## ප්‍රජා එන්නත්කරණය ඨ

එන්නත්කරණ වැඩසටහන් කිහිපයක් දළුගම සහ කැලණිය පරිශ්‍රයේ දී කාර්යමණ්ඩලය සහ සිසු සිසුවියන් සඳහා පැවැත්විණි.

වගුව 3 : වසරේ එන්නත්කරණ වැඩසටහන්

| එන්නත්කරණය | කාර්යමණ්ඩල සංඛ්‍යාව | දිනය |
|---|---|---|
| සයිනොෆාම් 01 සහ 02 මාත්‍රා | 30 | 2022, පෙබරවාරි 14<br>2022, පෙබරවාරි 15 |
| ෆයිසර් වර්ධක මාත්‍රාව | 377 | 2022, පෙබරවාරි 15 |
| | 42 | 2022, පෙබරවාරි 28<br>2022, පෙබරවාරි 29 |

## කොවිඩ් ආසාධිත කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා සුබසාධන පහසුකම් ඩ



කොවිඩ් 19 ආසාධිත යැයි පරීක්ෂණයෙන් තහවුරු වූ හෝ කොවිඩ් ආසාධිතයන්ගේ පළමු පෙළ ආශ්‍රිතයන් වූ විශ්වවිද්‍යාලයීය සේවකයෝ බොහෝ දෙනෙකු ප්‍රතිකාර සෙවීමේ දී සහ/ හෝ රජය හෝ සෞඛ්‍ය අමාත්‍යංශය විසින් පවත්වා ගෙන යන හුදෙකලා මධ්‍යස්ථාන සෙවීමේ දී දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. කොවිඩ් - 19 ප්‍රතිචාර සමාලෝචන කමිටුවේ නිර්දේශය මත, එවැනි දුෂ්කරතාවන්ට මුහුණ දුන් පුද්ගලයන් සඳහා උපකුලපති අරමුදලින් මූල්‍ය සහාය ලබා දීමට තීරණය කෙරිණි. එබැවින්, විශ්වවිද්‍යාලය විසින් උපරිම මාස 18ක ආපසු ගෙවීමේ කාලයක් සහිතව පොලී රහිත ණය යෝජනා ක්‍රමයක් සහ රෝගියාගේ (සේවකයා) ප්‍රවාහන වියදම රු. 15,000/-ක් දක්වා ප්‍රතිපූර්ණය කිරීම හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම එක් එක් අවස්ථාවට අනුව, ගන්නා ලද තීරණය සමඟ ඉල්ලීම් මත සේවකයන් හට ලබා දෙන ලදී.

## අධ්‍යාපනික වැඩසටහන්: ඪ

ප්‍රජාව අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා උපකුලපතිනිය, ප්‍රධාන වෛද්‍ය නිලධාරී, මාධ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය පීඨයේ/ අනෙකුත් පීඨවල මහාචාර්යවරුන්/ ජ්‍යෙෂ්ඨ දේශකයන් සහ සිසුසිසුවියන්ගේ සහභාගීත්වය ඇතිව, රූපවාහිනී නාලිකා, ගුවන්විදුලි නාලිකා, සමාජ මාධ්‍ය සහ පුවත්පත්වල අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් විකාශය සහ පළ කෙරිණි.

ඔ

## කොවිඩ්-19 සංඛ්‍යාලේඛන

2021 අගෝස්තු - 2022 දෙසැම්බර් යන කාලය පුරා, වෛද්‍ය මධ්‍යස්ථානය විසින් කොවිඩ් පරීක්ෂාවේ සහ කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර ආසාධිතභාවයේ සටහන් මෙන්ම, දෑත් සේදීමේ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් පවත්වා ගෙන යෑම පිළිබඳ සතිපතා මහජන සෞඛ්‍ය නිලධාරී පරීක්ෂාව පවත්වා ගෙන ලදී. මෙම  වාර්තාව කොවිඩ් ප්‍රතිචාර කමිටුවේ සභාපතිනිය වන, උපකුලපතිනිය වෙත සතිපතා (මාසික සාරාංශයක් මගින් සමන්විත වූ) ඉදිරිපත් කෙරුණු අතර, ලේඛකාධිකාරී. පීඨාධිපතිවරුන්, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති සහ අනෙකුත් කමිටු සාමාජිකයන් වෙත පිටපත් කෙරිණි.



# තත්ත්ව සහතිකකරණය

විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 2019/09 යටතේ පිහිටුවා ඇති තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය විසින් පහසුකම් සලසනු ලැබේ.

තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව SSC-QA විසින් මඟ පෙන්වනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසින් තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලැබේ. අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකවලට (Cells) සියලුම පීඨ හතෙහි,  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය හා පරිපාලනය අංශය සහ IQAC-ADMIN සහ පුස්තකාලය යන පීඨ හා අංශවල තත්ත්ව සහතිකකරණ සෛල (FQACs) ඇතුළත් වේ.

තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව මාසිකව රැස්වන අතර, පීඨ තත්ත්ව සහතිකකරණ සෛල FQACs හතෙහි ප්‍රගතිය සහ අනෙකුත් අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කව මෙම කමිටුව වෙත වාර්තා කරන අතර, අභ්‍යන්තරීකරණය වැඩිදියුණු කිරීම පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ මනා පරිචයන් බෙදා ගනී. 2022 වසරේ දී, සනාතන සභා ස්ථාවර කමිටු රැස්වීම් 12ක් පවත්වන ලදී.

## බාහිර සමාලෝචන

- 2021 වසරේ පවත්වන ලද ආයතනික සමාලෝචනයේ දී විශ්වවිද්‍යාලයට “B” ශ්‍රේණිය හිමි විය.  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට ප්‍රථම, සෙනට් සභාව සහ විශ්වවිද්‍යාල සභාව විසින් අනුමත කරන ලද, වාර්තාවේ සිදු කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කෙරිණි.
- පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ විද්‍යාවේදී ගෞරව උපාධිය යන වැඩසටහන්වල සහ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන්වල වැඩසටහන් සමාලෝචනය සම්පූර්ණ කෙරිණි. වැඩසටහන් ද්විත්ත්වයට ම “A” ශ්‍රේණි හිමි විය.
- බාහිර උපාධි වැඩසටහන් සමාලෝචනය සඳහා සිදු කළ ස්ථානීය සංචාර; ශාස්ත්‍රවේදී උපාධිය, වාණිජවේදී උපාධිය, ව්‍යාපාර කළමනාකරණ උපාධිය සහ විද්‍යාවේදී උපාධිය (භෞතික චිකිත්සාව) සම්පූර්ණ කරන ලදී. සමාලෝචන වාර්තා ලැබීමට අපේක්ෂිත ය.

## ප්‍රතිපත්ති ලේඛන සහ මාර්ගෝපදේශ සකස් කිරීම

තත්ත්ව සහතිකරණ මධ්‍යස්ථානය CQA 2022 වසරේ දී පහත ලේඛන සකස් කිරීම සඳහා උපකාරී විය:

- සම තත්ත්වයේ නිරීක්ෂණ (Peer Evaluation) පිළිබඳ ප්‍රතිපත්තිය
- අධ්‍යයන මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා මෙහෙයුම් නිර්ණායක
- අධ්‍යයන වගවීම සඳහා වන රාමුව
- පරිපාලන අංශ සඳහා ක්‍රියාමාර්ග අත්පොත සකස් කිරීම (සිදු කෙරෙමින් පවතී)
- කැලණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සුදුසුකම් පිළිබඳ රාමුව සංශෝධනය කිරීම (සිදු කෙරෙමින් පවතී).

## වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

2022 වසරේ දී තත්ත්ව සහතිකරණ මධ්‍යස්ථානය පැතිකඩ කිහිපයක් මත වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී:

- සම තත්ත්වයේ නිරීක්ෂණ
- ලේඛන කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම
- පශ්චාද් උපාධි සමාලෝචනය සඳහා (SER) ලේඛකයන් පුහුණු කිරීම
- පශ්චාද් උපාධි වැඩසටහන් සංශෝධනය කිරීම
- විභාග පරීක්ෂණ ආශ්‍රිත කටයුතු

# 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනත සමඟ විශ්වවිද්‍යාල අනුකූලත්වය

## නිකුත් කළ තොරතුරුවල විස්තර

කැලණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණය විසින් රජයේ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතෙහි විධිවිධාන සමඟ අනුකූල වීමේ වැදගත්කම හඳුනා ගන්නා ලදී. එය විශ්වවිද්‍යාලයීය තීරණවල පාරදෘශ්‍යභාවය යන මූලධර්මය සමඟ ද අනුකූල විය. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලය 2022 වසරේ දී විවිධ ගැටලුවලට අදාළව සියලු තොරතුරු නිකුත් කර ඇත. එවැනි ඉල්ලීම්වල තොරතුරු සහ විශ්වවිද්‍යාලයේ තොරතුරු නිකුත් කිරීම පහත දක්වා ඇත (වගුව 4).

| තොරතුරු ඉල්ලා සිටි පුද්ගලයාගේ නම | ඉල්ලීම සිදු කළ දිනය | තොරතුරු යැවූ දිනය | තොරතුරුවල ස්වභාවය |
|---|---|---|---|
| ජී.ආර්.එන්.විජයරත්න | 2022.02.10 | 2022.03.03 | නාට්‍ය හා රංග කලාව සහ දෘශ්‍ය කලා යන විෂයයන්හි ලලිත කලා අංශයෙහි ස්ථිර සේවක ගණයේ අධ්‍යයන ධූර සඳහා තෝරා ගැනීම සම්බන්ධව තොරතුරු |
| මහාචාර්ය ප්‍රශාන්ති නාරන්ගොඩ මිය | 2022.02.09 | 2022.03.14 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පැට්‍රික් රත්නායකට එරෙහිව, පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආචාර්ය අරුණ කීර්ති ගමගේ විසින් සිදු කළ පැමිණිල්ල සම්බන්ධව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න විසින් යොමු කරන ලද වාර්තාවේ සහතික කළ පිටපත |
| එච්. එච්. සී. ජයලාල් | 19.01.2022 | 17.02.2022 | ඔහුගේ ඉල්ලා අස්වීම සම්බන්ධව සභාවේ තීරණය සඳහා සිදු කළ ඉල්ලීම |
| ආචාර්ය අරුණ කීර්ති ගමගේ | 10.02.2022 | 11.03.2022 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පැට්‍රික් රත්නායකට එරෙහිව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න විසින් යොමු කරන ලද වාර්තාවේ සහතික කළ පිටපත |
| ආචාර්ය එස්.බී.එච්. ප්‍රභාත් ඉන්දික පෙරේරා | 10.03.2022 | 14.09.2022 | සමාජ විද්‍යා අංශයේ ස්ථිර සේවක ගණයෙහි අධ්‍යයන ධූර සඳහා තෝරා ගැනීම පිළිබඳ තොරතුරු |
| | 02 | 10 වන ශිෂ්‍ය පර්යේෂණ සමුළුව, 2022 ජනවාරි 18 වන දින, මූල්‍ය අංශය |
| | 03 | ව්‍යාපාර තොරතුරු පිළිබඳ 13 වන ජාත්‍යන්තර සම්මේලනය - 2022 නොවැම්බර් 18 වන දින |
| | 04 | ගිණුම්කරණ පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයන් සඳහා වන 8 වන ජාත්‍යන්තර සම්මේලනය (ICARE)-2022, දෙසැම්බර් 15 වන දින. |
| FCT | 05 | තාක්ෂණය සහ පරිගණනයෙහි (ICATC) ප්‍රගමනයන් පිළිබඳව 5 වන ජාත්‍යන්තර සම්මේලනය, 2022 දෙසැම්බර් 2 වන දින, ව්‍යවහාරික පරිගණන අංශය |
| | 06 | තාක්ෂණය සහ පරිගණනය පිළිබඳව 7 වන ජාත්‍යන්තර සම්මේලනය, 2022 දෙසැම්බර් 3වන දින |
| FGS | 07 | 2021 ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව (IPRC), 2022 ජනවාරි 12 වන දින |
| | 08 | 2022 ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව (IPRC), 2022 දෙසැම්බර් (28) වන දින |

| පීඨය | අංකය | විස්තරය |
|---|---|---|
| FHU | 09 | මානව සම්පත් විද්‍යාර්ථී පර්යේෂණ සමුළුව (HUG), 2022, 2022 පෙබරවාරි 24 වන දින |
| FMED | 10 | In Focus 2022 - ශිෂ්‍ය පර්යේෂණ සංසදය, 2022 ඔක්තෝබර් 6 වන සහ 7 වන දින |
| FSC | 11 | සුහුරු පරිගණනය සහ පද්ධති ඉංජිනේරුකරණය (විද්‍යුත් සමුළුව) පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 සැප්තැම්බර් 16 වන දින |
| | 12 | ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යාව පිළිබඳ 3 වන ජාත්‍යන්තර සමුළුව - 2022, ඔක්තෝබර් 14 වන දින |
| FSS | 13 | සිව්වන ජාත්‍යන්තර අධ්‍යයන සිසුන්ගේ පර්යේෂණ සමුළුව 2021, 2022 මාර්තු 11 වන දින, ජාත්‍යන්තර අධ්‍යයන අංශය |
| | 14 | මාධ්‍ය සහ සන්නිවේදන ජාත්‍යන්තර සමුළුව සඳහා ආසියානු කොන්ග්‍රසය, 2022, ඔක්තෝබර් 27 සිට 29 වන දින දක්වා, ජන සන්නිවේදන අංශය |

# අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන - 2022

2022 දී පෙර වසරවල දී මෙන්, රු. 500,000.00ක උපරිමයකට යටත්ව, නිශ්චිත අවසන් දිනයක් මගින්, පෙර සැකසූ අයදුම් පත්‍රයක් භාවිත කරමින් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම්පත් යොමු කිරීමට සියලුම අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ඇරයුම් කෙරිණි. පීඨ මණ්ඩලය විසින් නම් කරන ලද අභ්‍යන්තර සමාලෝචකයන් රු. 150,000ක් දක්වා ප්‍රදාන සඳහා අයදුම්පත්) හෝ බාහිර සමාලෝචකයන් විසින් මෙම අයදුම්පත් සමාලෝචනය කෙරිණි. වැරදි නිවැරදි කිරීම් පිළිබඳව අයදුම්කරුවන් සමඟ සමාලෝචන අදහස් බෙදා ගැනුණු අතර, විශ්වවිද්‍යාල පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුවේ නිර්දේශය සඳහා සහ සෙනට් සභාව සහ සභාවේ අනුමැතිය සඳහා අයදුම්පත් යොමු කෙරිණි. ප්‍රදානලාභීන් විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතු වේ. මෙහි ප්‍රගතිය සය මාසික ප්‍රගති වාර්තා සහ අවසන් වාර්තා ඔස්සේ පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබයි.

ඒ අනුව, රුපියල් 9,438,850.00 ක් අගයක් සහිත විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන සඳහා පරිගණක සහ තාක්ෂණ, වෛද්‍ය, විද්‍යාව සහ සමාජ විද්‍යා යන පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 28 දෙනෙකුගෙන් ලැබුණු අයදුම්පත් 2022 වසරේ දී සකස් කරන ලදී. එම විස්තර 23 වන වගුවෙන් සපයා ඇත.

වගුව 23 : අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන්හි විස්තර

| පීඨය | පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම් කළ සංඛ්‍යාව | ඉල්ලුම් කළ අරමුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| පරිගණක සහ තාක්ෂණ පීඨය | 5 | 2,000,000.00 |
| වෛද්‍ය පීඨය | 9 | 3,250,000.00 |
| විද්‍යා පීඨය | 13 | 3,888,850.00 |
| සමාජ විද්‍යා පීඨය | 1 | 300,000.00 |
| **මුළු එකතුව** | **28** | **9,438,850.00** |

# පේටන්ට් බලපත්‍ර 2022

වගුව 24 : 2022 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය වෙත ලද පේටන්ට් බලපත්‍ර

| පේටන්ට් බලපත්‍රයෙහි නම | පේටන්ට් හිමිකරු/හිමිකරුවන්ගේ නම/නම් | පේටන්ට් බලපත්‍ර ලැබුණු දිනය |
|---|---|---|
| පොල් කපා සාදනු ලබන අවශේෂ සාරය (CPRE) භාවිතයෙන් ආහාර නිෂ්පාදනවල රාක්ක ආයු කාලය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදයක්. | මහාචාර්ය කපිල සෙනෙවිරත්න,නිමන්ති ජයතිලක මෙය | 2022.09.01 |
| ගුවන්විදුලි සංඛ්‍යාත සන්නිවේදනය භාවිත කරමින් පිවිසිය හැකි දත්ත සන්නිවේදනය සඳහා පද්ධතියක් සහ ක්‍රමයක් | ටී.එන්. ගුරුසිංහ මහතා, එල්.ඩී.පී.එස්. ජයසේකර මහතා, එච්.ටී. විජේසූරිය මෙය, ආර්.එම්.අයි.යූ. රාජපක්ෂ මහතා, පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, ආචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මහතා, ආචාර්ය ජේ සෙනෙවිරත්න මහතා, මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා | 2022.09.15 |
| කුරුඳු මත පදනම් වූ ආහාර අතිරේක සහ ඒවා සකස් කිරීමේ ක්‍රියාවලිය | මහාචාර්ය බිමාලි ජයවර්ධන මෙය, එච්.පී.එන්. දේවංගනී මෙය, ඩබ්ලිව්.ඒ.එන්.එම්. වාරියප්පෙරුම මෙය | 2022.04.21 |
| සුපිරි ධාරිත්‍රක-බැටරි දෙමුහුන් ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති සඳහා ගතික බල කළමනාකරණ තාක්ෂණික ශිල්පක්‍රමයක් | පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා, මහාචාර්ය ඒ.ඩී.වී. නිහාල් කළුරත්න මහතා | 2022.04.27 |
| ආහාරයට ගතහැකි තෙල්, මස්, බිත්තර ආශ්‍රිත ආහාර, එළවළුවල රාක්ක ආයු කාලය සහ ඔක්සිකාරක ස්ථායීතාවය වැඩි දියුණු කිරීම සහ පොල් කපා සාදනු ලබන අවශේෂ සාරය (CPRE) භාවිතයෙන් පළතුරු හෝ එළවළු යුෂවල වර්ණය ආරක්ෂා කර ගැනීමේ ක්‍රමයක්. | මහාචාර්ය කපිල සෙනෙවිරත්න,නිමන්ති ජයතිලක මෙය | 2022.05.17 |
| සහල් (Oryza sativa) නිවුඩ්ඩෙන් නිස්සාරණය කරන ලද තාප ස්ථායී ෆීනෝලික් ප්‍රතිඔක්සිකාරක යෙදීම මගින් අසංතෘප්ත තෙල්, බිත්තර පදනම් වූ ආහාර සහ බේක් කරන ලද කේක්වල ඔක්සිකාරක සහ ක්ෂුද්‍රජීවී රාක්ක ආයු කාලය දීර්ඝ කර ගැනීමේ ක්‍රමයකි. | මහාචාර්ය කපිල සෙනෙවිරත්න,නිමන්ති ජයතිලක මෙය | 2022.11.02 |
| අන්තර්ජාල සම්බන්ධතාවයක් සහිතව හෝ රහිතව (RF) රැහැන් රහිත සන්නිවේදනය මත පදනම්ව පිවිසිය හැකි දත්ත සන්නිවේදනය, සැකසීම, පාලනය සහ දෘශ්‍යකරණය සඳහා වන පද්ධතියක් සහ ක්‍රමයක්. | ටී.එන්. ගුරුසිංහ මහතා, එල්.ඩී.පී.එස්. ජයසේකර මහතා, එච්.ටී. විජේසූරිය මෙය, ආර්.එම්.අයි.යූ. රාජපක්ෂ මහතා, පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, ආචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මහතා, ආචාර්ය ජේ සෙනෙවිරත්න මහතා, මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා | 2022.07.05 |
| නව චාප නිවා දැමීමේ ක්‍රමය සමඟ සරල ධාරා ස්විචය | වයි.එස්.එස්. ආරියරත්න මහතා, එන්.ඩබ්ලිව්.කේ. ජයතිස්ස මහතා, මහාචාර්ය එස්. ද සිල්වා මහතා | 2022.07.25 |
| ගෘහස්ථ භාවිතය සඳහා හදිසි වසා දැමෙන ද්‍රව පෙට්‍රෝලියම් වායු නියාමකය<br>(කාර්මික නිර්මාණය) | | |

වගුව 25 : 2022 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර

| පේටන්ට් බලපත්‍රයෙහි නම | පේටන්ට් හිමිකරු/හිමිකරුවන්ගේ නම/නම් | පේටන්ට් බලපත්‍ර ලැබුණු දිනය |
|---|---|---|
| ප්‍රොටෝකෝල පාලක ප්‍රදේශ ජාලය (CAN) මත පදනම්ව කර්මාන්ත ස්වයංක්‍රියකරණය සහ කාර්මික අන්තර්ජාලයෙන් සමන්විත සුහුරු උපාංග සඳහා පිවිසිය හැකි දත්ත සන්නිවේදන පද්ධතිය (IIoT) | ටී.එන්. ගුරුසිංහ මහතා, එල්.ඩී.පී.එස්. ජයසේකර මහතා, එච්. ටී. විජේසූරිය මෙය, ආර්.එම්.අයි.යූ. රාජපක්ෂ මහතා, එම්.පී.ඒ.වී. ගුණවර්ධන මහතා, ආචාර්ය පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, ආචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මහතා, ආචාර්ය ජේ සෙනෙවිරත්න මහතා, මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා | 2022.10.10 |
| උදාසීන සම්බන්ධතා රහිත ද්‍රව-පෙට්‍රෝලියම්-ගෑස්/ප්‍රොපේන් සංවේදී ආරක්ෂිත විදුලි ස්විචය | ආර්.එම්.අයි.යූ. රාජපක්ෂ මහතා, ටී.එන්. ගුරුසිංහ මහතා, එල්.ඩී.පී.එස්. ජයසේකර මහතා, එච්.ටී. විජේසූරිය මෙය, එම්.පී.ඒ.වී. ගුණවර්ධන මහතා, ආචාර්ය පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, ආචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මහතා, ආචාර්ය ජේ සෙනෙවිරත්න මහතා, මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මහතා | 2022.11.02 |
| කෘතිම බුද්ධිය පදනම් වූ සුහුරු ද්‍රව පෙට්‍රෝලියම් වායු මට්ටම් දර්ශකය.<br>(කාර්මික නිර්මාණය) | ආර්.එම්.අයි.යූ. රාජපක්ෂ මහතා, ටී.එන්. ගුරුසිංහ මහතා, එල්.ඩී.පී.එස්. ජයසේකර මහතා, එච්.ටී. විජේසූරිය මෙය, පී.එල්.ඒ.කේ. පියුමාල් මහතා, ආචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර මහතා, ආචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මහතා, ආචාර්ය ජේ සෙනෙවිරත්න මහතා, මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මහතා, මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි | 12.01.2022 |










# විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමවුම - 2022

වගුව 26 : විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමවුම - 2022

| විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමවුමේ නම | තත්ත්වය |
|---|---|
| **නව නිෂ්පාදන/ ක්‍රියාවලි සංවර්ධනය** | |
| ආමන්ත්‍රණය කළ හැකි දත්ත සන්නිවේදන පද්ධතිය | සංවර්ධිත |
| පැස වූ මුරුංගා කොළ, ලුණු මිශ්‍ර ජලයෙහි දැමූ මුරුංගා කොළ | |
| "කාතේසියානු රොබෝ දේහ මෝස්තරය සහ කාර්මික පරිමාණය සඳහා වර්ණය පදනම් කරගත් නිෂ්පාදන තේරීමේ යන්ත්‍රයට පිරිසැකැස්ම" | සංවර්ධිත |
| කාර්මික පරිමාණය සඳහා ගෘහස්ථ පරිමාණ ද්විත්ව බැරල් කාබන්කරණ ඒකකය | සංවර්ධිත |
| ස්වයංක්‍රීය දියර පොහොර නිෂ්පාදන උපකරණය | සංවර්ධිත |
| කාබනික පොහොර කැටිති ආකාරයෙන් සකස් කිරීම සඳහා උපකරණ | සංවර්ධිත |
| **සංවර්ධනය කරන ලද සැලසුම් මූලාකෘති** | |
| සුහුරු කෘෂිකාර්මික නිරීක්ෂණ පද්ධතිය | සංවර්ධිත |
| කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් පරිමාණය සඳහා (LPG) සිලින්ඩර | සංවර්ධිත |
| සිලින්ඩර සඳහා ආරක්ෂක රෙගියුලේටරය | සංවර්ධිත |
| ආරක්ෂක විද්‍යුත් ස්විචය | සංවර්ධිත |
| ඩිජිටල් වාරිමාර්ග පාලන පද්ධතිය | සංවර්ධිත |





# 07.
# ශිෂ්‍ය සුබසාධන පහසුකම්

කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන්ට පන්තිකාමර පදනම් කරගත් අධ්‍යයන කටයුතුවලට අමතරව විවිධ පහසුකම් රැසක් සඳහා ප්‍රවේශය හිමි වේ. පුස්තකාලය වෙත ප්‍රවේශය, ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල නේවාසිකාගාර, ආපනශාලා, වෛද්‍ය මධ්‍යස්ථානය, ක්‍රීඩා පහසුකම්, රසායනාගාර පහසුකම් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් සහ තවත් බොහෝ දෑ මෙයට ඇතුළත් වේ.

උපාධි අපේක්ෂකයින් 5,434 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව හිමි වූ අතර, 2022 වසරේ තවත් සිසුන් 3,329 දෙනෙකුට ශිෂ්‍යාධාර ලැබුණි. මහපොළ ශිෂ්‍යත්වයක් සඳහා සුදුසුකම් ලබන ඕනෑම සිසුවෙකුට වාරිකයකට රුපියල් 5,000.00ක් බැගින් ද ශිෂ්‍යාධාර ලබන්නන්ට වසරකට වාරිකයකට රුපියල් 4000 බැගින් ද වාරික 10ක් සඳහා මෙය හිමි වේ. මීට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, විද්‍යා පීඨයේ ආදි සිසුන් සහ විශේෂිත අධ්‍යයන අංශ මගින් පිරිනමන තවත් ශිෂ්‍යත්ව කිහිපයක් ද උපාධි අපේක්ෂකයින් සඳහා ලබා ගත හැකිය.

# ශිෂ්‍යත්ව

වගුව 27 : මහපොළ සහ ශිෂ්‍යාධාර ලාභීන් සංඛ්‍යාව

| පීඨය | බඳවා ගත් වර්ෂය | අධ්‍යයන වර්ෂය | ශිෂ්‍යත්ව ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | මහපොළ | ශිෂ්‍යාධාර |
| FCMS | 2020/2021 | 1 | - | 546 |
| | 2019/2020 | 2 | 462 | 192 |
| | 2018/2019 | 3 | 511 | 57 |
| | 2017/2018 | 4 | 497 | 48 |
| | | මුළු | ***1470*** | ***843*** |
| FCT | 2020/2021 | 1 | - | 109 |
| | 2019/2020 | 2 | 170 | 18 |
| | 2018/2019 | 3 | 135 | 8 |
| | 2017/2018 | 4 | 120 | 16 |
| | | මුළු | ***425*** | ***151*** |
| FHU & FSS | 2020/2021 | 1 | - | 828 |
| | 2019/2020 | 2 | 701 | 460 |
| | 2018/2019 | 3 | 998 | 97 |
| | 2017/2018 | 4 | 901 | 107 |
| | | මුළු | ***2600*** | ***1492*** |
| FMED | 2020/2021 | 1 | - | 113 |
| | 2019/2020 | 2 | 98 | 26 |
| | 2018/2019 | 3 | 91 | 12 |
| | 2017/2018 | 4 | 83 | 11 |
| | 2016/2017 | 5 | 51 | 21 |
| | 2015/2016 | 5 | 52 | 22 |
| | | මුළු | ***375*** | ***205*** |
| FSC | 2020/2021 | 1 | - | 323 |
| | 2019/2020 | 2 | 258 | 116 |
| | 2018/2019 | 3 | 218 | 158 |
| | 2017/2018 | 4 | 88 | 41 |
| | | මුළු | ***564*** | ***638*** |
| | | සමස්ත සංඛ්‍යාව | ***5434*** | ***3329*** |

කැලණිය විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලබා දීමට අමතරව, සිසුන් හට තම අධ්‍යයන වැඩසටහන් සඳහා රුකුලක් සැපයීමට ශිෂ්‍යත්ව සහ තිළිණ පිරිනමනු ලබයි.

මෙම ශිෂ්‍යත්ව සහ තිළිණ සිසුන්ගේ අධ්‍යාපනය සඳහා අවංකව ම ආයෝජනය කිරීමට ඇල්මක් දක්වන දානපතියන්ගේ ආධාර මත පදනම් වන අතර, එය දෙයාකාරයකින් සමන්විත ය. දරිද්‍රතාවෙන් පෙළෙන සිසුන් වෙත පිරිනැමෙන ශිෂ්‍යත්ව දිගු කාලයක් පුරා සපයනු ලබන මූල්‍යමය සහායක් වන අතර, අයදුම්පත් කැඳවීමෙන් සිසුන් තෝරා ගනු ලැබේ. කැපීපෙනෙන දස්කම් දක්වන සිසුන් සඳහා පිරිනමනු ලබන ත්‍යාග එක් වරක් පමණක් පිරිනමන සම්මාන වන අතර, ප්‍රථම වසරේ දී හෝ අවසන් විභාග පරීක්ෂණයේ දී ඔවුන් දක්වන දක්ෂතාව මත මුදල් ත්‍යාග හෝ පදක්කම් ලෙස ඒවා සිසුන් වෙත පිරිනමනු ලැබේ. ආසන්න වශයෙන් වර්තමානයේ දී ශිෂ්‍යත්ව සහ තිළිණ 35ක් ක්‍රියාත්මක වේ. සිසුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට සහ පවතින අරමුදල් ප්‍රමාණයන්ට අනුව, දානපතියන් විසින් යෝජනා කරනු ලැබ ඇති පරිදි හෝ අදාළ අධ්‍යයන අංශය මගින් සීමා කර ඇති පරිදි, මෙම සියලු ශිෂ්‍යත්ව සහ තිළිණවලට ඒවාට නිශ්චිත නිර්ණායක ඇත.

අදාළ පීඨ මණ්ඩලයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා තෝරා ගත් සිසුන්ට පසුකාලීන අනුමැතිය හිමි වීමෙන් පසු, මෙම ශිෂ්‍යත්ව සහ තිළිණ ප්‍රදානය ක්‍රියාත්මක කෙරේ. අදාල ගිණුම්වල සැලකිය යුතු ප්‍රමාණයක පොලිය ඵලප්‍රයෝජනයකට නොගෙන ඉතිරිව තිබීම කෙරෙහි මෑතක දී අවධානය යොමු විණි. ඒ අනුව, උපකුලපතිතුමිය විසින් මඟපෙන්වන ලද පරිදි, වත්මන් අවශ්‍යතා සපුරාලීමට මෙන්ම, සලකා බැලෙන සිසුන්ගේ ප්‍රතිලාභය ඉහළ නැංවීම සඳහා ද මෙම නිර්ණායක සංශෝධනය කිරීමට පියවර ගනිමින් සිටී. මෙම සංශෝධන මාලාව මගින් සිසුන්ගේ අවශ්‍යතා සපුරාලන අතරතුර, පොලී ශේෂය ප්‍රශස්ත ධාරිතාවකින් භාවිත කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## නේවාසිකාගාර පහසුකම්

නිවාස සම්බන්ධයෙන් ගත් කල, නේවාසිකාගාර ඉල්ලා සිටින බොහෝ සිසුන්ට කැලණිය විශ්වවිද්‍යාලය නවාතැන් සපයයි. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක හා තාක්ෂණ, මානවශාස්ත්‍ර, විද්‍යා සහ සමාජ විද්‍යා යන පීඨවල උපාධි අපේක්ෂකයින් 4,940කට දළුගම විශ්වවිද්‍යාල පරිශ්‍රය සහ ඒ අවට නේවාසිකාගාර පහසුකම් ලබා දුන් අතර, රාගම වෛද්‍ය පීඨය නේවාසිකාගාර පහසුකම් අයදුම් කළ සියලු දෙනාටම එම පහසුකම් සලසා දුණි.



වගුව 28 : 2022 වසරේ දී නේවාසිකාගාරලාභීන්

| පීඨය | අධ්‍යයන වර්ෂය | බඳවා ගත් වර්ෂය | නේවාසිකාගාර පහසුකම් ලද සිසුන් ගණන | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | මුළු |
| FCMS | 1 | 2020/2021 | 87 | 226 | 313 |
| | 2 | 2019/2020 | 66 | 148 | 214 |
| | 3 | 2018/2019 | 51 | 184 | 235 |
| | 4 | 2017/2018 | 42 | 175 | 217 |
| FCT | 1 | 2020/2021 | 35 | 18 | 53 |
| | 2 | 2019/2020 | 32 | 21 | 53 |
| | 3 | 2018/2019 | 22 | 14 | 36 |
| | 4 | 2017/2018 | 22 | 10 | 32 |
| FHU & FSS | 1 | 2020/2021 | 139 | 651 | 790 |
| | 2 | 2019/2020 | 137 | 639 | 776 |
| | 3 | 2018/2019 | 93 | 617 | 710 |
| | 4 | 2017/2018 | 63 | 766 | 829 |
| FMED | 1 | 2020/2021 | 60 | 92 | 152 |
| | 2 | 2019/2020 | 64 | 174 | 238 |
| | 3 | 2018/2019 | 50 | 137 | 187 |
| | 4 | 2017/2018 | 50 | 119 | 169 |
| | 5 | 2016/2017 | 58 | 93 | 151 |
| | 5 | 2015/2016 | 75 | 86 | 161 |
| FSC | 1 | 2020/2021 | 93 | 90 | 183 |
| | 2 | 2019/2020 | 76 | 60 | 136 |
| | 3 | 2018/2019 | 67 | 91 | 158 |
| | 4 | 2017/2018 | 93 | 112 | 205 |
| | | මුළු | *1475* | *4523* | *5998* |



# 08.
# ක්‍රීඩා කටයුතු

ක්‍රීඩාවන් පරාසයකට සහාය ලබා දීමට හැකි අනර්ඝ පහසුකම් කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ. පහත වගුවේ දක්වා ඇති පහසුකම් සහ ඊළඟ වගුවේ ලැයිස්තුගත කළ කණ්ඩායම් සඳහා සහාය මීට ඇතුළත් වේ.

වගුව 29 : ක්‍රීඩා පහසුකම්

| | |
|---|---|
| ගෘහස්ත ක්‍රීඩාගාර | නව ගෘහස්ත ව්‍යායාම් ශාලාව |
| | ශිෂ්‍ය මධ්‍යස්ථාන ව්‍යායාම් ශාලාව |
| | ව්‍යායාම් ශාලාව, වෛද්‍ය පීඨය, රාගම |
| | සුවතා පුහුණු මධ්‍යස්ථානය, කැලණිය |
| | සුවතා පුහුණු මධ්‍යස්ථානය, කන්නංගර නේවාසිකාගාර පරිශ්‍රය |
| | ශාරීරික සුවතා මධ්‍යස්ථානය, කාන්තා නේවාසිකාගාර දාමය |
| | කැරම් පරිශ්‍රය |
| එළිමහන් ක්‍රීඩාගාර | ප්‍රධාන ක්‍රීඩා පිටිය, කැලණිය |
| | අංක 2 ක්‍රීඩා පිටිය, කැලණිය |
| | එළිමහන් පැසිපන්දු ක්‍රීඩාංගණය |
| | ටෙනිස් ක්‍රීඩාංගණය |
| | එළිමහන් අත්පන්දු ක්‍රීඩාංගණය 1 |
| | එළිහන් දැල්පන්දු ක්‍රීඩාංගණය |
| | එළිමහන් පැසිපන්දු ක්‍රීඩාංගණය, වෛද්‍ය පීඨය |
| | එළිමහන් දැල්පන්දු සහ පැසිපන්දු ක්‍රීඩාංගණය, වෛද්‍ය පීඨය |

වගුව 30 : ක්‍රීඩා අවස්ථා

| | | | |
|---|---|---|---|
| ස්වායු ව්‍යායාම ජිම්නාස්ටික් | (පිරිමි සහ කාන්තා) | **Netball** | (Women) |
| බැඩ්මින්ටන් | (පිරිමි සහ කාන්තා) | රග්බි | (පිරිමි) |
| බේස්බෝල් | (පිරිමි) | ස්ක්‍රැබල් (වචන තැනීමේ ක්‍රීඩාව) | (පිරිමි සහ කාන්තා) |
| පැසිපන්දු | (පිරිමි සහ කාන්තා) | පිහිනීම | (පිරිමි සහ කාන්තා) |
| බොක්සිං | (පිරිමි) | මේස පන්දු | (පිරිමි සහ කාන්තා) |
| කැරම් | (පිරිමි සහ කාන්තා) | ටයිකොන්ඩෝ | (පිරිමි සහ කාන්තා) |
| චෙස් | (පිරිමි සහ කාන්තා) | ටෙනිස් | (පිරිමි සහ කාන්තා) |
| ක්‍රිකට් | (පිරිමි) | ධාවන පථය සහ ක්ෂේත්‍රය | (පිරිමි සහ කාන්තා) |
| එල්ලේ | (පිරිමි සහ කාන්තා) | අත්පන්දු | (පිරිමි සහ කාන්තා) |
| පාපන්දු | (පිරිමි සහ කාන්තා) | බර ඉසිලීම | (පිරිමි සහ කාන්තා) |
| හොකී | (පිරිමි සහ කාන්තා) | මල්ලවපොර | (පිරිමි සහ කාන්තා) |
| ජුඩෝ | (පිරිමි සහ කාන්තා) | වුෂු | (පිරිමි සහ කාන්තා) |
| කබඩි | (පිරිමි සහ කාන්තා) | යෝග | (පිරිමි සහ කාන්තා) |
| කරාටේ | (පිරිමි සහ කාන්තා) | | |

| | | |
|---|---|---|
| මුළු කණ්ඩායම් සංඛ්‍යාව (කාන්තා සහ පිරිමි) | - | 48 |
| මුළු සමූහ සාමාජික සංඛ්‍යාව | - | 870 |
| තරඟකාරී ක්‍රීඩාවල නිරත වී සිටින සිසුන් සංඛ්‍යාව | - | 1,692 |
| විනෝදාත්මක මට්ටමින් ක්‍රීඩාවට සම්බන්ධ වී සිටින සිසුන් සංඛ්‍යාව | - | 1,890 |

# ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ සිදුවීම්

2022 සැප්තැම්බර් 5 සිට 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී සැසි 468)ක් පැවැත්විණි. බොක්සිං, ස්වායු ව්‍යායාම ජිම්නාස්ටික් සහ යෝග හැර ක්‍රීඩා විෂයයන් 24ක් සඳහා ශිෂ්‍යයන් 84 දෙනෙකු කපිතාන් සහ උප කපිතාන් (පිරිමි සහ කාන්තා) ලෙස පත් කර ඇත.

වගුව 31 : 2022 දී පැවැත්වූ සිදුවීම් සහ සහභාගීත්වය

| සිදුවීම් | සහභාගීකරුවන් ගණන (සිසුන්) |
|---|---|
| පුහුණු කිරීමේ වැඩසටහන | 2142 |
| සියලු පීඨ සඳහා වන නවකයින්ගේ ක්‍රීඩා වැඩසටහන | 774 |
| අන්තර් පීඨ ශූරතා (ක්‍රීඩා විෂයයන් 24ක් සඳහා) | 1822 |
| ක්‍රීඩා අධ්‍යාපන බණ්ඩය | 262 |
| මිත්‍රත්ව සහ ද්විත්ත්ව තරග සංඛ්‍යාව | 116 (සිසුන් 1692) |
| සහභාගී වූ ජාත්‍යන්තර තරග සංඛ්‍යාව | 01 |
| ජාත්‍යන්තර තරගවලට සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | 02 |

# 2022 දී ජාතික සහ අන්තර් විශ්වවිද්‍යාලයීය මට්ටමේ තරඟවල දී දැක්වූ දස්කම්

2022 වසරේ පැවති තරඟවලින් කැලණිය විශ්ව විද්‍යාලය නියෝජනය කරමින් සිසුන් හතර දෙනෙක් පදක්කම් දිනා ගත්හ.

වගුව 32 : තරඟවල දී දැක්වූ දස්කම්

| තරඟය | දක්ෂතාව | සම්මානලාභීන් |
|---|---|---|
| දකුණු ආසියාතික කරාතේ ශූරතාවලිය | 45kg (කාන්තා),රිදී පදක්කම | ටී.එල්.එස්.ප්‍රභාෂිණී |
| ජාතික දිගු පාඨමාලා පිහිනුම් ශූරතාවලිය | 50m, සමනළ ආර ප්‍රථම ස්ථානය | එස්.එම්.එස්.එස්. සේනාරත්න |
| | 100m, සමනළ ආර ප්‍රථම ස්ථානය | |
| | 200m, සමනළ ආර ප්‍රථම ස්ථානය | |
| | 50m, නිදහස් ආර දෙවන ස්ථානය | |
| | 100m, නිදහස් ආර ප්‍රථම ස්ථානය | |
| ජාතික කරාටේ ශූරතාවලිය | 45kg කුමිතේ (කාන්තා), රන් පදක්කම | ටී.එල්.එස්.ප්‍රභාෂිණී |
| | 50kg කුමිතේ(කාන්තා), ලෝකඩ පදක්කම | එච්.එල්.එම්.වී.අමුණුගම |
| | 61kg තනි පුද්ගල කටා (පිරිමි), රිදී පදක්කම | පී.ජී.ඩී.ආර්. පෙරේරා |
| | 61kg කුමිතේ (පිරිමි), ලෝකඩ පදක්කම | පී.ජී.ඩී.ආර්. පෙරේරා |

වගුව 33 : අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ කාර්ය සාධනය - 2022 (2022, දෙසැම්බර් 31 වන විට)

| ක්‍රීඩා අවස්ථාව | දක්ෂතාව |
|---|---|
| රග්බි (පිරිමි) | ශූරතාව |
| කරාටේ (පිරිමි) | ශූරතාව |
| අත්පන්දු (පිරිමි) | ශූරතාව |
| කැරම් (පිරිමි) | ශූරතාව |
| පැසිපන්දු (පිරිමි) | 1 වන අනුශූරතාව |
| අත්පන්දු (කාන්තා) | 1 වන අනුශූරතාව |
| බැඩ්මින්ටන් (පිරිමි) | 1 වන අනුශූරතාව |
| කරාටේ (කාන්තා) | 1 වන අනුශූරතාව |
| මල්ලවපොර (පිරිමි) | 2 වන අනුශූරතාව |
| පැසිපන්දු (කාන්තා) | 2 වන අනුශූරතාව |
| ධාවන පථය සහ ක්ෂේත්‍රය (කාන්තා) | 2 වන අනුශූරතාව |
| බැඩ්මින්ටන් (කාන්තා) | 3 වන අනුශූරතාව |
| ටෙනිස් (කාන්තා) | 3 වන අනුශූරතාව |
| දැල්පන්දු (කාන්තා) | 3 වන අනුශූරතාව |
| හොකී (කාන්තා) | 3 වන අනුශූරතාව |







"ශ්‍රී ලංකා මලල ක්‍රීඩාවෙන් වසර 100 ක්"

වැඩබලන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ ජී.ජී.යූ. සමන් කුමාර මහතා විසින් සංස්කරණය කරන ලද "ශ්‍රී ලංකා මලල ක්‍රීඩාවෙන් වසර 100ක්" නම් ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩාවේ ශත සංවත්සරය සැමරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකා මලල ක්‍රීඩා ආයතනයේ අනුග්‍රහය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මෙම ග්‍රන්ථය "සබුද්ධි" ක්‍රීඩා සම්මාන උළෙලේ දී 2022 වසරේ හොඳම ක්‍රීඩා පොතට හිමි සම්මානය දිනා ගත්තේය.

# ජාතික කණ්ඩායම්වල නියෝජනය

2022 වසරේ බේස්බෝල් සහ ජාතික ත්‍රෝබෝල් සභාපතිගේ ජාතික සංචිතයට කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනකු තේරී පත් විය.

වගුව 34 : ජාතික කණ්ඩායම් නියෝජනයන්

| ජාතික කණ්ඩායම | ශිෂ්‍යයාගේ නම |
|---|---|
| ජාතික බේස්බෝල් සංචිතය | ඩබ්ලිව්.පී.ජී.ඒ. වීරවර්ධන මහතා |
| ජාතික ත්‍රෝබෝල් සභාපතිගේ කණ්ඩායම | බී.එම්.එම්.ඩී.වී. බස්නායක මහතා |

# 2022 වසරේ දී අනුබද්ධිත ක්‍රීඩා පාලන ආයතන

කැලණිය විශ්වවිද්‍යාලය 2022 වසරේ දී පහත දැක්වෙන ශ්‍රී ලංකා ජාතික සහ පළාත් මට්ටමේ ක්‍රීඩා පාලන ආයතන සමඟ (විධායක ඡන්ද බලය සහිතව) අනුබද්ධ විය.

## ජාතික සංගම්වල නියෝජනය කිරීම්

1. ශ්‍රී ලංකා ක්‍රිකට්
2. ශ්‍රී ලංකා බර ඉසිලීමේ සම්මේලනය
3. ශ්‍රී ලංකා මේසපන්දු සංගමය
4. ශ්‍රී ලංකා චෙස් සම්මේලනය
5. ශ්‍රී ලංකා ජුඩෝ සම්මේලනය
6.
7. ශ්‍රී ලංකා ජාතික ජල ක්‍රීඩා සංගමය (NASU)

## පළාත් සහ දිස්ත්‍රික් සංගම්

1. බස්නාහිර පළාත් රග්බි පාපන්දු සංගමය
2. ගම්පහ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය
3. ගම්පහ දිස්ත්‍රික් නෙට්බෝල් සංගමය
4. බස්නාහිර පළාත් බැඩ්මින්ටන් සංගමය
5. ගම්පහ දිස්ත්‍රික් පැසිපන්දු සංගමය

## වෙනත් සංගම්

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය

# 2022 වසරේ දී කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් දරන ලද වෙනත් තනතුරු

වගුව 35 : 2022 දී කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් දරන ලද වෙනත් තනතුරු

| කාර්යමණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|
| ජී.ජී.යු සමන් කුමාර මහතා | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ විධායක කමිටු සාමාජික |
| | ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩා සංගමයේ ගරු වාර්තාකරු |
| | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ වාර්තාකරු |
| | ජනාධිපති ක්‍රීඩා සම්මාන සඳහා විනිශ්චය මණ්ඩලයේ සාමාජික |
| | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා තේරීම්, සංඛ්‍යාලේඛන සහ ප්‍රමිති අනු කමිටුවේ සභාපති |
| එච්.ඩී.එස්.පී විජේගුණරත්න මහතා | සභාපති, (SLUSA) හි මේස පන්දු අනු කමිටුව |
| | SLUSA හි බැඩ්මින්ටන්, රගර්, අනුකමිටු සාමාජික |
| ජී.ඒ.එස්.ජී. ගොඩමුනේ මහත්මිය | SLUSA හි කරාටේ, නෙට්බෝල්, පැසිපන්දු සහ හොකී අනු කමිටු සාමාජික |
| එච්.එම්.කේ.ටී කරුණාරත්න | SLUSA හි චෙස් සහ එල්ලේ අනු කමිටු සාමාජික |
| අයි.ජී.කේ. මහදුල මහත්මිය | SLUSA හි ටෙනිස් සහ පිහිනුම් අනු කමිටු සාමාජික |
| ඒ.එම්.ඒ. අතුකෝරල | SLUSA හි වොලිබෝල්, රග්බි සහ බේස්බෝල්, එල්ලේ අනු කමිටු සාමාජික |
| ජී.ආර්.සී කුලරත්න මහතා | SLUSA මල්ලවපොර අනු කමිටුවේ සභාපති |

# 09.
# පීඨ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සහ පුස්තකාලය

UNIVERSITY OF KELANIYA

# වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

## මෙහෙවර

“වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය අපි ලෝකය වඩා හොඳ තැනක් බවට පත් කිරීමට ක්‍රියාකාරීව දායක වන පරිපූර්ණ නායකයින් පෝෂණය කිරීමට සහ ප්‍රබෝධමත් කිරීම උදෙසා අනාගතවාදී, ව්‍යවහාරික සහ සහයෝගාත්මක ඉගෙනුම් සහ පර්යේෂණ අත්දැකීම් එක්ව ගෙන එන්නෙමු.”

## පීඨයේ හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ආරම්භ වන්නේ 1976 වසරේ සමාජ විද්‍යා පීඨයේ ස්ථාපිත වාණිජ අංශයෙනි. අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ අනෙකුත් ආයතන වෙහෙස මහන්සි වී ක්‍රියා කිරීම, නොපසුබට උත්සාහය, අඛණ්ඩ ප්‍රයත්නය සහ කැපවීම මත 1995 දී පීඨ තත්ත්වය ලබා ගැනීමට එය සමත් වූ අතර, අද වන විට එය මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේ වේගයෙන්ම වර්ධනය වන පීඨයකි. පීඨයේ අධ්‍යයන අංශ පහ විසින් වැඩසටහන් රාශියක් පිරිනමනු ලැබේ: වාණිජ හා මූල්‍ය කළමනාකරණය (DCFM), මානව සම්පත් කළමනාකරණය (HRM), ගණකාධිකරණය (DoA), අලෙවිකරණ කළමනාකරණය (DMM) සහ මූල්‍යය (DFin). ප්‍රථම උපාධි පාඨමාලා 14ක්, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධි (DBA) වැඩසටහනක්, ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් හතක්, ඩිප්ලෝමා වැඩසටහන් හයක් සහ උසස් ඩිප්ලෝමා වැඩසටහන් හයක් මීට ඇතුළත් වේ. පීඨයේ ශක්තියට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 144කු, එක් පරිපාලන නිලධාරියෙකු, අධ්‍යයන සහායක කාර්යමණ්ඩල සාමාජිකයින් 5 කු, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 31කු සහ උපාධි අපේක්ෂකයින් 3,438 ක් ඇතුළත් වේ. පීඨය අධ්‍යයන අංශ විසින් සංවිධානය කරන ලද විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම් හරහා එහි බහු සංස්කෘතික, බහු වාර්ගික සිසුන් අතර සමාජ සංහිඳියාව සහ සංස්කෘතික විවිධත්වය පෝෂණය කරයි.

Covid -19 වසංගතයෙහි අභියෝගවලට මුහුණ දෙමින්, 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ සියලුම අර්ධ වාර්ෂික අවසාන විභාග 2022 පෙබරවාරි වන විට භෞතිකව ද, 2020/2021 අධ්‍යයන වර්ෂයේ I අධ්‍යයන වාරයේ විභාග 2022 අගෝස්තු මාසය වන විට ද, සහ 2022 දෙසැම්බර් වන විට 2020/2021 අධ්‍යයන වර්ෂයේ  සියලුම අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට පීඨය සමත් විය.

පීඨය සිය සියලුම අධ්‍යයන වැඩසටහන් සාර්ථක ලෙස උසස් තත්ත්වයෙන් පවත්වා ගෙන යෑමෙන් විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ එහි පාර්ශ්වකරුවන්ගේ ඇගයීමට පාත්‍ර වී ඇත. පීඨයේ උපාධිධාරී රැකියා නියුක්ති අනුපාතය වන 81%, උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය පෙන්නුම් කරනා රටේ කළමනාකරණ පීඨ අතර

ඉහළම අනුපාතවලින් එකකි. තවද, අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ මූල්‍යය දෙපාර්තමේන්තුව සඳහා (ISO) සහතිකය ලබා ගැනීම, ඇමරිකානු එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ (CFA) ආයතනය විසින් මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය සහ මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය සඳහා ලබා දෙන පිළිගැනීම පීඨය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය පිළිබඳ වැඩිදුරටත් සාක්ෂි දරයි.

2022 වර්ෂය සඳහා වූ ප්‍රධාන සන්ධිස්ථාන අතරට AACSB (Association to Advance Collegiate Schools of Business) හි සාමාජිකත්වය අලුත් කිරීම සහ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය සඳහා නව වැඩසටහනක් හඳුන්වාදීම ඇතුළත් වේ. මේ වන විට පීඨය විසින් සියලුම විශේෂ උපාධි පාඨමාලා ගෞරව උපාධි පාඨමාලා බවට පරිවර්තනය කර ඇත.

# අධ්‍යයන කාර්ය මණ්ඩල පැතිකඩ

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ඔවුන්ගේ පර්යේෂණ අවශ්‍යතා ශක්තිමත් කිරීමට ස්වයං අභිප්‍රේරණය වන අතර, එමඟින් එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අධ්‍යයන වැඩසටහන් සංවර්ධනයට දායක වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 53 දෙනෙකු ආචාර්ය උපාධි (PhD) දරන අතර සාමාජිකයින් 109 දෙනෙකුට ශාස්ත්‍රපති උපාධි ඇත. තවත් සාමාජිකයින් 18 දෙනෙකු මේ වන විට ආචාර්ය උපාධි සඳහා සුදානම් වෙමින් සිටිති. 2022 දී, පීඨ සාමාජිකයින් උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රකාශන සඳහා උපකුලපති සම්මානයක් සහ සෙනෙට් සම්මාන 3ක් ලබා ඇත. මීට අමතරව, මහාචාර්ය ඩී.එම්.ආර්.දිසානායකගේ අධීක්ෂණය යටතේ කොවිඩ්-19 සහ ආපදා තත්ත්වය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් එක්සත් රාජධානියේ මධ්‍යම ලන්කාශයර් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් අලෙවි කළමනාකරණ අංශයේ උසස් අලෙවිකරණ මධ්‍යස්ථානය විසින් නිම කරන ලදී.

# නවෝත්පාදන

අධ්‍යාපනික පරිසරය සුපෝෂණය කිරීමටත් උපාධි අපේක්ෂකයින්ට සාර්ථක නිමවුමක් ලබාදීමට අවස්ථාව සැලසීමටත් පීඨය පියවර ගෙන ඇත. කථිකාචාර්යවරුන් සහ සිසුන් අතර මිශ්‍ර ඉගෙනුම් පද්ධතිය ප්‍රවර්ධනය කිරීම සඳහා සුහුරු පන්තිකාමර ඉදිකිරීම, නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා නවෝත්පාදන විද්‍යාගාරයක් ඉදිකිරීම සහ උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා නව නිෂ්පාදන සංවර්ධනය සහ ඩිජිටල් අන්තර්ගත සංවර්ධනය සඳහා සිසුන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට උපකාර කිරීමට (A1) මැදිරිය වැනි විවිධ යටිතල පහසුකම් සංවර්ධනය හරහා මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනීම වැඩි දියුණු කෙරෙමින් පවතී.

ආනන්ද පටබැඳිගේ ගොඩනැගිල්ලේ දේශන ශාලා ප්‍රතිසංස්කරණය කිරීම සහ පොදු පහසුකම් කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීම සාර්ථකව නිම කරන ලදී.

තවද, පීඨයේ මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ඩිජිටල් සුහුරු අන්තර් ක්‍රියාකාරී පුවරු, ග්‍රැෆික් ඇඳීමේ ටැබ්ලට් මිලදී ගන්නා ලදී.

# 2022 වසරේ සුවිශේෂී අවස්ථා

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ප්‍රමුඛතම සම්මන්ත්‍රණයක් වන ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICBI) බංග්ලාදේශයේ ඩකා විශ්වවිද්‍යාලය සමඟ එක්ව 13 වැනි වරටත් නොවැම්බර් 17 සහ 18 යන දිනවල පීඨ පරිශ්‍රයේදී පැවැත්විණි. ICBI හි 13 වන සංස්කරණයේ තේමාව වූයේ 'මායිම් වෙළෙඳපොළවල දේශගුණික විපර්යාස සඳහා ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම' යන්නයි.

එමෙන්ම, ගණකාධිකාරී දෙපාර්තමේන්තුවේ ගිණුම්කරණ පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයින් සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICARE 2022) සහ අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අලෙවිකරණ පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICAM 2022) 2022 දෙසැම්බර් 15 සහ 2022 දෙසැම්බර් 20 යන දිනවල පැවැත්විණි.

"පීඨාධිපති ලැයිස්තුව" සහ "පීඨ සම්මාන" යන ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ පීඨයේ හොඳම දක්ෂතා දක්වන සිසුන් වෙත ප්‍රදානය කිරීමට සහ ඔවුන් ඇගයීම සඳහා පීඨයේ තත්ත්ව සහතිකකරණ අංශය (FQAC) විසින් සංවිධානය කරන ලද පීඨ විශිෂ්ටතා සම්මාන උළෙල 2022 දෙසැම්බර් 19 වැනි දින සාර්ථකව පවත්වන ලදී.

එපමණක් නොව, අතථ්‍ය ක්ෂේත්‍ර චාරිකා, කර්මාන්ත සම්බන්ධිත උපාධි සහතිකකරණය; "සහතික කළ වෘත්තීය අලෙවිකරණ උපාධිධාරී (CPMG), කර්මාන්ත සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ අවබෝධතා ගිවිසුම් හා හවුල්කාරිත්වයන් අත්සන් කිරීම මගින් ඉගැන්වීමෙහි ගුණාත්මකභාවය විදහා දැක්වීම 2022 සඳහා වූ සුවිශේෂී ක්‍රියාකාරකම් අතරින් කිහිපයකි.

පීඨයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ දී, සමාජයේ අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය තීරණ ගැනීමට අවශ්‍ය හැකියාව, කුසලතා සහ ආකල්ප සහිත ව්‍යාපාරික ලෝකය සඳහා බැබළෙන නායකයින් ඔප මට්ටම් කිරීම සඳහා වඩා හොඳ සේවාවක් පීඨය මගින් සහතික කෙරේ. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් මේ වන විට උපාධිධාරීන් 10,000කට අධික පිරිසක් බිහි කර ඇති අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල කළමනාකාර නිලයන්හි ඉදිරියෙන්ම සිටින අතර, අපගේ ඇතැම් උපාධිධාරීහු මෙරට ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින් වෙති.

**ආචාර්ය පී.එන්.ඩී. ප්‍රනාන්දු**
**පීඨාධිපති/ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**



# පරිගණක සහ තාක්ෂණ
## පීඨය

## දැක්ම

"

තිරසාර සංවර්ධනය සඳහා පරිගණක හා තාක්ෂණය පිළිබඳ දැනුම නිර්මාණය කිරීමේ සහ බෙදා හැරීමේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

"

## මෙහෙවර

"

පරිගණක හා තාක්ෂණ පීඨය ජාතියේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා දැනුම සහ ධාරිතා ගොඩනැගීමේ නව්‍යකරණයන් සහ බෙදා හැරීම තුළින් පරිගණක හා තාකෂණයේ විශිෂ්ටත්වය සඳහා ප්‍රයත්න දැරීම.

"

# පීඨය පිලිබඳ හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයේ හත්වන පීඨය ලෙස පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) 2016 වසරේ පිහිටු වන ලදී. පරිගණක හා තාක්ෂණ පීඨය විසින් වර්තමානයේ දී උපාධි පාඨමාලා තුනක් පිරිනමයි: පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව, ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය (BET) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ ගෞරව උපාධිය (BICT). මීට අමතරව, එක් පශ්චාත් උපාධි වැඩසටහනක්, එනම්, තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපන විද්‍යාපති උපාධිය 2022 දී පිරිනමන ලදී. ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය (BBST) සඳහා මඟපාදමින් 4 වන අධ්‍යයන වැඩසටහනක් හඳුන්වා දීමට වර්තමානයේ දී කටයුතු කරමින් පවතී.

රටේ පවතින ආර්ථික අර්බුදය සහ පවතින වාතාවරණය හේතුවෙන් පීඨයේ මානව සම්පත් ප්‍රසාරණය වීමක් අපේක්ෂා කළ නොහැකි විය. එබැවින්, 2022 වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට මානව ප්‍රාග්ධනය එක් කිරීම සාමාජිකයින් හය දෙනෙකුට සහ පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 අයෙකුට සීමා විය.

# සංවිධානාත්මක ව්‍යුහයේ සමස්ත විග්‍රහය

වර්තමානයේ දී අධ්‍යයන අංශ තුනක් පරිගණක හා තාක්ෂණ පීඨය සතු වේ:

- **ව්‍යවහාරික පරිගණන අංශය**
- **පරිගණක පද්ධති ඉංජිනේරු අංශය**
- **මෘදුකාංග ඉංජිනේරු අංශය**
- ඊට අමතරව, ඇල්මැති පාර්ශවකරුවන්ගෙන් සැදුම්ලත් පුළුල් ප්‍රජාවකට සේවය කිරීම සඳහා පහත මධ්‍යස්ථාන සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි:
- **පරිගණක හා තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර්ක්‍රියා සෛලය *(IICfCT)***

IICfCT කර්මාන්තය සමඟ සම්බන්ධ වීම සඳහා පීඨයේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. එය සියලුම අවසන් වසර සිසුන් හට කර්මාන්ත ස්ථානගත කිරීම් සම්බන්ධීකරණය කිරීමේ සිට පරිගණක හා තාක්ෂණ පීඨය වෙනුවෙන් උපදේශන පැවරුම් කළමනාකරණය කිරීම දක්වා විවිධ ක්‍රියාකාරකම් හසුරුවයි. IICfCT විශ්ව විද්‍යාල සිසුන්ට ඉගෙනීමේ අත්දැකීම් සහ පීඨ සාමාජිකයින්ට සහයෝගී පර්යේෂණ අවස්ථා ලබා දෙන අතර ම, කර්මාන්ත සඳහා විශ්වාසී සහ පිරිමැසුම්දායක විසඳුම් සපයයි. IICfCT හට සිය සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා (ADB) විසින් අරමුදල් සපයනු ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියෙන් සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමට හැකි විය.

- **තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ටතා මධ්‍යස්ථානය *(CETE)***

සිසුන්ගේ ක්‍රියාකාරී නියැලීම, ගැඹුරු අවබෝධය සහ විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කරන නව්‍ය ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රමවේද හරහා තාක්ෂණ විෂය ධාරාවේ ප්‍රථම උපාධි අධ්‍යාපනයෙහි ගුණාත්මක බව ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, තාක්ෂණ අධ්‍යාපන විශිෂ්ටතා මධ්‍යස්ථානය 2022 නොවැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයනු ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතිය යටතේ කැලණිය විශ්ව විද්‍යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයේ විස්කොන්සින්-මැඩිසන් විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්වයක් හරහා ඇමරිකා එක්සත් ජනපදයේ විස්කොන්සින්-මැඩිසන් විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කර CETE පිහිටුවන ලදී. නව්‍ය ඉගැන්වීමේ සහ ඉගෙනුම් සංස්කෘතිය ආයතනිකකරණයට පහසුකම් සලසන අතර ම, ඉගැන්වීමේ සංකීර්ණ, අභියෝගාත්මක සහ ගතික ශිල්පය තුළ විශිෂ්ටත්වය දැක්වීමට අධ්‍යාපනඥයන්ට/පීඨ සාමාජිකයන්ට මෙම මධ්‍යස්ථානය විසින් වර්තමානයේ දී ගුණාත්මක අත්වැලක් සපයනු ලබයි.

- **උසස් ද්‍රව්‍ය සහ සුහුරු නිෂ්පාදනය සඳහා වන මධ්‍යස්ථානය *(CAMSM)***

2022 දී ආරම්භ කරන ලද මෙම නව මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ උසස් ද්‍රව්‍ය, සුහුරු නිෂ්පාදන සහ පාරිසරික තාක්ෂණයන් ඇතුළුව, උසස් ඉංජිනේරු සහ ජෛව පද්ධති තාක්ෂණයන් සංවර්ධනය කිරීම සහ යෙදීම් පිළිබඳ පර්යේෂණ, නවෝත්පාදන, අධ්‍යාපනය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම ඔස්සේ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැසෙමින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා දායක වීම ය.

CAMSM හි ප්‍රධාන අරමුණු වනුයේ ඉංජිනේරු සහ ජෛව පද්ධති තාකෂණයන්හි පරිවර්තනාත්මක ශාස්ත්‍රීය පර්යේෂණ පැවැත්වීම, පීඨය තුළ පර්යේෂණ පරිසර පද්ධතියක් ගොඩනැගීම, තාකෂණය මත පදනම් වූ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපනය, පුහුණුව සහ උපදේශනය හරහා පරිවර්තනාත්මක ශාස්ත්‍රීය පර්යේෂණ පැවැත්වීමේ ධාරිතාව ගොඩනැගීම සඳහා පහසුකම් නිර්මාණය කිරීමයි.

# 2022 වසර සඳහා වන නව බඳවා ගැනීම්වල සාරාංශය

වගුව 36 : පරිගණක හා තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම්

| අධ්‍යයන අංශය | බඳවා ගැනීම් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික දේශකයන් | ප්‍රදර්ශකයන් |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | | | |
| ව්‍යවහාරික පරිගණනය | 221 | 2158 | 2379 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 198 | 713 | 911 |
| පරිගණක පද්ධති ඉංජිනේරු විද්‍යාව | 8 | 16 | 24 |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | | | |
| පීඨ කාර්යාලය | 221 | 2158 | 2379 |
| තාක්ෂණික නිලධාරීන් | 198 | 713 | 911 |
| විද්‍යාගාර සහායකයන් | 8 | 16 | 24 |

# සමස්ත ස්ථිර කාර්යමණ්ඩලය

වගුව 37 : පරිගණක හා තාක්ෂණ පීඨයේ කාර්යමණ්ඩලය

| අංශය | පිරිමි | කාන්තා | මුළු | ආචාර්ය උපාධිය | ජ්‍යෙෂ්ඨ/ මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ දේශකයන් | පරිවාස දේශකයන් |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යවහාරික පරිගණනය | 08 | 05 | 221 | 13 | 09 | 10 | 03 |
| පරිගණක පද්ධති ඉංජිනේරු විද්‍යාව | 07 | 03 | 198 | 10 | 06 | 05 | 04 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 04 | 06 | 8 | 10 | 05 | 05 | 05 |
| **මුළු** | ***19*** | ***14*** | ***33*** | ***20*** | ***01*** | ***20*** | ***12*** |

ආචාර්ය ප්‍රදීප් සමරසේකර 2022 සැප්තැම්බර් 2 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති උත්සවයක දී විශිෂ්ටතම නව නිපැයුම්කරු සඳහා පිරිනැමෙන (CVCD) විශිෂ්ටතා සම්මානය ලබා ගන්නා ලදී. මීට අමතරව, බොහෝ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සෙනට් සහ උපකුලපති සම්මාන ලබා ඇත.

# පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පරිගණක සහ තාක්ෂණ පීඨය විසින් ප්‍රථම උපාධි වැඩසටහන් තුනක් පිරිනමනු ලැබේ:

- **පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය**

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ අ.පො.ස උසස් පෙළවිභාගයේ ගණිත විෂය ධාරාවෙන් වන අතර, 2022 දී බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 60 කි. පළමු සිසුන් කණ්ඩායම 2023 දී උපාධිය ලබා ගැනීමට අපේක්ෂිත ය.

- **ඉංජිනේරු තාක්ෂණවේදී (BET) ගෞරව උපාධිය**

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ අ.පො.ස උසස් පෙළ විභාගයේ තාක්ෂණ විෂය ධාරාවෙන් වන අතර, 2022 දී බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 87 කි. පීඨය විසින් පළමු වරට බිහි කරන ලද ඉංජිනේරු තාක්ෂණවේදීන් කණ්ඩායම ලෙස 2022 දී සිසුන් හැට දෙදෙනෙක් මෙම වැඩසටහනෙන් උපාධිය ලබා ගත්හ.

- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (BICT) ගෞරව උපාධිය**

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ අ.පො.ස උසස් පෙළ විභාගයේ තාක්ෂණ විෂය ධාරාවෙන් වන අතර, 2022 දී බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 98 කි. පීඨය විසින් නිෂ්පාදනය කරන ලද පළමු තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් කණ්ඩායම ලෙස 2022 දී සිසුන් හතළිස් නව දෙනෙක් මෙම වැඩසටහනෙන් උපාධිය ලබා ගත්හ.

ඔනව උපාධි වැඩසටහනක් වන ජෛව පද්ධති තාක්ෂණයවේදී උපාධිය විශ්වවිද්‍යාල සභාව විසින් 2022 දී අනුමත කර ඇත. එම යෝජනාව සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කර ඇත.

# පර්යේෂණය

2021 දී කාර්යමණ්ඩලය විසින් සුරක්ෂිත කරන ලද පහත දක්වා ඇති අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන 2022 දී ක්‍රියාත්මක විය.

1. ආචාර්ය කසුන් ප්‍රනාන්දු - උස් ගොඩනැගිලි සංකීර්ණයෙන් විදුලිය නිපදවීම සඳහා ප්‍රශස්ත සුළං මෝල් තල පද්ධතිය.

2. ආචාර්ය ලාලිත ලියනගේ - පරිගණක හා තාක්ෂණ පීඨය අවට පානීය ජල තත්ත්ව තක්සේරුව.

3. රාජිත පීරිස් මහතා - නිෂ්පාදන තත්ත්ව සහතිකය සඳහා දේශීයව නිෂ්පාදනය කරන ලද අවම පිරිවැය එලක වර්ගයේ සම්බන්ධීකරණ මිනුම් යන්ත්‍ර (කචඑ) සඳහා නිෂ්පාදන ක්‍රමය විමර්ශනය කිරීම.

4. ආචාර්ය අනුරාධි වෙල්හෙන්ගේ - මාර්ගගත අධ්‍යාපනය සඳහා අතථ්‍ය යථාර්ථය ඇතුළත් කරන ලද පද්ධති ඉලෙක්ට්‍රොනික විද්‍යාගාර සිමියුලේටරය.

2022 වසරේ දී අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නව අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන හතරක් සුරක්ෂිත කර ගන්නා ලදී:

1. ආචාර්ය ඉඳුනි ඩබ්ලිව්. සිරිවර්ධන - අගය එකතු කළ පෝෂණීය නිෂ්පාදන සඳහා තේ පොලිෆෙනෝල් නැනෝ-එන්කැප්සුලේෂන්.

2. ආචාර්ය තිලිණි පී. රූපසිංහ - ජෛවජනක ද්‍රව්‍ය භාවිතයෙන් එළවළු/පළතුරුවල ඇති පළිබෝධනාශක අපද්‍රව්‍ය කාර්යක්ෂමව ඉවත් කිරීම සඳහා ගෘහස්ථ රෙදි සෝදන දියරයක් සංවර්ධනය කිරීම.

3. ආචාර්ය ආර්.ආර්. එල්.යු.අයි රාජපක්ෂ- යාන්ත්‍රික ඉගෙනීම, ගැඹුරු ඉගෙනුම් ඇල්ගොරිතම භාවිතා කරමින් විවේක තත්වයේ (FMRI) විශ්ලේෂණයේ දී ක්‍රියාකාරී මොළයේ සම්බන්ධතාවය.

4. ආචාර්ය ප්‍රදීප් ඩබ්ලිව් සමරසේකර - ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ (CKDu) සඳහා අවම අවදානමක් සහිත භූගත ජල මූලාශ්‍ර හඳුනා ගැනීම.

පරිගණක හා තාක්ෂණ පීඨයෙහි පර්යේෂකයෝ 2022 දී ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය හරහා රුපියල් මිලියන 190 කට වඩා වටිනා අරමුදල් ලබා ගත්හ.

ව්‍යවහාරික පරිගණක දෙපාර්තමේන්තුවේ ආචාර්ය ප්‍රදීප් සමරසේකර විසින් ආසියානු සංවර්ධන බැංකු විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලද “ශ්‍රී ලංකා ඛනිජ ද්‍රව්‍යවලින් දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය නිස්සාරණය කිරීම” යන පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො. 500,000 ක ප්‍රදානයක් ලබා ගන්නා ලදී.

මීට අමතරව, ආසියානු සංවර්ධන බැංකු විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය හරහා පිළිවෙළින් රුපියල් මිලියන 6.7ක් සහ රුපියල් මිලියන 8.3ක් ලබා ගැනීමට ආචාර්ය ලලිත ලියනගේ සහ ආචාර්ය සිදත් ලියනගේ සමත් විය.

පරිගණක හා තාක්ෂණ පීඨයෙහි පර්යේෂකයන් ජර්නල් ලිපි 15කට වඩා ප්‍රකාශයට පත් කිරීමෙන් සහ සම්මන්ත්‍රණ පත්‍රිකා 8කට වඩා ඉදිරිපත් කිරීමෙන් විෂයන් ගණනාවකින් දැනුම සම්භාරයට දායක විය. පීඨයට අති නවීන විද්‍යාගාර පහසුකම් අලුතින් එක් කිරීම මගින් ඉදිරි වසරවල පර්යේෂණ ප්‍රතිදානය ඉහළ නැංවෙනු ඇත.

# 2022 දී පීඨය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ

තාක්ෂණය සහ පරිගණකකරණයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICATC 2022) 2022 දෙසැම්බර් 2 වැනි දින මාර්ගගතව පවත්වන ලදී. ලොව පුරා සිටින විද්වතුන් හට සහයෝගීතාවන් අරඹමින්, ඔවුන්ගේ තාක්ෂණික, විද්‍යාත්මක සහ සමාජ-ආර්ථික සොයාගැනීම් එක්රැස් කිරීමට සහ බෙදා ගැනීමට සහාය වන වාර්ෂික උත්සවයක් ලෙස මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. 2022 වසරේ සමුළුව “තිරසර සංවර්ධනයක් කරා ඩිජිටල් තාක්ෂණයන් භාවිත කිරීම“, යන තේමාව යටතේ සංවිධානය කෙරිණි. “ඩිජිටල් ලෝකයක් සඳහා තිරසාර අධ්‍යාපනය“ යන මාතෘකාව යටතේ කැනඩාවේ Athabasca විශ්වවිද්‍යාලයේ මහාචාර්ය Marth Cleaveland-Innes විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. සමුළුවේ කොටසක් ලෙස වැඩමුළු තුනක් සහ ශිෂ්‍ය පර්යේෂණ සමුළුවක් ද සංවිධානය කර තිබුණි.

# පරිගණක හා තාක්ෂණ පීඨයේ යටිතල පහසුකම් සංවර්ධනය

අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRDP) මගින් අරමුදල් සපයනු ලබන පරිගණක සහ තාක්ෂණ පීඨයෙහි නව ගොඩනැගිලි සංකීර්ණය නිම වෙමින් පවතී. 2023 ජනවාරි මාසය තුළ දී මෙම පීඨය දැනට නිමා කරමින් පවතින විද්‍යාගාර ගොඩනැගිලි සංකීර්ණය කරා ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත. ඉතිරි ගොඩනැගිලි 2023 වසර අවසන් වන විට නිම කෙරෙනු ඇති අතර, පරිගණක සහ තාක්ෂණ පීඨය 2023 ඔක්තෝම්බර් මාසය වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

# අදාළ ක්ෂේත්‍රයෙහි කර්මාන්ත සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරීත්වයන්

පරිගණක හා තාක්ෂණ පීඨයේ කාර්මික අංශය ලෙස, පරිගණක හා තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී සෛලය (IICfCT) පීඨයේ කර්මාන්ත හවුල්කාරිත්වය සහ සහයෝගිතා සම්බන්ධ ක්‍රියාකාරකම් කළමනාකරණය කරයි. ආසියානු සංවර්ධන බැංකුවෙහි ප්‍රදාන ආධාරයක් හරහා IICfCT විසින් ශ්‍රී ලංකාවේ නියමු වැඩසටහනක් ලෙස “දැනුම හුවමාරු හවුල්කාරිත්වය - KxP™“ නම් වැඩසටහනක් ආරම්භ කර ඇත. (KxP™) යනු විශ්ව විද්‍යාල සහ ආයතනික අංශය අතර පූර්ණ අරමුදල් සහිත පර්යේෂණ සහයෝගීතාවයකට මඟ පෙන්වන පීඨයේ පුරෝගාමී පර්යේෂණ මුලපිරීමකි. KxP™ හි, විද්වතුන් සහ සමාගම් විශේෂඥයින් ඔවුන්ගේ තරඟකාරිත්වය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් සමාගම පදනම් කරගත් KxP Associate™ ඒකාබද්ධව අධීක්ෂණය කරයි. KxP™ වැඩසටහන යටතේ, 2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාල-කර්මාන්ත පර්යේෂණ සහයෝගිතාවන් ලෙස ප්‍රධාන ව්‍යාපෘති දෙකක් ආරම්භ කරන ලදී.

2022 දී සිසුන් 225 ක් පමණ සීමාවාසිකයින් ලෙස කර්මාන්තය තුළ ස්ථානගත කර ඇත. ඔවුන්ගේ මාස 06 ක කාර්මික පුහුණු වැඩසටහන තුළ උපාධි අපේක්ෂකයින් 135 ක් පූර්ණ කාලීන සේවකයින් ලෙස තොරතුරු සන්නිවේදනය සහ තාක්ෂණය සහ පරිගණක විද්‍යා අංශයෙහි ස්ථානගත කර ඇති අතර, උපාධි අපේක්ෂකයින් 90කු  ඉංජිනේරු අංශයට ඇතුළත් කර ඇත. සියලුම සිසුන් විෂය සම්භාර අටක් ලබා දෙන අධ්‍යයන කාල සීමාව අවසානයේ සිදු කළ යුතු පැවරුම් (eight credit capstone ව්‍යාපෘති) සම්පූර්ණ කළ යුතු වේ. බොහෝ දෙනෙක් කර්මාන්ත සහයෝගී පර්යේෂණ ව්‍යාපෘතිවල වැඩ කරමින් කර්මාන්ත අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමේ දී සාර්ථක ප්‍රගතියක් ලබති.

පීඨය විසින් එහි උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ කර්මාන්තයෙහි සේවය කිරීමේ සූදානම වැඩි දියුණු කිරීමට සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම සඳහා වෙබ් සම්මන්ත්‍රණ, සම්මන්ත්‍රණ සහ පූර්ණ දින වැඩමුළු රාශියක් පවත්වා ඇත.

එමෙන්ම, අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් විසින් දැනුම සහ ප්‍රවීණත්වය බෙදාගැනීම සම්බන්ධව ඔවුන්ගේ ජාතික සේවාවන් ඉටු කිරීම සඳහා විවිධ සංවිධාන සහ ව්‍යාපාරික ආයතන වෙත උපදේශන සේවා සපයන ලදී. වසර තුළ පීඨය දැඩි ලෙස නිරත වූ එක් ප්‍රධාන ව්‍යාපෘතියක් වූයේ ආබාධ සහිත දරුවන් සඳහා වූ අයාති ජාතික මධ්‍යස්ථානය (Ayati National Centre for Children) සඳහා වූ ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා (EMR) මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතියයි.

# පීඨ සාමාජිකයන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

කාර්යමණ්ඩල සාමාජිකයෝ ස්වකීය අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සහතිකකරණ වැඩසටහන් කිහිපයකට සහභාගී වූහ. කාර්යමණ්ඩල සාමාජිකයන් සහභාගී වූ වැඩසටහන් පහත දක්වා ඇත.

ආචාර්ය චානක උදයංග, ආචාර්ය ශකිල පතිරණ සහ ආචාර්ය අමිල ජීවන්දර විසින් 2022 අගෝස්තු මාසයේ දී විවිධ විශ්වවිද්‍යාල සහ මහජන චීන සමූහාණ්ඩුවේ සංවිධාන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සාර්ථකව නිමා කරන ලදී.

ආචාර්ය තිළිණි රූපසිංහ විසින් කොළඹ විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන රාජ්‍ය විශ්වවිද්‍යාල සහ වෘත්තීය විද්‍යාල සඳහා ශාස්ත්‍රීය මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන් මාලාවක් 2022 වසර උදෙසා සම්පූර්ණ කර ඇත.

අනුකූලතා ඇගයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පවත්වන ලද ISO/IEC 17025:2017 පිළිබඳ තක්සේරු පුහුණු පාඨමාලාව වන SLAB වැඩසටහන ආචාර්ය අමිල ජීවන්දර සහ ආචාර්ය කසුන් ප්‍රනාන්දු විසින් අගෝස්තු මාසය තුළ දී සම්පූර්ණ කරන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය විසින් තාක්ෂණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද ADB ස්ත්‍රී පුරුෂ සමාජභාවය පුහුණු කිරීමේ වැඩමුළුව සඳහා සියලුම පීඨ සාමාජිකයින් සහභාගී විය.

# ශිෂ්‍ය කටයුතු

තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය මණ්ඩලය ශිෂ්‍ය සමාජ සහ සංවිධාන හරහා විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම්වල සහ ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතිවල ක්‍රියාකාරීව නියැලී සිටී. පරිගණක සහ තාක්ෂණ පීඨයේ හරිත සමාජය, පරිගණක සහ තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය එකමුතුව, ඉංජිනේරු තාක්ෂණ සිසුන්ගේ සංගමය (ETSA), තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය (ITSA), තොරතුරු පද්ධති විගණන සහ පාලන සංගමය (ISACA), කැලණිය විශ්වවිද්‍යාලයේ ලෙජන් සමාජය සහ පරිගණක විද්‍යා ශිෂ්‍ය සංගමය යනාදිය ක්‍රියාකාරීව නියැලී සිටින ශිෂ්‍ය සමාජ වේ.

**ආචාර්ය ආර්. එම්. සී. එස්. පුෂ්පකුමාර**
**පීඨාධිපති/ පරිගණක සහ තාක්ෂණ පීඨය**





# පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## දැක්ම

"පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දැක්ම අතීතයේ සිට අධ්‍යාපනයේ අරමුණ සම්බන්ධයෙන් වූ සංකල්පය මත පදනම් වී ඇත: නත්ථි විජ්ජා සමාම් පානා (පාලි)(Natthi vijjaa Samam pannaa) 'දැනුමට සමාන කිසිදු බලයක් නොමැත' නැතහොත් ipsa scientia potestas est [ලතින්] 'දැනුම බලය වේ'. එබැවින් සිය ශිෂ්‍යයින් විවිධ ක්ෂේත්‍රවල දැනුම උකහා ගනිමින්, පර්යේෂණ දක්වා දක්වන කැපවීම, නව අදහස් සඳහා ඇති විවෘතභාවය සහ විශ්ලේෂණ නිපුණතාවල සමත්භාවය හරහා ලෝකය වඩාත් විශිෂ්ට ස්ථානයක් බවට පත් කිරීම සඳහා දැනුම අත්පත් කර ගනු ඇතැයි පීඨය අපේක්ෂා කරයි."

## මෙහෙවර

"පශ්චාත් උපාධි මට්ටමින් පර්යේෂණ සඳහා දිරිගැන්වීම සහ දැනුම බෙදා හැරීම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මෙහෙවර වේ. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පශ්චාද් උපාධි අධ්‍යාපනයෙහි විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලු පීඨවල අධ්‍යයන කාර්යමණ්ඩලය, සිසුන් සහ පරිපාලන කාර්යමණ්ඩලය සමඟ කටයුතු කරයි. එබැවින්, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් එහි සිසුන් සඳහා ගතික බුද්ධිමත් වාතාවරණයක් නිර්මාණය කිරීමට පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි, දර්ශනපති සහ දර්ශනශූරී කරා මඟ පෙන්වන වැඩසටහන් ඔස්සේ උපාධිධාරීන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය පුරා විසිරී තිබෙන සියලු අධ්‍යයන අංශ හා එක්ව ක්‍රියා කරනු ලබයි."

# සංවිධානාත්මක ව්‍යුහයේ සමස්ත විග්‍රහය

මෙම පීඨයේ අධ්‍යයන සහ පරිපාලනමය ප්‍රධානියා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙහි පීඨාධිපතිවරයා වේ. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට එහි සියලුම ශාස්ත්‍ර අය වන වැඩසටහන්වල මූල්‍ය කටයුතු විධිමත් කිරීම සඳහා සහකාර මූල්‍යාධිකාරී විසින් ප්‍රධානත්වය ගෙන කටයුතු කරනු ලබන මූල්‍ය අංශයක් සහ පීඨයේ පරිපාලනමය කාර්යයන් සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයෙකු ඇත.

# පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පුළුල් විෂය ක්ෂේත්‍රවලින් සමන්විත පහත අධ්‍යයන මණ්ඩල යටතේ පශ්චාද් උපාධි වැඩසටහන් 58ක් පිරිනමනු ලබයි:

1. **වාණිජ සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
2. **පරිගණනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
3. **ඩිජිටල් ඉගෙනීම පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
4. **මානවශාස්ත්‍ර පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
5. **විද්‍යාව පිළිබඳ පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
6. **සමාජ විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
7. **වෛද්‍ය විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී උපාධිය**
8. **බහුවිධ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී උපාධිය**

ඉහත උපාධි වැඩසටහන්වලට අමතරව, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පරිගණක සහ තාක්ෂණ පීඨයේ සහාය ඇතිව තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය විධිමත්ව පිහිටු වීම සඳහා පියවර ගන්නා ලදී. කොවිඩ්-19 වසංගතය සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් හටගත් නොයෙක් බාධාක හමුවේ වුව ද, 2900කට අධික සිසුන් පිරිසක් බඳවා ගැනීමට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට හැකි විය. තවද, පහත දකල්වා ඇති නව වැඩසටහන් ත්‍රිත්ත්වය දියත් කෙරුණු අතර, අධ්‍යයන කටයුතු ආරම්භ විය:

1. **ජපන් භාෂා පශ්චාද් උපාධි ඩිප්ලෝමාව**
2. **පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති**
3. **ව්‍යාපාර අධ්‍යයන (චීනය) පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන**

බංග්ලාදේශයෙහි පිරිනමන ලද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනෙහි වැඩසටහන් සමාලෝචනය පැවැත්වීමට කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාජිකයන් තිදෙනෙකු 2022 නොවැම්බර් මාසයේ දී බංග්ලාදේශය වෙත සංචාරය කළේය.පොරොත්තු ශිෂ්‍ය බඳවා ගැනීම් සහ වැඩසටහනෙහි ප්‍රතිඵල නිමා කිරීමට මණ්ඩලයට හැකි විය. තවද, විදේශීය උපාධි අපේක්ෂකයන් වැඩි පිරිසක් බඳවා ගැනීම සඳහා අලෙවිකරණ කටයුතුවල නිරත වීමට ද මෙම කණ්ඩායම සඳහා එය අවස්ථාවක් විය.

# පර්යේෂණය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 2022, දෙසැම්බර් 28 වන දින පවත්වන ලද ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව සඳහා සාර සංක්ෂේප යොමු කළ කතුවරයන්ගෙන් පූර්ණ පත්‍රිකා කැඳවීම මගින් 2023 වර්ෂයේ මැද භාගය වන විට එම පීඨයෙහි ජ'නලය පළ කිරීමට සැලසුම් කර ඇත. සමුළුවේ සමාලෝචන මණ්ඩල සහ සැසියන්හි ප්‍රධානත්වය දැරූ පුද්ගලයන් විසින් නිර්දේශ කරනලද සාර සංක්ෂේප යොමු කළ කතුවරයන්ගෙන් පූර්ණ පර්යේෂණ පත්‍රිකා කැඳවනු ලැබේ. පර්යේෂණ සභාව විසින් අනුමත කරන ලද අන්තර්ජාතික වශයෙන් පිළිගත් ජ'නල ලැයිස්තුවල අවම වශයෙන් එක් පූර්ණ පත්‍රිකාවක් හෝ ප්‍රකාශයට පත් කිරීම සියලු දර්ශනපති සහ දර්ශනශූරී උපාධි අපේක්ෂකයන් සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත් කෙරිණි.

# 2022 වසරේ දී පීඨය විසින් සංවිධානය කරන ලද සමුළු

පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය දෙසැම්බර් මාසයේ දී ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව (IPRC) සංවිධානය කළේය. එය පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනයෙහි පවත් වන ලද 22වන අනුගාමී සමුළුව විය. "අර්බුද තත්ත්වයන්හි දී පර්යේෂණය සහ නවෝත්පාදන" යන්න මෙම සමුළුවේ තේමාව වූ අතර, මෙහි සමාරම්භක උත්සවය මන්දිහි කළමනාකරණය පිළිබඳ ඉන්දීය ආයතනයේ මහාචාර්ය ආර්ට් කාශ්‍යප්ගේ ප්‍රධාන දේශනයෙන් ආලෝකමත් විය. ඉන් අනතුරුව ඇමරිකානු එක්සත් ජනපදයේ සහ බංග්ලාදේශයේ මහාචාර්යවරුන් දෙදෙනෙකු විසින් පූර්ණ සැසි ත්‍රිත්ත්වයක් පවත්වන ලදී. සාර සංක්ෂේප 150කට අධික ගණනක් ලැබුණු අතර, ඉන් 100ක් පමණ සමුළුවේ දී ඉදිරිපත් කිරීමට තෝරා ගැනුණි. මෙම අවස්ථාව දෙමුහුන් අවස්ථාවක් ලෙස සංවිධානය කෙරුණු අතර, සාර සංක්ෂේප වෙළුම සහ වැඩසටහන් ග්‍රන්ථය ඇතුළුව, සියලුම ප්‍රකාශන ඩිජිටල්මය වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි.

# යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පශ්චාද් උපාධි වැඩසටහන් අයවැය සහ වවුචරපත්වලට අදාළ ක්‍රියාවලි කාර්යක්ෂමව සහ සඵලදායීව කළමනාකරණය පහසු කිරීම සඳහා ප්‍රථම වරට හඳුන්වා දෙන ලද මාර්ගගත අයවැය සහ වවුචර් පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. 2021 දී අනුගමනය කළ, ගෙවීම් සිදු කිරීමේ දී අංක 16කින් යුත් කේතයක් භාවිත කිරීම 2022 වසර සඳහා පශ්චාද් උපාධි වැඩසටහන්වලින් හඳුනා නොගත් ආදායම අවම කිරීමට හේතු වී ඇත.

දර්ශනපති සහ දර්ශනශූරී උපාධි ආශ්‍රිත ක්‍රියාවලි අයදුම් කිරීමේ සිට අදාළ උපාධිය ලබා ගැනීම දක්වා ඩිජිටල්ගත කිරීමට පාලක සභාවෙන් මූල්‍ය සහ නියාමන අනුමැතිය ලබා ගැනුණි. 2023 වසරේ මුල් භාගයේ දී මෙම පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීමට අපේක්ෂිත ය.

පාඨමාලා අනුව ශාස්ත්‍රපති උපාධිය හදාරන සියලුම සිසුන්ට සපයන වත්මන් පරිගණක පද්ධතිය පාර්ශ්වකරුවන්ගේ වර්තමාන සහ පුරෝකථනය කළ අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කළ යුතු බව නිරීක්ෂණය විය. එබැවින්, මෙම කාර්යය සඳහා නව පද්ධතියක් සංවර්ධනය කිරීමට ආරම්භක සැලසුම්කරණය සහ සාකච්ඡාවන් පැවැත්විණි. තවද, FGS පරිගණක පද්ධතිය වෙත පිවිසීමට සිසුන්ට ජංගම උපාංග සඳහා ජංගම යෙදවුමක් සංවර්ධනය කිරීමට ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනුණි. මෙය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති ඒකකය සහ පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය එක්ව සිදු කරනු ලබන ව්‍යාපෘතියකි.

# විදේශීය හවුල්කරුවන් සමඟ පවත්නා ශාස්ත්‍රීය සහයෝගය

කැලණිය විශ්වවිද්‍යාලය 2019 වසරේ සිට බංගලාදේශයේ කේම්බ්‍රියන් ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රය (CISC) සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගෙන ඇත. මෙම සහයෝගීතාවත් සමඟ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන බංගලාදේශයේ පිරිනමනු ලබන අතර, තෙවන කණ්ඩායම 2022 වසරේ දී ආරම්භ කෙරුණු අතර, බංග්ලාදේශයේ සිදු කළ මෙම කටයුතුවලින් එ.ජ. ඩොලර් 7000 කට අධික මුදලක් ලැබුණි.

2022 නොවැම්බර් මාසයේ දී, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනයෙහි දර්ශනශූරී සහ ආචාර්ය උපාධි වැඩසටහන් පිරිනැමීම සඳහා එම ආයතනය සමඟ වෙනම ගිවිසුමක් අත්සන් කෙරිණි. නොවැම්බර් මාසයේ දී බංගලාදේශයට පිටත්ව ගිය කැලණිය විශ්වවිද්‍යාලීය කණ්ඩායම විසින් විභව (Potential) අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට ලක් කරන ලද අතර, වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් සලකා බලනු ලැබීම සඳහා අයදුම්පත් ඔවුන් වෙත යොමු කරන ලදී. 2023 වසරේ පළමු කාර්තුව සඳහා රටපුරා ෆේස්බුක් අලෙවිකරණ ව්‍යාපාරයක් සැලසුම් කර ඇති අතර, අනාගතයේදී වෙනත් ක්ෂේත්‍ර සඳහා ද තවත් අයදුම්පත් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න**
**පීඨාධිපති/ පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය**



# මානව ශාස්ත්‍ර
## පීඨය

## දැක්ම

"මානවශාස්ත්‍ර ක්ෂේත්‍රය තුළ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම."

## මෙහෙවර

"භාෂා, කලා සහ ආගම පිළිබඳ ක්ෂේත්‍රවල අධ්‍යාපනය සහ පර්යේෂණය හරහා මානව සම්පත ශක්තිමත් කිරීම."

## සංවිධාන ව්‍යුහයේ සමස්ත විග්‍රහය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨය සංස්කෘතික සහ ශිෂ්ඨාචාර අධ්‍යයනය කරා පවත්නා එහි බහු වාග්විද්‍යාත්මක, බහු සංස්කෘතික ප්‍රවේශය පිළිබිඹු කරන සංස්කෘතීන්, සම්ප්‍රදායයන් සහ උත්කෘෂ්ටවත් භාෂා ගණනාවකින් සමන්විත ය. එය පහත දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත ය:

- ඉංග්‍රීසි අධ්‍යයන අංශය
- ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය
- ලලිත කලා අධ්‍යයන අංශය
    - නාට්‍ය හා රංග කලාව සහ රූප කලා ඒකකය
    - දෘශ්‍ය කලා සහ නිර්මාණ සහ රංග කලා ඒකකය
- හින්දි අධ්‍යයන අංශය
- වාග්විද්‍යා අංශය
- නූතන භාෂා අංශය
- පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය
- සංස්කෘත සහ පෙරදිග අධ්‍යයන අංශය
- සිංහල අධ්‍යයන අංශය
- බටහිර සම්භාව්‍ය සංස්කෘතිය සහ ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය
- අධ්‍යාපන ඒකකය

# පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

වගුව 38 : මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන අනුව සිසුන්

| අධ්‍යයන වැඩසටහන | සමස්ත සිසුන් ගණන | | | |
| --- | --- | --- | --- | --- |
| | 2020/2021 | 2019/2020 | 2018/2019 | 2017/2018 |
| ශාස්ත්‍රවේදී කලා සාමාන්‍ය උපාධිය | 525 | 169 | 149 | - |
| ව්‍යාපාරික සහ අධ්‍යාපනික චීන භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 66 | 54 | 74 |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 63 | 67 | 47 | 50 |
| බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 12 | 14 | 16 |
| බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 2 | 14 | 13 | 6 |
| බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 10 | 10 | 12 |
| ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 5 | 4 | 5 | 2 |
| පරිගණක අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 4 | 1 | 2 |
| නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 13 | 15 | 12 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 11 | 15 | 8 | 5 |
| ප්‍රංශ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 8 | 8 | 4 | 7 |
| ජර්මන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 22 | 13 | 18 |
| හින්දි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 13 | 11 | 7 | 8 |
| දෘශ්‍ය කලා පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 7 | 9 | 4 |
| ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 16 | 23 | 23 |
| කොරියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 15 | 14 | 24 |
| වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 13 | 8 | 10 |
| සාහිත්‍ය විචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 2 | 1 | 3 | 4 |
| රංග කලා (නර්තනය) පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 33 | 15 | 26 |
| පාලි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 12 | 7 | 7 | 11 |
| රංග කලා (සංගීතය) පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 6 | 12 | 12 | 10 |
| රුසියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 8 | 2 | 2 | 7 |
| සංස්කෘත භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 11 | 9 | 5 | 6 |
| සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 76 | 78 | 75 |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 47 | 39 | 35 | 43 |
| භාෂා පරිවර්තන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 41 | 28 | 24 | 27 |
| වාස්තුශාස්ත්‍ර පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 32 | 23 | 49 |
| රංග කලා (කලා, පරිගණය සැලසුම්කරණ) පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | - | 19 | 17 | 18 |
| බටහිර සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 8 | 2 | - | 2 |
| **මුළු** | ***762*** | ***726*** | ***615*** | ***551*** |

# පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ විස්තර

2022 වසර අවසානයේ දී, මානවශාස්ත්‍ර පීඨයෙහි සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව 119ක් වූ අතර, තාවකාලික සේවක සංඛ්‍යාව 80ක් විය. අධ්‍යයන කාර්යමණ්ඩලයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවකට (45.9%) ආචාර්ය උපාධි හිමි අතර, හතරෙන් එකක් (23.5%) පමණ පිරිසක් මහාචාර්ය හෝ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවිය දරති. සමස්ත අධ්‍යයන කාර්යමණ්ඩලය වන 119න් (56) දෙනෙකු (47.1%) කාන්තාවන් ය.

# 2022 දී කාර්යමණ්ඩලය විසින් ජයග්‍රහණය කරන ලද බාහිර සම්මාන

2022 වසරේ දී අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයන් කිහිපදෙනෙක් ජාතික හෝ ජාත්‍යන්තර සම්මාන ජයග්‍රහණය කළහ. ඊට පහත දෑ ඇතුළත් වේ:

- **මිලින්ද තෙන්නකෝන් මහතා** - හොඳම හඬ නිර්මාපක, ශ්‍රී ලංකා යොවුන් සිනමා උළෙල
- **ආචාර්ය අනූෂා එන්. සල්වතුර** - වරිෂ්ත් හින්දි ප්‍රේමි සම්මානය (2021-2022)
- ශ්‍රී ලංකාව තුළ හින්දි භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ පිහිටි ඉන්දියානු මහ කොමිෂන් සභාව විසින් හසාරා ඩී. හිරිමුතුගොඩ මහත්මිය වෙත උභාර්තේ හින්දි ප්‍රේමි සම්මානය (2021-2022) පිරිනමන ලදී
- **ආචාර්ය අරුණ කේ. ගමගේ** - පශ්චාත් ආචාර්ය උපාධිය: මාර්බර්ග් හි පිලිප්ස් විශ්ව විද්‍යාලයේ හම්බෝල්ට් සාමාජිකත්වය
- **ජ්‍යේෂ්ඨ මහාචාර්ය කමනි ජයසේකර** - ඉංග්‍රීසි සාහිත්‍යය උදෙසා වන ගොඩගේ සාහිත්‍ය සම්මානය

# පර්යේෂණ

අධ්‍යයන කාර්යමණ්ඩලයේ එක් සාමාජිකයෙකුට රු. 15, 000/- ක විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයක් හිමි විය.

පීඨ සාමාජිකයින්ගේ පර්යේෂණ නිමැවුම්වලට පොත් 10 ක්, ග්‍රන්ථ පරිච්ඡේද දෙකක්, සම-සමාලෝචනය කරන ලදශාස්ත්‍රීය සඟරාවන්හි පත්‍රිකා 7 ක් සහ පර්යේෂණ සමුළු සාරසංක්ෂේප හෝ සම්පූර්ණ පත්‍රිකා 13 ක් ඇතුළත් වේ.

මානවශාස්ත්‍ර පීඨ පර්යේෂණ ඒකකය විසින් සංවිධානය කරන ලද මානවශාස්ත්‍ර උපාධිඅපේක්ෂක පර්යේෂණ සමුළුව 2021 වර්ෂයේ පෙබරවාරි 3 වන දින පවත්වන ලදී.

## යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

පීඨයේ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2022 වසරේ දී විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබිණි. AHEAD ව්‍යාපෘතිය විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශය සඳහා නව දේශන ශාලා දෙකක් සාදා නිමා කිරීම; ලලිත කලා අංශයේ ඒකක ද්විත්වයෙහි ම අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා නව කාර්යාල අවකාශයක් සහ නව කුටීර සංවර්ධනය කිරීම සහ පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශයෙහි සුවිශාල වැඩිදියුණු කිරීම් ප්‍රමාණයක් සිදු කිරීම මීට ඇතුළත් වේ.

## අදාළ ක්ෂේත්‍රයන්හි කර්මාන්ත සහ අනෙකුත් පාර්ශ්වයන් සමඟ පවත්නා හවුල්කාරීත්වයන්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවකයන් සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් පිරිනැමීමට වාග්විද්‍යා අංශයට හැකියාව ලබා දීමට, කැලණිය විශ්වවිද්‍යාලය 2022 දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට පිවිසුණි.

## විදේශීය හවුල්කරුවන් සමඟ පවත්නා අධ්‍යයන සහයෝගීතාව

හොන්කොන්හි බුද්ධ ධම්ම කේන්ද්‍රය සමඟ පවත්නා අවබෝධතා ගිවිසුම, පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය සමඟ පවත්නා අඛණ්ඩ සහයෝගයට පහසුකම් සැලසීම සඳහා යළිත් ඇරඹිණි.

සිංහල අධ්‍යයන අංශය චීනයේ බෙයිජින් විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය සමඟ “සේද මාවත“ වැඩසටහන සංවිධානය කළේය.

**ආචාර්ය සුදත් සෙනරත්**
**පීඨාධිපති/ මානවශාස්ත්‍ර පීඨය**



# වෛද්‍ය
## පීඨය

## දැක්ම

"
වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුම උත්පාදනය කිරීමට හා බෙදා හැරීමට ආධාර කිරීම මගින් විශිෂ්ටත්ව හා ඍජු සංස්කෘතියක් තුළ උසස් අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික වශයෙන් පිළිගත් ආයතනයක් වීමට පීඨය අපේක්ෂා කරයි.
"

## මෙහෙවර

"
වෛද්‍ය පීඨය

වෛද්‍ය පීඨය, විපරම, මුල් පිරීම, සමානාත්මතාව හා සමාජීය වගකීම යනාදී ජීවගුණ පෝෂණය කරන උසස් තත්ත්වයේ අධ්‍යාපනික පරිසරයක් තුළ,

- වෛද්‍ය සිසුන්ට, පශ්චාද් උපාධිධාරී වෛද්‍යවරුන්ට, ආශ්‍රිත සෞඛ්‍ය රැකවරණ වෘත්තීයවේදීන්ට සහ මහජනයාට අධ්‍යාපනය ලබා දෙයි,
- මනුෂ්‍යයන්ට වැළඳෙන රෝගාබාධ වැළැක්වීමට, රෝග නිශ්චය කිරීමට හා ප්‍රතිකාර කිරීමට රෝගීන් ඉලක්ක කරගත් වෛද්‍ය රැකවරණය සපයයි, සහ ව්‍යවහාරික හා සායනික පර්යේෂණ පවත්වයි.

පීඨයේ උපාධිධාරීන්ට ගෝලීයකරණය වූ සෞඛ්‍ය රැකවරණ පරිසරයක් තුළ තනි පුද්ගලයින් හා අදහස් දරන නායකයින් ලෙස සිය ප්‍රජාවට, රටට හා ලෝකයට සාර්ථකව සේවය කිරීම පිණිස අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සතු වනු ඇත.

වෛද්‍ය පීඨයේ දී ඉගැන්වීමට, ශිෂ්‍යයන් පුහුණු කිරීමට හා විද්‍යාත්මක විමසුම සඳහා උද්යෝගය ඇති ශාස්ත්‍රීය ප්‍රජාවක් මගින් දැනුම ලබා දෙනු ලැබේ. ඉගෙනුම හා පර්යේෂණ සඳහා අනර්ඝ පරිසරයක් ලබා දීම මගින් අපි ඉහළම මට්ටමේ ශාස්ත්‍රීය ඥානය දිරිමත් කරන්නෙමු.
"

# සංවිධාන ව්‍යුහය

රාගම පිහිටි වෛද්‍ය පීඨය යනු අක්කර 35ක පමණ වපසරියක පිහිටි සුවිශාල විශ්වවිද්‍යාලයකි. එහි කටයුතු 1991 සැප්තැම්බර් මස ඇරඹිණි. මෙම පීඨයේ ව්‍යුහ විද්‍යාව, ජෛව රසායන විද්‍යාව, කායික විද්‍යාව, පරපෝෂිත විද්‍යාව, සායනික ක්ෂුද්‍රජීව විද්‍යාව, ව්‍යාධි විද්‍යාව, ඖෂධවේදය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, මහජන සෞඛ්‍යය, පවුල් වෛද්‍ය විද්‍යාව, මනෝචිකිත්සාව, ළමා රෝග, වෛද්‍ය විද්‍යාව, ශල්‍යකර්ම, ප්‍රසව හා නාරිවේදය, වෛද්‍ය අධ්‍යයන සහ ආබාධිතතා අධ්‍යයන යනුවෙන් අධ්‍යයන අංශ 17 ක් ඇත. අණුක වෛද්‍ය ඒකකය, අස්ථි විකෘතිතා සහ වාහක රෝග රසායනාගාර මගින් රෝග විනිශ්චය සේවා සපයන අතර, ආසාදන රෝග සම්බන්ධ පර්යේෂණ සිදු කරයි. චන්ද්‍රාභාවය, ආමාශයාන්ත්‍රික, ස්වයංක්‍රීය ක්‍රියාකාරිත්වය, රක්තපාත විද්‍යාව, පටක රෝග විනිශ්චය විද්‍යාව, සෛල රෝග විනිශ්ච විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාගාර ප්‍රධාන වශයෙන් රෝග විනිශ්චය සේවා සපයන අතර, සායනික පර්යේෂණ සඳහා දායක වේ. ස්වභාවික නිෂ්පාදන පිරික්සීමේ රසායනාගාරය, සායනික පරීක්ෂණ ඒකකය සහ ජෛව මාත්‍රාමිතික රසායනාගාර පර්යේෂණ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි. ළමා පියස ළමා ආරක්ෂණ ඒකකය, තැලසීමියා මධ්‍යස්ථානය, ආඝාත ඒකකය, ආබාධ සහිත ළමුන් සඳහා වූ අයති මධ්‍යස්ථානය සහ අක්මා රෝග සඳහා උතුරු කොළඹ මධ්‍යස්ථානය යනු මෙම පීඨය මගින් විශිෂ්ට තෘතීයික සත්කාර ලබාදීම අරමුණු කර ගෙන පවත්වාගෙන යනු ලබන සියලුම පහසුකම් ය.

2021/2022 දී ආරම්භ කරන ලද සෞඛ්‍ය දත්ත විද්‍යා ඒකකය, තොරතුරු තාක්ෂණය පිළිබඳ කුසලතා සහ දැනුම ලබා දෙන අතර, පීඨයේ පර්යේෂණ කටයුතු සඳහා දායක වේ. සිසුන්ගේ සියලුම විෂය බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට සහ ශිෂ්‍ය උපදේශන, වෘත්තීය මාර්ගෝපදේශන සහ ශිෂ්‍ය සුබසාධන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ශිෂ්‍ය කටයුතු අංශයක් පිහිටුවා ඇත.

# අධ්‍යයන වැඩසටහන් සහ සිසුන්

එම්.බී.බී.එස්. අධ්‍යයන වැඩසටහන 2022 ජූනි මාසයේදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතන ඒකකය විසින් ප්‍රතීතනය කරන ලද අතර, තක්සේරු කරන ලද ප්‍රමිති අටෙන් ම ඉතා සතුටුදායක හෝ සතුටුදායක ලෙස ශ්‍රේණිගත කර ප්‍රතිශතමය බරිත ලකුණ සඳහා "හොඳ" ශ්‍රේණියක් ලබා ගන්නා ලදී.

වෛද්‍ය පීඨය විසින් පිරිනමනු ලබන කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව වැඩසටහන ශ්‍රව්‍ය විද්‍යාඥයින් සහ කථන සහ භාෂා චිකිත්සකයින් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු අනුමත වෘත්තීය වැඩසටහන වේ. අයති මධ්‍යස්ථානය මෙම සිසුන්ට මෙන්ම අනෙකුත් බොහෝ සම සෞඛ්‍ය සේවකයින් සඳහා සායනික පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර, මේ වන විට බාහිර රෝගීන් 10,000 කට ආසන්න සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත.

2022 වසරේ දී, 27 වන වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම සහ 10 වන විද්‍යාවේදී ගෞරව (කථන සහ ශ්‍රවණ විද්‍යා) ශිෂ්‍ය කණ්ඩායම මෙම පීඨයෙන් උපාධිය ලබා ගත්හ. 33 වන කණ්ඩායමේ (2020/21 බඳවා ගැනීම) සිසුන් 209 ක් එම්.බී.බී. එස්. උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වී, ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ජනවාරි මාසයේ දී ආරම්භ කළහ. විද්‍යාවේදී ගෞරව (SHS) උපාධි වැඩසටහනෙහි 14 වන කණ්ඩායමේ සිසුන් 92 ක් 2022 ජූලි 14 වන දින ඔවුන්ගේ නවක නම්ණීකරණ වැඩසටහන, වෘත්තීය චිකිත්සක උපාධි වැඩසටහනේ 1 වන කණ්ඩායමේ සිසුන් 47 දෙනෙකු සමඟ ආරම්භ කළහ.

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හරහා පිරිනමනු ලබන පශ්චාද් උපාධි වැඩසටහන් අතර මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (වසංගත රෝග) වැඩසටහන සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය, වෛද්‍ය ආචාර්ය උපාධිය සහ දර්ශනශූරී උපාධිය ප්‍රදානය කිරීමට හේතු වන පර්යේෂණ උපාධි ඇතුළත් වේ. 6 වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (වසංගත රෝග) වැඩසටහන 2022 අගෝස්තු මාසයේදී ආරම්භ විය.

මෙම පීඨය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමඟ ඒකාබද්ධව බාහිර උපාධි වැඩසටහන් දෙකක් ඉදිරිපත් කරන අතර, ඒවා එනම් වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ භෞතචිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය යි. දැනට සිසුන් 24 දෙනෙකුගෙන් යුත් තෙවන කණ්ඩායම (BSc) භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධි වැඩසටහන අනුගමනය කරති. 2022 දෙසැම්බර් 29 වන දින පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී වෘත්තීය චිකිත්සක වැඩසටහනෙහි දෙවන කණ්ඩායමේ සිසුන් 15 දෙනෙකුට ඔවුන්ගේ උපාධි සහතික ප්‍රදානය කරන ලදී. සමාජීය විද්‍යා පීඨය සමඟ එක්ව අපරාධ විමර්ශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් පොලිස් නිලධාරීන් වෙත පිරිනමනු ලැබේ. මේ වන විට දෙවන නිලධාරීන් කණ්ඩායම මෙම වැඩසටහන අනුගමනය කරමින් සිටිති.

## අධ්‍යයන කාර්යමණ්ඩලය

පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 129 දෙනෙකු ස්ථිර සේවක මණ්ඩලයේ ද, සාමාජිකයන් 34 දෙනෙකු පමණ තාවකාලික සේවක මණ්ඩලයේ ද සිටින අතර, අනුබද්ධ ශික්ෂණ රෝහල්වලට අනුයුක්තව සිටින විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළුව 60කට අධික බාහිර කාර්යමණ්ඩලයක් සිටී. 2022 වර්ෂයේදී නව අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් නව දෙනෙකු බඳවා ගත් නමුත්, විශ්‍රාම මහාචාර්යවරුන් සිව් දෙනෙකු ඇතුළුව ජ්‍යේෂ්ඨ විද්වතුන් 5 දෙනෙකු විශ්‍රාම යාම සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකු ඉල්ලා අස්වීම හා නව බඳවා ගැනීම් තාවකාලිකව නතර කිරීම හේතුවෙන්, ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව ඉහළ නොයෑමට හේතු විය.

වර්තමානයේ, පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් 13 ක්, මහාචාර්යවරුන් 35 ක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 13 ක් (I ශ්‍රේණිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 34ක් (II ශ්‍රේණිය), කථිකාචාර්යවරුන් 2 ක් (තහවුරු නොකළ) සහ පරිවාස කථිකාචාර්යවරුන් 25 ක් සිටිති. කාන්තා පිරිමි අනුපාතය 60:69 කි. අධ්‍යයන අංශ 11 ක විශ්‍රාම මහාචාර්ය තනතුර 2022 දෙසැම්බර් වන විට අත්කර ගෙන ඇත.

## පර්යේෂණ

පීඨය එහි පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳව සාඩම්බර වන අතර, එහි නිමවුම ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨවල ඉහළත ම ඒවා අතර පසු වේ. මෙම වසරේ ද එහි ජ්‍යේෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකු ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් ලොව පුරා විශිෂ්ටතම 2% පර්යේෂකයන් අතරට නම් කර ඇත. විශ්ව විද්‍යාලයේ විද්‍යුත් ලේඛන සුරක්ෂිතාගාරය වෙත දැක්වූ දායකත්වය 336 වන අතර, එයට ශාස්ත්‍රීය සඟරා ලිපි 240 ක්, සමුළු සාරසංක්ෂේප 64 ක්, නිබන්ධන 9 ක්, පොත් පරිච්ඡේද 5 ක් සහ ශිෂ්‍ය ශාස්ත්‍රීය සඟරා ලිපි 18 ක් ඇතුළත් වේ. පීඨ කාර්යමණ්ඩලය විසින් (Scopus) සුචිගත ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන 117ක් රචනා කර ඇත.

මෙම පීඨයට විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන නවයක් හිමි වූ අතර, එහි මුළු වටිනාකම රුපියල් 3,250,000 කි. මීට අමතරව, ලෝක සෞඛ්‍ය සංවිධාන ප්‍රදාන කිහිපයක් 5 ජාතික

විද්‍යා පදනමෙහි ප්‍රදාන (4) සහ තැලසීමියා, ජෛව ස්කන්ධ, ගෝලීය සෞඛ්‍ය අභියෝග, නායකත්වය, පෞද්ගලික වර්ධනය සහ සමාජ වගකීම (LEAPS), ළමා අරමුදල, IAEA, BTI, ළමා ලිංගික සංචාරක ELBS වලට සහ ආහාර පරිසර පර්යේෂණ සහ තවත් ප්‍රදාන කිහිපයක් ඇතුළුව බාහිර පර්යේෂණ ප්‍රදාන 20කට අධික ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත.

# යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

අක්මා රෝග සඳහා වන උතුරු කොළඹ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 2021 වසරේ ආරම්භ කළ නමුත්, ආර්ථික හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් අවසන් කිරීම බොහෝ ප්‍රමාද වී ඇත. නඩත්තු කාර්යමණ්ඩලයට සහ උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීමට නව ගොඩනැගිල්ලක්/ව්‍යුහයක් වර්තමානයේ ඉදි කෙරෙමින් පවතී. සිදු කරන ලද අනෙකුත් සියලුම ගොඩනැගිලි ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් සුළු එකතු කිරීම්, අලුත්වැඩියා කිරීම් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති විය.

දැනට පවතින ශිෂ්‍ය උපයෝගිතා කලාපයට රෙදි සෝදන කාමරයක් සහ රූපලාවන්‍යාගාරයක් ඇතුළත් කිරීම සඳහා පිරිමි ළමුන්ගේ නේවාසිකාගාර පරිශ්‍රයේ ඇති ආපන ශාලාව නවීන උපකරණ සහිත ව සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලදී. නව ආපනශාලාව සුවිශේෂී ලාභ නොලබන ආකෘතියක් මත, දැඩි සෞඛ්‍ය සම්පන්න තත්ත්වයන් යටතේ සෞඛ්‍යමත් සහ සුවදායක ආහාර දැරිය හැකි මිලකට සිසුන්ට ලබාදීම සඳහා වර්තමානයේ දී කැලණිය වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගේ සංගමය විසින් කළමනාකරණය කරනු ලබයි.

යාබද ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ භාරකරුවන් සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකට අනුව, අක්කර 2කට අධික භූමි ප්‍රමාණයක් සංවර්ධනය කිරීමේ අවස්ථාව පීඨය වෙත සලසා දෙන ලදී. වර්තමානයේ දී මෙම ඉඩම ආපනශාලාවට සපයන එළවළු වගා කිරීමට යොදා ගනී.

SHS සහ OT සිසුන් සඳහා නව ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර, ශිෂ්‍ය ලියාපදිංචිය, විභාග ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් සහ ශිෂ්‍ය ප්‍රතිලේඛන සහ අධ්‍යයන වාර්තා නිකුත් කිරීමට ඉන් හැකි වේ.

විශේෂයෙන් ම, ඉහළ යන සිසුන් සංඛ්‍යාව සහ නව්‍ය ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සඳහා නව ඉගෙනුම් ඉගැන්වීම් අවකාශයන්හි හිඟයක් පවත්නා පසුබිමක, ඉගැන්වීමේ වැඩසටහන් සුමටව පවත්වාගෙන යා හැකි බව සහතික කිරීම සඳහා විද්‍යාගාර / දේශන ශාලා වෙන් කිරීමේ ක්‍රමයට සම්බන්ධ කාල සටහන් ක්‍රමය සංවර්ධනය කෙරෙමින් පවතී.

HDSU රෝග විනිශ්චය විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ එක්ව වෙබ් පාදක කරගත් රෝග විනිශ්චය විද්‍යා වාර්තාකරණ පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර, එය පශ්චාත් උපාධි පුහුණුව සඳහා ප්‍රයෝජනවත් වන බව සනාථ කෙරෙනු ඇති අතර, පර්යේෂණ අරමුණු සඳහා දත්ත ගබඩාවක් ලෙස ඉන් සේවය සැලසෙනු ඇත.

# අපේක්ෂා

මෙම පීඨය අධ්‍යාපනික අරමුණු සඳහා පුද්ගලික අංශය (උදා: නිපුණතා විද්‍යාගාරයට බඳවා ගැනීම) සමඟ සහයෝගීතාව ඉහළ නැංවීමට යෝජනා කරයි. අරමුදල් උත්පාදනය කිරීමේ උත්සාහයක් ලෙස පාසල් හැර යන අයට සහ සම සෞඛ්‍ය සේවකයින්ට මාර්ගගත පාඨමාලා, සහතික සහ ඩිප්ලෝමා වැඩසටහන් පිරිනැමීමට ද මෙම පීඨය බලාපොරොත්තු වේ.

දැනට එළවලු වගාව සඳහා භාවිත කරනු ලබන, ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලබාගෙන ඇති ඉඩම සිසුන්ගේ විනෝදාත්මක ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට පීඨය සැලසුම් කර ඇත.

2023 දී ඇතුළත් කිරීමේ කමිටුවක් පිහිටුවනු ලබන අතර, ගාස්තු අයකිරීමේ පදනම මත විදේශීය සිසුන් ඉහළ සංඛ්‍යාවක් ආකර්ෂණය කරගැනීම එහි එක් ප්‍රධාන අරමුණක් වේ. විදේශීය වෛද්‍ය විද්‍යාල සමඟ සහයෝගීව කටයුතු කිරීමෙන් සිසුන් වැඩි සංඛ්‍යාවක් ආකර්ෂණය කරගැනීම සඳහා තෝරා ගැනීමේ ශිෂ්‍ය වැඩසටහන් තවදුරටත් ප්‍රචලිත කළ හැකි බවට ද අපේක්ෂා කෙරේ.

**මහාචාර්ය ජේ. ඩී. එස්. හේවාවිසේන්ති මිය**
**පීඨාධිපති / වෛද්‍ය පීඨය**



# විද්‍යා
# පීඨය

## මෙහෙවර

“කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ඉදිරි දැක්ම වන්නේ ජාතික සංවර්ධනය සඳහා මෙන්ම පොදු මහජනතාවගේ සුභසාධනය සඳහා වැදගත් දායකත්වයක් සැපයිය හැකි ඉහළ අභිප්‍රේරණයකින් යුත් උපාධිධාරීන් සහ පශ්චාද් උපාධිධාරීන් බිහි කිරීමත්, ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා සංරක්ෂණය පිණිස වඩාත් හොඳ අවබෝධයක් ඇති කිරීමට විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කිරීම හා උපදෙස් දීමත් උපදේශන කටයුතුවල නිරත වීමත් වේ.”

## පීඨය හැඳින්වීම

1967 වසරේ පිහිටුවන ලද විද්‍යා පීඨය, මේ වන විට අධ්‍යයන අංශ 8කින් සමන්විත වේ; ඒවා නම්, රසායන විද්‍යා, කර්මාන්ත පරිපාලන, ගණිත, ක්ෂුද්‍රජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ශාක හා අනුක ජෛව විද්‍යාව, සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව සහ පාරිසරික කළමනාකරණය සහ මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීමේ ඒකකය යන අධ්‍යයන අංශ වන අතර, මෘදුකාංග ඉංජිනේරු විද්‍යා ඉගැන්වීම් ඒකකය සහ ක්‍රීඩා සහ ශාරීරික විද්‍යා ඒකකය එහි ඒකකයන් ද්විත්ත්වය වේ.

විද්‍යා පීඨය වසර තුනක කාලපරිච්ඡේදයක් ඇති විද්‍යාවේදී උපාධි වැඩසටහන් තුනක්, වසර හතරක කාල පරිච්ඡේදයක් ඇති විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන් 19ක් පිරිනමනු ලබයි. (2020/2021) අධ්‍යයන වර්ෂයේ සිට, විද්‍යා පීඨය විසින් ශිෂ්‍ය බඳවා ගැනීම සිසුන් 190ක් දක්වා ඉහළ නංවමින්, පහත දැක්වෙන ගෞරව උපාධි වැඩසටහන් හඳුන්වා දීම මගින්, ගෞරව උපාධි වැඩසටහන් ගණන 19ක් දක්වා සාර්ථකව ඉහළ නංවන ලදී.

1. ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය,
2. ඉලෙක්ට්‍රොනික සහ පරිගණක විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය, සහ
3. ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

තවද, විද්‍යා පීඨය සිය සියලුම උපාධි වැඩසටහන් සඳහා 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් බඳවා ගැනීම 212කින් ඉහළ නංවා ඇති අතර, එමඟින් වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම 957 දක්වා වැඩි විය. එබැවින් 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට ශිෂ්‍ය බඳවා ගැනීම 1,140 දක්වා ඉහළ ගොස් තිබේ.

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ජීව විද්‍යා සහ භෞතික විද්‍යා සඳහා වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම පිළිවෙලින් 221 සහ 362 විය. මෙම පීඨය විසින් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා සිසුන් 119 ක් ද, පරිසර සංරක්ෂණ හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 109 ක් ද, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 63 ක් ද, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 76 ක් ද, විද්‍යුත් හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 80ක් ද, ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 60 ක් ද, ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා සිසුන් 50 ක් ද වෙන් වෙන් වූ කවුළු ඔස්සේ ඇතුළත් කර ගන්නා ලදී. තවද, භෞතික විද්‍යා සහ ජීව විද්‍යා සිසුන්ට වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවලින් අතිරේක පාඨමාලා ඒකක රාශියක් පිරිනමනු ලැබේ.

වර්තමානයේ දී , විද්‍යා පීඨය විද්‍යාපති උපාධි වැඩසටහන් 12 ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් 3 ක් සහ ඩිප්ලෝමා වැඩසටහනක් පවත්වයි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 135 දෙනෙකු, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 1 ක් අයෙකු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 93 දෙනෙකු සමඟින්, මෙම පීඨය දැනට උපාධි අපේක්ෂකයින් 2,694 දෙනෙකු හට සේවය සලසයි. නව දේශන රඟහල් සංකීර්ණයේ ඉදිකිරීම් සිදු වෙමින් පවතින අතර, විද්‍යා පීඨයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් කටයුතු සඳහා තවදුරටත් පහසුකම් සැලසෙනු ඇත.

මෙම පීඨය විසින් මධ්‍යම උපකරණ රසායනාගාරය, මල් වගා පර්යේෂණ මධ්‍යස්ථානය, ජාතික වීදුරු පිඹීමේ මධ්‍යස්ථානය, අළුත්වැඩියා සහ උපකරණ සකස් කිරීමේ ඒකකය, පොල්තෙල් පර්යේෂණ හා උපදේශන මධ්‍යස්ථානය, පර්යේෂණ සහ සේවා මධ්‍යස්ථානය, ආසියානු කුහුඹු පර්යේෂණ කලාපීය මධ්‍යස්ථානය, සූර්ය විසඳුම් මධ්‍යස්ථානය, සහ විශ්වවිද්‍යාල කර්මාන්ත ප්‍රජා අන්තර් ක්‍රියාකාරී සෛලය පරිසර හා සංවර්ධන උපදේශකයින් (EDCON) ඔස්සේ සිසුන්, අධ්‍යයන ප්‍රජාව සහ පොදු ජනතාව වෙත සේවා සලසනු ලබයි.

# 2022 වසරේ සුවිශේෂී අවස්ථා

## ප්‍රදාන

ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන AHEAD මෙහෙයුම් යටතේ 2019 සහ 2020 වර්ෂවල දී විද්‍යා පීඨය රුපියල් මිලියන 360 ක අගයෙන් යුත් පහත දක්වා ඇති බාහිර ප්‍රදානයන් හිමි කර ගෙන ඇති අතර, ඒ ආශ්‍රිත කටයුතු 2021 වර්ෂයේ දී ආරම්භ කර අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී:

1. ***ELTA – ELSE*** **පීඨ යෝජනාව – රු. මිලි.** 100

2. **සංවර්ධනය අභිමුඛ කරගත් පර්යේෂණය – රු. මිලි.** 40

3. ***ELTA –*** **අංශ අනුකූල යෝජනා**

   අ. කර්මාන්ත කළමනාකරණ අංශය - රු. මිලි. 15
   ආ. ශාක හා අණුක ජීව විද්‍යා අංශය - රු. මිලි. 15

4. STEM **ශික්ෂණයෙහි ශිෂ්‍ය බඳවා ගැනීම වැඩිදියුණු කිරීම**

අ. කර්මාන්ත කළමනාකරණ අංශය - රු. මිලි. 50
ආ. රසායන විද්‍යා අංශය - රු. මිලි. 20
ඇ. ගණිත අංශය - රු.මිලි. 20
ඈ. ගණිතය, භෞතින විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ පරිගණක විද්‍යා අංශ - රු. මිලි. 20

5. **පර්යේෂණ නවීකරණය සහ වාණිජකරණය (RIC)**

අ. රසායන විද්‍යා අංශය - රු. මිලි. 40
ආ. භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අංශය - රු. මිලි. 40

# පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම්

විද්‍යා පීඨයට 2022 වර්ෂයේ දී කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමේ පහත පේටන්ට් බලපත්‍ර සහ සහතික ලැබී ඇත:

1. කුරුඳු මත පදනම් වූ ආහාරමය අතිරේක සහ ඒවා සකස් කිරීමේ ක්‍රියාවලිය - පේටන්ට් සංස්ථා ගිවිසුම (PCT) WIPO -අංක WO 2022/079539 A1 යටතේ ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර අයදුම්පත

2. පොල් පෙරීමේ අවශේෂ සාරය (CPRE) භාවිතයෙන් ආහාර නිෂ්පාදනවල රාක්ක ආයු කාලය වැඩිදියුණු කිරීමේ ක්‍රමයක් – පේටන්ට් සංස්ථා ගිවිසුම (PCT) WIPO - අංක WO 2022/180445 A1 2 යටතේ ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර යෙදුම

3. රේඩියෝ සංඛ්‍යාත සන්නිවේදනය භාවිතයෙන් ආමන්ත්‍රණය කළ හැකි දත්ත සන්නිවේදනය සඳහා පද්ධතියක් සහ ක්‍රමවේදයක් - පේටන්ට් සංස්ථා ගිවිසුම (PCT) WIPO - අංකය WO (2022/189847) A1 යටතේ ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර යෙදුම

4. සුපිරි ධාරිත්‍රකය සඳහා ගතික බල කළමනාකරණ තාක්ෂණය - විදුලි කෝෂ දෙමුහුන් ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති, ශ්‍රී ලංකා පේටන්ට් බලපත්‍ර අංක 21483. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, ශ්‍රී ලංකාව

5. පොල් පෙරීමේ අවශේෂ සාරය (CPRE) භාවිත කිරීමෙන් ආහාරයට ගතහැකි තෙල්, මස්, බිත්තර මත පදනම් වූ ආහාර සහ එළවළුවල ආයු කාලය සහ ඔක්සිකාරක ස්ථායිතාවය වැඩි දියුණු කිරීම සහ පළතුරු හෝ එළවළු යුෂවල වර්ණය ආරක්ෂා කිරීම සඳහා වූ ක්‍රමයක්, ශ්‍රී ලංකා පේටන්ට් අංක 21631. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය, ශ්‍රී ලංකාව

6. අන්තර්ජාල සම්බන්ධතාවයක් සහිතව හෝ රහිතව RF රැහැන් රහිත සන්නිවේදනය මත පදනම්ව පිළියම් කළ හැකි දත්ත සන්නිවේදනය, සැකසුම්කරණය, පාලනය සහ දෘශ්‍යකරණය සඳහා වන පද්ධතියක් සහ ක්‍රමයක්, ශ්‍රී ලංකා පේටන්ට් බලපත්‍ර අංක 21656. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, ශ්‍රී ලංකාව

7. සහල් (Oryza sativa) නිවුඩිඩෙඩෙන් ලබාගත් තාප ස්ථායී ෆීනෝලික් ප්‍රතිඔක්සිකාරක යෙදීමෙන් අසංතෘප්ත තෙල්, බිත්තර පදනම් වූ ආහාර සහ බේක් කරන ලද කේක්වල ඔක්සිකාරක සහ ක්ෂුද්‍ර ජීවීමය රාක්ක ආයු කාලය කල් තබා ගැනීමේ ක්‍රමයක්, ශ්‍රී ලංකා පේටන්ට් බලපත්‍ර අංක 21890. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය, ශ්‍රී ලංකාව

8. සුහුරු ද්‍රව පෙට්‍රෝලියම් වායු මට්ටමේ දර්ශකය, ශ්‍රී ලංකා කාර්මික සැලසුම් අංක 13554. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, ශ්‍රී ලංකාව

9. ගෘහස්ත භාවිතය සඳහා ද්‍රව පෙට්‍රෝලියම් වායු නියාමකය හඳිසි වසා දැමීම, ශ්‍රී ලංකා කාර්මික සැලසුම් අංක 13613. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, ශ්‍රී ලංකාව.

විද්‍යා පීඨයේ ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - (ICAPS) 2022, 2022 ඔක්තෝම්බර් 14 වැනි දින දෙමුහුන් ඉසව්වක් ලෙස බහුවිධ පර්යේෂණ සහ විශිෂ්ටත්වය සඳහා නවෝත්පාදනයන් දියුණුදියුණු කිරීම යන තේමාව යටතේ පැවැත්විණි.

කොවිඩ්-19 ගෝලීය වසංගතය විද්‍යා පීඨයට අධ්‍යයන කටයුතු සඳහා භෞතිකව සහභාගී වන සිසුන්ට බාධා ඇති කළේය. කෙසේ වෙතත්, මෙම අභියෝගවලට මුහුණ දෙමින් සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින්, අධ්‍යයන කටයුතු සිදු කරන ලද අතර, 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ සියලුම අවසාන අධ්‍යයන වාර විභාග 2022 ජුනි මාසය වන විට භෞතිකව සම්පූර්ණ කිරීමට සමත් විය. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා I සාමාසිකයෙහි විභාග දැනටමත් ආරම්භ කර ඇති අතර, 2023 මැයි මාසය වන විට අවසන් වසර සිසුන් සඳහා අධ්‍යයන කටයුතු අවසන් කිරීමට සැලසුම් කෙරෙමින් පවතී.

දත්ත විද්‍යාව සහ විශ්ලේෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන, 3 plus 1 විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන්, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (බාහිර) උපාධි වැඩසටහන සහ පරිගණක විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා නුදුරේදී ම හඳුන්වා දීමට ද පීඨය සැලසුම් කර ඇත.

කාර්යමණ්ඩලයේ සහ සිසුන්ගේ කැපවීම සහ වෙහෙසී ක්‍රියා කිරීම හේතුවෙන් කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනයේ විශිෂ්ටතා කේන්ද්‍රස්ථානයක් බවට පත්ව ඇත. විද්‍යා පීඨය චින්තනයේ නිදහස, නවෝත්පාදනය සහ නිර්මාණශීලිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇත. විද්‍යා පීඨයෙන් ජාතියට දායාද වූ උපාධිධාරීන් ගෝලීය වශයෙන් මානව වර්ගයාගේ ප්‍රගතියට සහ යහපැවැත්මට සැලකිය යුතු දායකත්වයක් සපයනු නොඅනුමානය.

මෙම ධාරිතාව සහ මෙහෙවරට අනුකූලව ක්‍රියා කරමින්, ආර්ථිකය මෙහෙයවීමට, සිවිල් සමාජයට සහ රජයට සහාය වීමට සහ මානව වර්ගයාගේ අභිලාෂය උදෙසා අත්‍යවශ්‍ය තීරණ ගැනීමට අවශ්‍ය හැකියාවන්, කුසලතා සහ ආකල්ප සතු විද්වතුන් සහ වෘත්තිකයන් සූදානම් කිරීම සහ බිහි කිරීම සඳහා විද්‍යා පීඨය සිය විශිෂ්ට සේවාවන් ඉටු කරමින් සිටියි.

**ජ්‍යේෂ්ඨ මහාචාර්ය එස්. ආර්. ඩී. කාලිංගමුදලි**
**පීඨාධිපති/ විද්‍යා පීඨය**





# සමාජීය විද්‍යා
## පීඨය

### දැක්ම

"ස්වාධීන චින්තනය, විචක්ෂණ විශ්ලේෂණය, සමාජ වගකීම පිළිබඳ හැඟීම, සංස්කෘතික විවිධත්වය සහ ජනවාර්ගික වටිනාකම් සඳහා ගෞරවය පෝෂණය කරමින් විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ සහ පොදුවේ ආසියානු කලාපයේ සංවර්ධනය සඳහා කැපවීම ඇතිව අන්තර් විෂය සහයෝගීතාව හරහා විශිෂ්ටත්වය පවත්වා ගැනීම."

### මෙහෙවර

"ශික්ෂණය, පර්යේෂණය, නවෝත්පාදනය සහ බුද්ධිමය නායකත්වය හරහා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ අධ්‍යාපනික සංවර්ධනය උසස් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."

## දළ විශ්ලේෂණය

සමාජ විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ පැරණිතම සහ විශාලතම පීඨය වේ. 1981/82 අධ්‍යයන වර්ෂයේ දී එය වෙනම පීඨයක් ලෙස ආරම්භ කළ ද, පීඨයේ ඉතිහාසය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ආරම්භය දක්වා දිව යයි. කැලණිය විශ්වවිද්‍යාලයේ පූර්වගාමියා වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, ශාස්ත්‍ර පීඨයක් ඇතුළු පීඨ කිහිපයකින් සමන්විත වූ අතර, එය සමාජ විද්‍යා පීඨය සහ මානව ශාස්ත්‍ර පීඨය ලෙස දෙකට බෙදී තිබුණි. ඔවුන්ගේ පොදු සම්භවය හේතුවෙන්, පීඨ දෙක තවමත් සමීප සබඳතාවක් පවත්වාගෙන යයි.

අධ්‍යයන අංශයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලය විද්වතුන්ගේ සහ වෘත්තිකයන්ගේ කදිම සම්මිශ්‍රණයක් නියෝජනය කරයි. ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, දර්ශනය, ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව යන සාම්ප්‍රදායික විෂයයන් පීඨයේ අධ්‍යයන අන්තර්ගතය ශක්තිමත් කරන අතර ම, ජන සන්නිවේදනය, ජාත්‍යන්තර අධ්‍යයනය, පුස්තකාල සහ තොරතුරු විද්‍යාව, සමාජ සංඛ්‍යාලේඛන, ක්‍රීඩා විද්‍යාව සහ ශාරීරික අධ්‍යාපනය වැනි අනෙකුත් අංශ වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිකයන්ට ඔවුන්ගේ දොරටු විවෘත කර ඇතු. කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ජනසන්නිවේදන අධ්‍යයන අංශයක් සහ ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශයක් පිහිටු වූ ප්‍රථම පීඨය හා ස්ථානය විය.

මෙම පීඨය පහත දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත ය.

1. පුරාවිද්‍යා අධ්‍යයන අංශය
2. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය
3. ඉතිහාසය අධ්‍යයන අංශය
4. ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයන අංශ
5. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය
6. දර්ශන අධ්‍යයන අංශය
7. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය
8. සමාජවිද්‍යා අධ්‍යයන අංශය
9. සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය
10. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය
11. භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය
12. ජන සන්නිවේදන අධ්‍යයන අංශය
13. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය

පීඨය විෂය ක්ෂේත්‍ර 18ක් ඔස්සේ ශාස්ත්‍රවේදී උපාධි පිරිනමනු ලැබේ. ශිෂ්‍යයින්ට සිය අධ්‍යාපන විශිෂ්ටතා මත පදනම්ව සාමාන්‍ය උපාධියක් හෝ විශේෂිත විෂය ධාරාවක් තුළ විශේෂවේදී උපාධියක් හැදෑරිය හැකිය. එමෙන්ම, පීඨය කලා විෂයන් සම්බන්ධයෙන් එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි සහ සමාජ විද්‍යා පිළිබඳ වසර දෙකක ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කිරීම පිණිස පශ්චාද් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි. තවද, පර්යේෂකයන්ට සහ අධ්‍යාපනඥයන්ට සිය දර්ශනපති සහ දර්ශනශූරී උපාධි සඳහා ලියාපදිංචි වීමට ද හැකියාව ඇත.

# පීඨය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමා

මෙම පීඨය විසින් ගාස්තු අයකිරීමේ පදනම මත (අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා නොමිලේ පිරිනැමෙන තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව හැර), පහත සඳහන් ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරනු ලබයි.

1. GIS පිළිබඳ ඩිප්ලෝමාව
2. ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
3. ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාව
4. ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව

5. ජන සන්නිවේදනය (MACO) පිළිබඳ ඩිප්ලෝමාව

6. මහජන සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව

7. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව

8. තොරතුරු කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

9. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව

10. බන්ධනාගාර නිලධාරීන් සඳහා නිදොස් කිරීම හා පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමාව (DCRP)

11. මහජන සබඳතා පිළිබඳ උසස් ඩිප්ලෝමාව

12. ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව

13. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (අභ්‍යන්තර විද්‍යාර්ථීන් සඳහා)

# පීඨය මගින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන්

සමාජ විද්‍යා පීඨය විසින් පශ්චාද් උපාධි වැඩසටහන ඔස්සේ පහත දක්වා ඇති එක් අවුරුදු සහ දෑ අවුරුදු වැඩසටහන් පිරිනමනු ලබයි:

1. පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

2. ආර්ථික විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

3. ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

4. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

5. ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

6. දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

7. දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

8. සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

9. භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ සමාජ විද්‍යාපති උපාධිය

# 2022 වසරේ සුවිශේෂී අවස්ථා

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දුන් නමුත්, 2022 අගෝස්තු මාසයේ දී සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා ස්ථානීය දේශන පැවැත්වීමේ සාම්ප්‍රදායික ක්‍රමයට ආපසු යාමට සමාජ විද්‍යා පීඨයට හැකි විය.

2022 වර්ෂයේ දී සමාජ විද්‍යා පීඨය යටතේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී. සමාජ විද්‍යා පීඨය යටතේ නව දෙපාර්තමේන්තුව ආරම්භ කළ ද, එය සමාජ විද්‍යා පීඨයේ සහ මානව ශාස්ත්‍ර පීඨයේ යන දෙකෙහිම සිසුන්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව පවත්වා ගෙන යයි. නව තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන කලා උපාධිධාරීන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා ලබා දීම සහ ඔවුන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා විය.

තවද, 2022 වසරේ දී පහත කටයුතු සාර්ථකව පවත්වනු ලැබිණි,

- විභාග ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තරුණ හා මුල් වෘත්තීය අධ්‍යාපනඥයින් දැනුවත් කිරීම සඳහා පීඨ තත්ත්ව සහතිකකරණ කමිටුව විසින් වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදී

- ජනසන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 'මැදිහත් යථාර්ථය: අභියෝග සහ අවස්ථා' යන මැයෙන් (ACMC) 2022 ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදී.

- දැනට පවතින උපාධි පාඨමාලා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සංශෝධනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

- ඉතිහාස අධ්‍යයනාංශයට අනුයුක්ත ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වලාභියෙකු විසින් පීඨයේ තරුණ හා මුල් කාලීන වෘත්තීය අධ්‍යාපනඥයින් සඳහා (RCSS) විසින් සංවිධානය කරන ලද වැඩමුළුවක දී දේශනයක් පවත්වන ලදී.

- RCSS විසින් සංවිධානය කරන ලද වැඩමුළුවක දී ඉන්දියාවේ සිට පැමිණි බාහිර මහාචාර්යවරයෙකු දේශනයක් පැවැත්වීය.

# අනාගත අපේක්ෂාවන්

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) ඉලක්ක කරගනිමින් පර්යේෂණ සිදුකිරීමට සහ 2023 වර්ෂයේ දී පිළිගත් අධ්‍යයන සඟරාවල පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත්කිරීම සඳහා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය උනන්දු කිරීමට සමාජ විද්‍යා පීඨය අපේක්ෂා කරයි.

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
**පීඨාධිපති / සමාජ විද්‍යා පීඨය**











# පුස්තකාලය

ගෝලීය කොවිඩ් වසංගතය හේතුවෙන් පුස්තකාලය එහි පරිශ්‍රය වසා දැමූ විට, එය ප්‍රථමයෙන් අවධානය යොමු කළේ සිසුන්ට අධ්‍යයන වාරයේ පැවරුම් සහ විභාග සඳහා සහය වන අතර ම, පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සඳහා තොරතුරු සහාය ලබා දීම කෙරෙහි ය. මේ අනුව, පුස්තකාලයේ මෙහෙවර වූයේ ප්‍රවේශය වැඩි කිරීම සහ වැඩිදියුණු කිරීම වන අතර, මෙම මෙහෙයුම 2022 වසර තුළ අඛණ්ඩව සිදු කරන ලදී. පැවරුම් සහ විවෘත පොත් විභාග සඳහා අවශ්‍ය පෙළපොත් හඳුනා ගැනීමට පුස්තකාලය අධ්‍යයන අංශ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ සමීපව කටයුතු කළේය. මෙම කාලපරිච්ඡේදය තුළ නිත්‍ය කියවීම් ලැයිස්තු සංඛ්‍යාවෙහි 22% ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, මෙම නව ඉල්ලුම සපුරාලීම සඳහා පුස්තකාලය වෙනස් කර එහි ක්‍රියාවලීන් වේගවත් කරන ලදී. වඩාත් නිර්දේශිත කියවීම් ද්‍රව්‍ය මාර්ගගතව ලබා ගැනීමට හැකි වන සේ, පුස්තකාලය එහි භාවිත දත්ත විශ්ලේෂණාත්මකව භාවිත කරන ලද මාතෘකා සොයා බලා, අත්‍යවශ්‍ය පරිච්ඡේද මුද්‍රණයෙන් පමණක් ඉලෙක්ට්‍රොනික ආකෘතියට පරිවර්තනය කිරීමට සක්‍රීයව උත්සාහ කළේ ප්‍රකාශන හිමිකම් ආරක්ෂාවට සහ පවතින මාර්ගගතසබැඳි ප්‍රවේශය වැඩිදියුණු කිරීමට ය. පුස්තකාලය අවශ්‍ය නව ද්‍රව්‍ය සැපයීම සඳහා දැනට සිටින සහ නව සැපයුම්කරුවන් සමඟ සමීපව කටයුතු කළේය. මෙම කාලය තුළ පුස්තකාලය සඳහා රුපියල් 4,358,476.38 ක මුදලකට මුද්‍රිත පොත් 873 ක් සහ විද්‍යුත් පොත් 18 ක් ලබා ගන්නා ලදී. විද්‍යුත් තැපැල් පණිවුඩ, වෙබ් අඩවිය සහ වෙබ් කතාබස් හරහා මාර්ගගත විමසීම් සතියකට දින හත පුරා බාධාවකින් තොරව සිදු විය. 2022 වර්ෂයේ දී, වෙබ් කතාබස් (Chat) වඩාත් ජනප්‍රිය වූ බව නිරීක්ෂණය වූ අතර, බොහෝ දෙනෙකුට අන්තර්ජාලය හරහා අවශ්‍ය විද්වත් සහ පෙළ පදනම් වූ තොරතුරු සැපයීමට පුස්තකාලයට හැකි විය. 2022 දී පවා, පුස්තකාලයේ මූලික අවධානය යොමු වූයේ විභාග සඳහා පෙනී සිටින අවසාන වසරේ සහ ශාස්ත්‍රපති සිසුන්ට ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධන සහ ශාස්ත්‍රීය නිබන්ධන සම්පූර්ණ කිරීමට සහාය වීමයි.

පුස්තකාලය සිය පර්යේෂණ උපකාරක සේවා ඔප්නැංවීම කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, 2022 දී විවෘත ප්‍රවේශය සඳහා එහි කැපවීම යළි තහවුරු කළේය. එය ක්‍රමානුකූල සෙවුම් සහාය සඳහා වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි පුස්තකාලය තුළ සහ ඉන් පිටත සහයෝගී ප්‍රවේශයක් අනුගමනය කළේය. පුස්තකාලයේ විෂය සම්බන්ධකාරක කණ්ඩායම සිසුන්, අධ්‍යයන කාර්යමණ්ඩලය සහ පර්යේෂකයන් සඳහා බොහෝ පුහුණු සැසි හඳුන්වා දීමට එක්ව කටයුතු කළහ. උපකුලපති සම්මාන, මහාචාර්ය පත්වීම් අයදුම්පත්, සනාතන සම්මාන සහ CVCD සම්මාන සඳහා විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල ප්‍රකාශන සමාලෝචනය කිරීමට පුස්තකාලය දායක විය. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ප්‍රකාශනවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රකාශනවල ගුණාත්මකභාවය යෝග්‍ය ලෙස ග්‍රහණය කර ගැනීම මෙම විශේෂඥ උපදෙස් මඟින් සහතික කරනු ඇත.

විශ්වවිද්‍යාලයේ පළමු ආයතනික විද්‍යුත් ගබඩාව 2014 හි ක්‍රියාත්මක වූ දින සිට, පුස්තකාලය විවෘත ප්‍රවේශය සඳහා ඉමහත් කාර්යභාරයක් ඉටු කර ඇත. පසුගිය වසරේ ආයතනික විද්‍යුත් ගබඩාවට එකතු කිරීම්, ශාස්ත්‍රීය නිබන්ධන සහ පර්යේෂණ නිබන්ධන 42 ක් ඇතුළුව, පර්යේෂණ නිමැවුම් 495 කින් සමන්විත විය. CEPPS/NDI විසින් පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය හා එක්ව, කොළඹ පදනම් කරගත් සියලුම විශ්වවිද්‍යාල පර්යේෂණ ගබඩාවන් සම්බන්ධ කරමින් මධ්‍යම පර්යේෂණ ගබඩාවක් සංවර්ධනය කිරීමට කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලය සමඟ සම්බන්ධ විය.

KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමත් සමඟ පුස්තකාලයට පරිශීලකයින් ඇතුළුවීම සහ පිටවීම නිරීක්ෂණය කිරීම සඳහා ඇතුළත/පිටත පද්ධතිය ස්ථාපනය කිරීම මගින් පුස්තකාලය සිය සේවාවන් පුළුල් කරන ලදී. පොතක් බැහැර ගෙන ගිය විට හෝ ආපසු ලබා දෙන විට පරිශීලකයින්ට ස්වයංක්‍රීයව විද්‍යුත් තැපැල් පණිවුඩයක් යවන නව පද්ධතියක් ද පුස්තකාලය විසින් හඳුන්වා දෙන ලදී. දෛනික, සතිපතා සහ මාසික පදනමින් පුස්තකාලය භාවිතා කළ පරිශීලකයින්ගේ සංඛ්‍යාලේඛන ලබා ගැනීමට පද්ධතියට හැකි වී තිබේ. මෙය පරිශීලකයින් පුස්තකාලයේ සිදු කරන දේ ග්‍රහණය කර ගැනීමට රැස් කරන ලද දත්තවලට අමතරව වේ.

2022 වසර සඳහා පුස්තකාල භාවිතය පිළිබඳව සංඛ්‍යාලේඛන පහත ලැයිස්තුගත කර ඇත.

වගුව 39 : පුස්තකාල භාවිතයෙහි සංඛ්‍යාලේඛන

| අංශය/ සේවාව | සංඛ්‍යාලේඛන |
|---|---|
| පුස්තකාලය භාවිත කළ සාමාජිකයන් පුස්තකාලය වෙත පැමිණි වාර ගණන | 93,569 |
| ආපසු භාර දුන් පොත් ගණන | 32,473 |
| බැහැර ගෙන ගිය පොත් ගණන | 29,982 |
| විමර්ශන අංශය භාවිත කළ සාමාජිකයන් පැමිණි වාර ගණන | 67,397 |
| ස්ථිර විමර්ශන අංශය භාවිත කළ සාමාජිකයන් පැමිණි වාර ගණන | 4,525 |
| වාර සඟරා අංශය භාවිත කළ සාමාජිකයන් පැමිණි වාර ගණන | 3,624 |
| පොදු තොරතුරු භාවිත කළ සාමාජිකයන් පැමිණි වාර ගණන | 53,988 |
| ලංකා කුටීරය භාවිත කළ සාමාජිකයන් පැමිණි වාර ගණන | 5,137 |

තාක්ෂණික සේවා අංශයෙහි පොත් 1,433 ක් සකස් කරන ලද අතර, අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශන සහ විශ්වවිද්‍යාලය විසින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන සඳහා ISBN 12 ක් සහ ISSN 16 ක් නිකුත් කරන ලදී.

2022 කාලය තුළ, විෂය සම්බන්ධ පුස්තකාලයාධිපති සේවය SLLS පුස්තකාල පරිශීලකයන්ට පීඨ මට්ටමින් පුස්තකාලයේ විෂය සම්බන්ධක පුස්තකාලයාධිපතිවරුන් හරහා නොයෙක් ආකාරවලින් උපකාර කර ඇත. SLLS විසින් පිරිනමනු ලබන සේවාවන් පරිශීලක විමසුම්වලට පිළිතුරු සැපයීමේ සිට විශ්වවිද්‍යාල සිසුන්, අධ්‍යයන කාර්යමණ්ඩලය සහ පර්යේෂකයන් සඳහා තොරතුරු ලබා ගැනීම, භාවිතා කිරීම සහ උපයෝජනයඋපයෝජනය කිරීම පිළිබඳ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා වැඩමුළු සහ මාර්ගගත සම්මන්ත්‍රණ පැවැත්වීම දක්වා විහිදෙයි. 2022 වසර තුළ, විෂය සම්බන්ධ පුස්තකාලයාධිපතිවරුන් තනි පුද්ගල සම්බන්ධතාවලට අමතරව, විද්‍යුත් තැපෑල, දුරකථන සහ කතාබස් පද්ධති හරහා විෂය පදනම් කරගත් පරිශීලක විමසීම් 384කට ප්‍රතිචාර දැක්වීය. පරිශීලකයන්ගේ ඉල්ලීම පරිදි SLLS විසින් ලේඛන

සැපයුම් සේවාව DSS ඔස්සේ ලිපි සහ පොත් පරිච්ඡේද 187ක් සපයා ඇත. ඔවුන් තොරතුරු සාක්ෂරතාව, උපුටා දැක්වීමේ සම්ප්‍රදායයන් සහ විවිධ පරිශීලක කණ්ඩායම් සඳහා සෙවීමේ දත්ත සමුදායන් වැනි විවිධ ක්ෂේත්‍ර පිළිබඳව භෞතික හෝ මාර්ගගතව දේශන ස්වරූපයෙන් වැඩමුළු 47 ක් පවත්වා ඇත. මීට අමතරව, ග්‍රන්ථ සහ ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශනය කිරීම, පර්යේෂකයන්ගේ ඩිජිටල් පර්යේෂණ පැතිකඩ නිර්මාණය කිරීම යනාදී විවිධ මාතෘකා යටතේ පොදු වෙබ් අඩවි 06ක් SLLS විසින් සංවිධානය කරන ලදී. තවද, විෂය සම්බන්ධ පුස්තකාලයාධිපතිවරුන් සාහිත්‍ය චෞරත්ව පරීක්ෂාව, URKUND සහ Grammarly ගිණුම් නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම, නව බඳවා ගැනීමෙහි (ගැනීම්) උපාධි අපේක්ෂක සිසුන් සඳහා මඟපෙන්වනු ලබන භෞතික පුස්තකාල චාරිකා පැවැත්වීම යනාදිය වැනි තවත් බොහෝ අධ්‍යයන කටයුතු සඳහා සම්බන්ධ වී ඇත.

මෙම වසර තුළ පුස්තකාලය රුපියල් 5,583,133.60ක් වැය කරමින් EBSCO Host JSTOR සහ Research4Life දත්ත සමුදායන් වෙත දායක වූ අතර, Shibboleth ප්‍රවේශ ද්වාරය හරහා සියලුම පරිශීලකයින්ට දුරස්ථ ප්‍රවේශ පහසුකම ලබා දෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභා එකමුතුව යටතේ එමරල්ඩ්, ටේලර් සහ ෆ්‍රැන්සිස් සහ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය යන දත්ත සමුදායන් තුන වෙත ප්‍රවේශය ද පුස්තකාලයට ලබා දී ඇත. පුස්තකාලය දේශීය සඟරා හයක් මිල දී ගෙන ඇත; 2022 දී සඟරාවල මුළු පරිත්‍යාග සංඛ්‍යාව 400 කට අධිකවඩා වැඩි විය.

විශ්ව විද්‍යාලය විසින් ප්‍රකට ව්‍යාකරණ සහ වාක්‍ය-පරීක්ෂා කිරීමේ මාර්ගගත මෙවලමක් වන Grammarly (වාරික සහිත) එහි සිසුන්ට සහ පර්යේෂකයන්ට දෝෂවලින් තොර පර්යේෂණ නිබන්ධන, ශාස්ත්‍රීය නිබන්ධන සහ පර්යේෂණ වාර්තා සකස් කිරීම සඳහා මිල දී ගන්නා ලදී. එය සාහිත්‍ය චෞරත්වය හඳුනා ගැනීම, අක්ෂර වින්‍යාසය පරීක්ෂා කිරීම, පෙළ සංස්කරණය කිරීම යනාදිය සඳහා සහ වඩාත් නිවැරදිව වාර්තා කෙටුම්පත් කිරීමට ද භාවිතා කළ හැකිය. 2022 වසරේ දී, පුස්තකාලය විසින් අධ්‍යයන කාර්යමණ්ඩලය 512, අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය 20, පරිපාලන කාර්යමණ්ඩලය 14, අනධ්‍යයන කාර්ය මණ්ඩලය 41, පශ්චාත් උපාධි සිසුන් 100 සහ විශ්වවිද්‍යාලයේ අවසාන වසරේ ගෞරව උපාධි අපේක්ෂක සිසුන් 656 සඳහා පරිශීලක ගිණුම් 1,343 ක් නිර්මාණය කරන ලදී.



2022 දී පුස්තකාලයේ ශ්‍රව්‍යග්‍රන්ථ Audiobook ව්‍යාපෘතිය පුස්තකාලයේ සම්පත් සියලුම සිසුන්ට, විශේෂයෙන් දෘශ්‍යාබාධිත අයට වඩාත් ප්‍රවේශ වීමට හැකියාව ලැබෙන පරිදි මුලපිරීමක් විය. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ශ්‍රව්‍ය ආකෘතියෙන් පොත් 25 ක් උඩුගත කරන ලද අතර, සිසුන්ට ඒවාට සවන් දීමට සහ ඒවායෙන් ඉගෙන ගැනීමට පහසු විය. මීට අමතරව, පුස්තකාලය විශේෂයෙන් අන්ධ සිසුන් සඳහා විෂය නිර්දේශිත කියවීම් 12ක් උඩුගත කරන ලදී. පුස්තකාලය සියලුම සිසුන්ට ඔවුන්ගේ හැකියාවන් නොසලකා සමාන අවස්ථාවල වැදගත්කම හඳුනා ගනිමින් මෙම ව්‍යාපෘතිය සංවර්ධනය කළේය. මේ සියලුදෙනා හට සමානව සැලකීම සහ ඔවුන්ගේ ප්‍රවර්ධනය කිරීම සහ දෘශ්‍යාබාධිත සිසුන්ට ඔවුන්ගේ සම වයසේ මිතුරන්ට මෙන් අධ්‍යාපනික ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය විය. අන්ධ සිසුන් සඳහා ශ්‍රව්‍ය ග්‍රන්ථ සහ නිර්දේශිත කියවීම් පිරිනැමීම, එය සියලුම සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වයට සහාය වීම සහ වඩාත් අන්තර්ගතභාවීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරයි. මෙම ව්‍යාපෘතිය පුස්තකාලයේ සම්පත්වල ප්‍රවේශ්‍යතාව සහ උපයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා උපකාරක ඉගෙනුම් තාක්ෂණය භාවිතා කරමින් එහි වරප්‍රසාද නොලත් සිසුන්ට සේවය කිරීමට ඇති කැපවීම පිළිබඳ නිදසුනකි.

පුස්තකාලය විසින් පුස්තකාලයේ කාර්යමණ්ඩලයේ දෛනික කාර්ය ප්‍රවාහය විධිමත් කිරීමට සහ කළමනාකරණය කිරීමට භාවිතා කරන ප්‍රබල මෙවලමක් වන සේවක කාර්ය කළමනාකරණ පද්ධතිය ETMS හඳුන්වා දෙන ලදී. සේවකයින්ට එදිනෙදා කාර්යයන් පටිගත කිරීමට සහ කළමනාකරණය කිරීමට හැකි මධ්‍යගත ස්ථානයක් ලබා දීමෙන් ඵලදායිතාව ඉහළ නැංවීමට මෙම පද්ධතිය සැලසුම් කර ඇත. පුස්තකාල කළමනාකාරිත්වයට සෑම කෙනෙකුම ඔවුන්ගේ වගකීම් දැනගෙන පොදු ඉලක්කයක් කරා වැඩ කරන බව සහතික කිරීමට පුස්තකාල පරිවෘත්තිකයන් සහ සහායක කණ්ඩායම සඳහා කාර්යයන් නිර්මාණය කළ හැකිය. සියලු කටයුතු කඩිනමින් සහ කාර්යක්ෂමව සිදු කෙරෙන බව සහතික කිරීමටත්, ඕනෑම



ගැටලුවක් හෝ උත්සුකතාවක් ඉක්මනින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීමටත් මෙය උපකාරී වේ. පුස්තකාල කාර්යමණ්ඩලයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ETMS ඉතා ඵලදායී බව ඔප්පු වී ඇත. දෛනික කාර්යයන් සඳහා පැහැදිලි ව්‍යුහයක් සහ රාමුවක් සැපයීමෙන් සේවකයින්ට වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව කාර්යයන් ඉටු කළ හැකි අතර, අවසානයේ දී පුස්තකාලයේ සාර්ථකත්වයට එය දායක වේ.

පුස්තකාලයේ ගොනු කළමනාකරණ පද්ධතිය FMS යනු කඩදාසි භාවිතය අවම කිරීම සහ හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා සංවර්ධනය කරන ලද විප්ලවීය මෙවලමකි. මෙය වලාකුළු මත පදනම් වූ වේදිකාවක් තුළ ලේඛන උඩුගත කිරීමට සහ කළමනාකරණය කිරීමට පරිවෘත්තික සේවකයන්ට සහ පුස්තකාල කළමනාකරණයට ඉඩ සලසයි. මෙම පද්ධතිය කාර්යමණ්ඩල මාරුව තුළ අත්‍යවශ්‍යව ලේඛන අහිමි වීම වළක්වා ගැනීමට උපකාරී වන බැවින්, පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා ඉතා ඵලදායී වේ. මීට අමතරව, FMS මඟින් කාර්යමණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ ජංගම උපාංග භාවිතයෙන් ඕනෑම තැනක සිට ඔවුන්ගේ ලේඛන වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන අතර, එමඟින් ඔවුන්ට දුරස්ථව හෝ සේවා ස්ථානයේ දී ම කාර්යයන් කිරීමට පහසු වේ. මෙම පද්ධතිය පුස්තකාලයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කර ඇති අතර, කාර්යමණ්ඩලයට ලේඛන ඉක්මනින් බෙදා ගැනීමට සහ තනි ස්ථානයක සිට ලේඛන වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. තවද, හරිත සංකල්පය සහ තිරසර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනයේ කැපවීම සමඟ සමපාත වෙමින්, කඩදාසි භාවිතය අවම කිරීම පුස්තකාලය වඩාත් පරිසර හිතකාමී බවට පත් කර ඇත.

පුස්තකාලය විසින් සංවර්ධනය කරන ලද " ජංගම යෙදවුම (Mobile App)" යනු සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා පුස්තකාලය වෙත පිවිසීමට ඇති හැකියාව සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රබල මෙවලමකි. "The Library UOK" සෙවීමෙන් සොයා ගත හැකි මෙම යෙදවුම Google Play මාර්ගගත අලෙවිසැල් යෙදවුමෙන් බාගත කළ හැකි අතර, 2022 අවසන් වන විට පුස්තකාලය විසින් සංවර්ධනය කරන ලද " ජංගම යෙදවුම (Mobile App)" යනු සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා පුස්තකාලය වෙත පිවිසීමට ඇති හැකියාව සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රබල මෙවලමකි. "The Library UOK" සෙවීමෙන් සොයා ගත හැකි මෙම යෙදවුම ඨදදටකැ ඡක්හ මාර්ගගත අලෙවිසැල් යෙදවුමෙන් බාගත කළ හැකි අතර, දැනටමත් 2022 වසර අවසන් වන විට 5,160 පරිශීලකයින් සංඛ්‍යාවක් රැස් කරගෙන ඇත. මෙම යෙදවුම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයක් විසින් සංවර්ධනය කරන ලද පළමු ජංගම යෙදවුම වන අතර, දැනට මෙරටෙහි භාවිත කරන එකම පුස්තකාල ජංගම යෙදුම වේ. එය පුස්තකාලයේ සම්පත් වෙත අන්තර්ජාලය හරහා පිවිසීමට බලාපොරොත්තු වන ඕනෑම කෙනෙකුට අත්‍යවශ්‍ය සම්පතක් බවට පත් කරන විශේෂාංග රාශියක් පිරිනමනු ලබයි. මෙම යෙදුම පරිශීලකයින්ට ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ පද්ධතියට (KOHA) ඇතුළු වී, ඔවුන්ගේ ගිණුම් වෙත ප්‍රවේශ වීමට, ඔවුන්ට පොත් සෙවීමට

සහ වෙන්කරවා ගැනීමට, ඔවුන්ගේ  පොත් බැහැර ගෙන යෑමේ ඉතිහාසය බැලීමට, දඩ මුදල්, සහ ඔවුන්ගේ පොත් වෙන් කිරීම්වල තත්ත්වය පරීක්ෂා කිරීමේ හැකියාව ලබා දෙයි. විද්‍යුත් ග්‍රන්ථ ගබඩාව E-Repository සහ පොත් සෙවුම් ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු යාවත්කාලීන කිරීම් සිදු කිරීමත් සමඟ යෙදවුමේ ක්‍රියාකාරිත්වය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වී ඇති අතර, එය දැන් පෙරට වඩා තෙගුණයකින් වේගවත් ය. පරිශීලකයින්ට දැන් එක් ක්ලික් කිරීමකින් මිලට ගත් දත්ත සමුදායන්, පුස්තකාලය විසින් සංවර්ධනය කරන ලද " ජංගම යෙදවුම (Mobile App)" යනු සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා පුස්තකාලය වෙත පිවිසීමට ඇති හැකියාව සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රබල මෙවලමකි. "The Library UOK"  සෙවීමෙන් සොයා ගත හැකි මෙම යෙදවුම ඨදදටකැ ඡක්හ මාර්ගගත අලෙවිසැල් යෙදවුමෙන් බාගත කළ හැකි අතර, 2022 අවසන් වන විට පුස්තකාලය විසින් සංවර්ධනය කරන ලද " ජංගම යෙදවුම (Mobile App)" යනු සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා පුස්තකාලය වෙත පිවිසීමට ඇති හැකියාව සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රබල මෙවලමකි. "The Library UOK"  සෙවීමෙන් සොයා ගත හැකි මෙම යෙදවුම Google Play මාර්ගගත අලෙවිසැල් යෙදවුමෙන් බාගත කළ හැකි අතර, දැනටමත් 2022 වසර අවසන් වන විට 5,160 පරිශීලකයින් සංඛ්‍යාවක් රැස් කරගෙන ඇත. මෙම යෙදවුම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයක් විසින් සංවර්ධනය කරන ලද පළමු ජංගම යෙදවුම වන අතර, දැනට මෙරටෙහි භාවිත කරන එකම පුස්තකාල ජංගම යෙදුම වේ. එය පුස්තකාලයේ සම්පත් වෙත අන්තර්ජාලය හරහා පිවිසීමට බලාපොරොත්තු වන ඕනෑම කෙනෙකුට අත්‍යවශ්‍ය සම්පතක් බවට පත් කරන විශේෂාංග රාශියක් පිරිනමනු ලබයි. මෙම යෙදුම පරිශීලකයින්ට ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ පද්ධතියට (KOHA) ඇතුළු වී, ඔවුන්ගේ ගිණුම් වෙත ප්‍රවේශ වීමට, ඔවුන්ට පොත් සෙවීමට සහ වෙන්කරවා ගැනීමට, ඔවුන්ගේ  පොත් බැහැර ගෙන යෑමේ ඉතිහාසය බැලීමට, දඩ මුදල්, සහ ඔවුන්ගේ පොත් වෙන් කිරීම්වල තත්ත්වය පරීක්ෂා කිරීමේ හැකියාව ලබා දෙයි. විද්‍යුත් ග්‍රන්ථ ගබඩාව (E-Repository) සහ පොත් සෙවුම් ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු යාවත්කාලීන කිරීම් සිදු කිරීමත් සමඟ යෙදවුමේ ක්‍රියාකාරිත්වය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වී ඇති අතර, එය දැන් පෙරට වඩා තෙගුණයකින් වේගවත් ය.  පරිශීලකයින්ට දැන් එක් ක්ලික් කිරීමකින් මිලට ගත් දත්ත සමුදායන්, විද්‍යුත් පොත් සහ විද්‍යුත් සඟරා වෙත ප්‍රවේශ විය හැකිය. මෙම යෙදවුමට පරිශීලකයින්ට සියලු තොරතුරු සම්පත් වෙත දුරස්ථව ප්‍රවේශ විය හැකි බව සහතික කරන, මෙහි සම්පත් වෙත Shibboleth පහසුකම ද ඇත.

වෛද්‍ය පීඨ පුස්තකාලය සම්බන්ධයෙන් ගත් කල, 2020 සහ 2021 ට සාපේක්ෂව 2022 දී භාවිතය සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. පුස්තකාලයට පැමිණි මුළු සංඛ්‍යාව 7,236 ක් වූ අතර එය 2021 ට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමකි, එය 1,076 කි. සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පොත්වල සම්පූර්ණ චෙක්අවුට් 2,139 ක් වූ අතර, සම්පූර්ණ චෙක්පත් 2,869 ක් විය. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ව්‍යාපෘතිය හරහා දිගුකාලීන ණය මත සිසුන්ට පොත් 153ක් නිකුත් කරන ලදී. වෛද්‍ය පීඨ පුස්තකාලය සම්බන්ධයෙන් ගත් කල, 2020 සහ 2021 ට සාපේක්ෂව 2022 දී භාවිතය සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. පුස්තකාලයට පැමිණි මුළු වාර ගණන 7,236 ක් වූ අතර, එය 2021 වසරේ වාර්තා වූ 1,076ට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමකි. සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පොත් නිකුත් කිරීමේ මුළු ගණන 2,139 ක් වූ අතර, පොත් යළි භාරදීම්වල මුළු ගණන 2,869 ක් විය.  ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ව්‍යාපෘතිය හරහා දිගුකාලීන ණය මත සිසුන්ට පොත් 153ක් නිකුත් කරන ලදී. විද්‍යුත් ග්‍රන්ථ ගබඩාව (E-repository) සහ පසුගිය අධ්‍යයන වාරවල ප්‍රශ්න පත්‍ර ගබඩාව වෙත දත්ත එකතු කිරීම 2022 වසරේ දී අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රශ්න පත්‍ර 118ක් උඩුගත කරන ලද අතර, සඟරා ලිපි, පර්යේෂණ සමුළු සාරසංක්ෂේප සහ නිබන්ධන 336ක් විශ්වවිද්‍යාල විද්‍යුත් ග්‍රන්ථ ගබඩාවට එක් කරන ලදී. පුස්තකාලය අන්තර් පුස්තකාල ණය සේවාව හරහා ලේඛන ඉල්ලීම් 105ක් ද ඉටු කර ඇත.

2022 දී පුස්තකාලය පොත් 128 ක් ලබාගෙන සකස් කරන ලද අතර, ඉන් පොත් 64 ක් පරිත්‍යාග ලෙස ලැබිණි. වෛද්‍ය පීඨ පුස්තකාලය ශිෂ්‍ය පෙළපොත් 74 ක් සහ විද්‍යුත් පෙළපොත් 7 ක් මිලදී ගැනීමට පොත් ඇණවුම් කළේය. විද්‍යුත් පෙළපොත් එකතුව 46 දක්වා ඉහළ ගිය අතර, 2022 දී මෙම එකතුවට විද්‍යුත් පොත් හතක් එක් විය.

2022 දී, පුස්තකාලය පළමු වෘත්තීය චිකිත්සක කණ්ඩායම ඇතුළුව, පළමු වසරේ සියලුම සිසුන්ට පුස්තකාල සේවා හඳුන්වා දීම සඳහා සඳහා නවක නම්නීකරණ වැඩසටහන්  11 ක් පවත්වන ලදී. වෛද්‍ය පුස්තකාලය විසින් පළමු වසරේ විද්‍යාර්ථීන් සඳහා විද්‍යුත් සම්පත් භාවිතය සම්බන්ධයෙන් පවත්වනු ලබන නවක නමනීකරණ වැඩසටහන් සහ වෙබ් සම්මන්ත්‍රණවලට අමතරව, වසර තුළදී MBBS සහ SHS සිසුන් සඳහා සංවාදශීලී සාහිත්‍ය සමීක්ෂණ සැසි සහ නිර්දේශන සැසි අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. 2022 දී සාහිත්‍ය සමීක්ෂණය පිළිබඳ පුළුල් කණ්ඩායම් සැසි අටක් සහ තනි පුද්ගල සැසි දහයක් ද පවත්වන ලදී.

ආචාර්ය සී.සී. ජයසුන්දර
පුස්තකාලයාධිපති



# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 සහ බාහිර උපාධි වැඩසටහන් පිරිනැමීමට තිබෙන විශ්වවිද්‍යාලයේ අතුරු ව්‍යවස්ථාවල සලසා ඇති විධිවිධානයන්ට අනුව එම මාර්ගෝපදේශය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව එය උපකුලපතිවරයාට සෘජුව වගකිව යුතු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. ලියාපදිංචි කිරීම් සහ විභාග, ඉගෙනුම් සම්පත් සහ පුහුණුව යන අංශ තුන මෙහෙයවන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් සිටිති. සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල සභාවේ අනුමැතිය ඇතිව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි අධ්‍යයන මණ්ඩල සහ කළමනාකරණ කමිටුව විසින් අදාළ වන පරිදි අධ්‍යයන සහ පරිපාලන තීරණ ගනු ලබයි.

## අපගේ මෙහෙවර

පගේ මෙහෙවර වන්නේ සිසුන් හට ජීවිතයේ ප්‍රතාපවත්බව උදෙසා ගරු කරමින් ලොවට සේවය කිරීම සඳහා දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීමට අවස්ථාවන් ලබා දීමේ විශිෂ්ටත්වය අත්කර ගැනීමයි.

## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

ශාස්ත්‍රවේදී කලා උපාධිය (සාමාන්‍ය) උපාධි වැඩසටහන දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ආරම්භයේ සිට 30-වසරක ඉතිහාසය තුළ පිරිනමා ඇත. එය එම කේන්ද්‍රයෙහි වඩාත්ම ඉල්ලුමක් ඇති බාහිර උපාධි වැඩසටහන (EDP) ද වේ. උපාධිධාරී රැකියා නියුක්තිය ඉහළ නැංවීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද නිර්දේශයන්ට අනුකූලව, 2021 දී ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන සඳහා නව විෂය මාලාවක් හඳුන්වා දෙන ලදී.

දැනට, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ඔස්සේ පීඨ හතරක් සමඟ ඒකාබද්ධව පහත දැක්වෙන බාහිර උපාධි වැඩසටහන් පිරිනමනු ලැබේ:

- **මානවශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨ**
    - ශාස්ත්‍රවේදී කලා උපාධිය
- **විද්‍යා පීඨය**
    - විද්‍යාවේදී උපාධිය
- **වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨය**
    - වාණිජවේදී උපාධිය
    - ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය

වාණිජවේදී (Bcom) උපාධිය හැර අනෙකුත් සියලුම බාහිර උපාධි වැඩසටහන් වසර 3 ක සාමාන්‍ය උපාධි වැඩසටහන් වන අතර ඒවා සම්මාන 90 ක් අවශ්‍ය වන අතර ඒවා SLQF 5 මට්ටමේ තබා ඇත.

## විභාග පරීක්ෂණ

කොවිඩ් - 19 වසංගතය සහ වෙනත් හේතූන් නිසා පසුගිය වසරවල එකතු වූ විභාග පැවැත්වීම ප්‍රමාද වීම වළක්වා ගැනීමට ද දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගත්තේය. 2022 වසරේ දී පහත විභාග පවත්වන ලදී:

- **ශාස්ත්‍රවේදී කලා උපාධි විභාග පරීක්ෂණ** - 2016 බඳවා ගැනීම (1 වන, 2 වන සහ 3 වන වසර)
- **ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි විභාග පරීක්ෂණ** - 2016 බඳවා ගැනීම (1 වන, 2 වන සහ 3 වන වසර)
- **වාණිජවේදී උපාධි විභාග පරීක්ෂණ** - 2016 බඳවා ගැනීම (1 වන, 2 වන, 3 වන සහ 4 වන වසර)

## බාහිර උපාධි වැඩසටහන් සඳහා නව ලියාපදිංචි කිරීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි උපදෙස් අනුව, 2016 අධ්‍යයන වර්ෂයෙන් පසු නව ලියාපදිංචි කිරීම් අත්හිටුවන ලදී. ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 01/2017 චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ මෙම උපාධි පාඨමාලාවේ විෂයමාලාව පුළුල් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය කටයුතු කළේය. 2022 දී, 2017, 2018 සහ 2019 අධ්‍යයන වර්ෂ සඳහා වෙනත් උපාධි වැඩසටහන් සමඟ ම සංශෝධිත ශාස්ත්‍රවේදී කලා උපාධි වැඩසටහන සඳහා නව අයදුම්පත් ද කැඳවන ලදී.

පෙර සැලසුම් කළ අධ්‍යයන දින දර්ශනයට අනුව පහත පරිදි අධ්‍යයන කටයුතු ආරම්භ විය.

- **ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි වැඩසටහන** - 2022.03.01
- **වාණිජවේදී උපාධි වැඩසටහන** - 2022.03.01
- **විද්‍යාවේදී උපාධි වැඩසටහන** - 2022.03.01
- **ශාස්ත්‍රවේදී කලා උපාධි වැඩසටහන** - 2022.06.01

මෙහෙයුම් කටයුතු ප්‍රමාදය වැළැක්වීම සඳහා, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් 2020 සහ 2021 අධ්‍යයන වර්ෂ සඳහා නව ලියාපදිංචි කිරීම්වලට වසර අවසානයේදී නැවත අයදුම්පත් කැඳවන ලදී. පහත පරිදි කටයුතු ආරම්භ කෙරිණි.

- **ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි වැඩසටහන** - 2022.10.01
- **වාණිජවේදී උපාධි වැඩසටහන** - 2022.10.01
- **විද්‍යාවේදී උපාධි වැඩසටහන** - 2022.10.01
- **ශාස්ත්‍රවේදී කලා උපාධි වැඩසටහන** - 2022.10.01

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර ඇති සිසුන්ට ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාවේ (පාර්ශ්වික ප්‍රවේශය) තෙවන වසර සඳහා සෘජුවම ලියාපදිංචි වීමට අවස්ථාව සලසා දී ඇත. මෙම සිසුන්ගේ තෙවන වසර අධ්‍යයන කටයුතු ද 2022.10.01 දින සිට ආරම්භ විය.

## විද්‍යුත් පුස්තකාලය

බාහිර උපාධි සිසුන්ට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීමට විද්‍යුත් පුස්තකාලයක් පිහිටුවීම සඳහා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත. රට පුරා විසිරී සිටින සිසුන් බොහෝ දෙනෙකු දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ට අධ්‍යයන කටයුතු සඳහා නිරතුරුව ම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි වෙත පැමිණීමට නොහැකිය. එනමුත් මෙම විද්‍යුත් පුස්තකාලය භාවිතා කිරීමෙන් ඔවුන්ට නිර්දේශිත කියවීම් සඳහා මාර්ගගතව පිවිසීමට හැකි වේ.

## විද්‍යුත් තැපෑල හරහා ශිෂ්‍යයන් හට සහාය වීම

සිසුන් විසින් විද්‍යුත් තැපෑලෙන් අසන ප්‍රශ්නවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමෙන් සහ ඔවුන්ට අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් ලබා දීමෙන් ශිෂ්‍ය කටයුතුවලට සම්බන්ධ වීමට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත.

## උපාධි ප්‍රදානෝත්සව

2022 දී, පහත වගුවේ දක්වා ඇති පරිදි, බාහිර උපාධි වැඩසටහන්වලින් උපාධිධාරීන් 6,767 දෙනෙකු උපාධි ප්‍රදානෝත්සව හතකට සහභාගී විය.

වගුව 40: 2022 දී පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවවල දී උපාධි පිරිනමන ලද බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව

| උපාධි වැඩසටහනෙහි නම | විද්‍යාර්ථීන් සංඛ්‍යාව |
|---|---|
| ශාස්ත්‍රවේදී කලා උපාධිය | 5,643 |
| ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධිය | 1,112 |
| විද්‍යාවේදී උපාධිය | 12 |
| **මුළු** | **6,767** |

## මාර්ගගත ඉගෙනීම

2022 කාලය තුළ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය එහි ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) ශක්තිමත් කිරීමට සැලකිය යුතු ප්‍රයත්නයක් දැරුවේ ය. කොවිඩ්-19 වසංගත තත්ත්වය සඳහා විසඳුමක් ලෙස මූලිකව සංවර්ධනය කරන ලද, LMS වෙබ් පිටුවල සූම් (Zoom) වේදිකාව සහ සම්මන්ත්‍රණවල වීඩියෝ පටිගත කිරීම් මගින් සිසුන්ට ඔවුන්ගේ ඉගෙනීමට විශාල සහයෝගයක් ලබා දෙන බැවින්, සිසුන් වෙත මාර්ගගත දේශන ලබා දීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් අඛණ්ඩව සිදු කර ගෙන යයි.

සිසුන් විසින් විද්‍යුත් තැපෑලෙන් අසන ප්‍රශ්නවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමෙන් සහ ඔවුන්ට අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් ලබා දීමෙන් ශිෂ්‍ය කටයුතුවලට සම්බන්ධ වීමට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත.

## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE) වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

CDCE) හි වෙබ් අඩවිය 2022)දී වඩාත් ආකර්ශනීය සහ පැහැදිලි ලෙස ප්‍රතිසංස්කරණය කරන ලදී. නවීකරණය කරන ලද කෑ වෙබ් අඩවිය හරහා සිසුන්ට වඩාත් පැහැදිලි ලෙස යාවත්කාලීන කළ තොරතුරු ලබා දෙන අතර, එමගින් සිසුන්ට ඔවුන්ට අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට හැකි වේ.

## මූල්‍ය කටයුතු

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් එක් එක් උපාධි වැඩසටහන සඳහා වෙනම අයවැයක් සකස් කරන ලදී. එක් එක් උපාධි වැඩසටහනෙහි මෙහෙයුම් කටයුතු එම වැඩසටහනට අනුව ආදායම් සහ වියදම් ප්‍රකාශ හරහා නිරීක්ෂණය කෙරේ. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය අදාළ UGC චක්‍රලේඛ, මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාළ රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය කළමනාකරණය සඳහා මනා සහ විනිවිද පෙනෙන යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවෙන් සහ සභාවෙන් අවශ්‍ය පරිදි අදාළ අනුමැති ලබා ගැනේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි සියලුම මූල්‍ය කටයුතු ගෘහස්ථව සංවර්ධනය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතියක් මගින් සිදු කරනු ලැබේ. අනන්‍ය වූ ඉලක්කම් 16 ක ගනුදෙනු කේතයක් භාවිත කිරීමෙන් සිසුන්ගෙන් රැස් කරගත් මුදල බැංකුව හරහා CDCE ජංගම ගිණුමට ලබා ගැනෙන අතර, සියලුම ගෙවීම් MIS හරහා මාර්ගගතව සකසනු ලැබේ.

**පූජ්‍ය ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි**

**අධ්‍යක්ෂ/ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**






# 10.
# තිරසර සංවර්ධනය

## ප්‍රතිපත්ති ප්‍රකාශය

- විශ්වවිද්‍යාලය රට තුළ පවතින අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට විශ්වවිද්‍යාලය සිය ක්‍රියාකාරකම් සිදු කරයි.
- ධාරිතා වර්ධනය, ව්‍යවස්ථාදායක උපකරණ, සහ වැඩිදියුණු කළ අන්තර් ආයතනික සම්බන්ධීකරණය සහ සම්බන්ධතා හරහා විශ්ව විද්‍යාලය විසින් ශබ්ද පාරිසරික කළමනාකරණය සඳහා වූ ආයතනික රාමුව ශක්තිමත් කර ඇත.
- විශ්වවිද්‍යාල පරිසරය සහ ආයතනයේ ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන පූර්ව නිර්වචනය කරන ලද පාරිසරික කළමනාකරණ පද්ධතියක් මගින් කළමනාකරණය කරනු ලැබේ.
- ආයතනයේ ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අඛණ්ඩව තක්සේරු කර යෝග්‍ය සහ ආයතනික අධීක්ෂණ රාමුවක් හරහා පුළුල් දර්ශක සමූහයක් මත පදනම්ව වාර්තා කර අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබේ.
- පාරිසරික අරමුණු සහ ඉලක්ක සැකසීම සහ සමාලෝචනය කිරීමේ රාමුව විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ.

- විශ්වවිද්‍යාලයේ පාරිසරික ප්‍රතිපත්තිය වෙත මහජනතාවට ප්‍රවේශ විය හැකි අතර, සෑම පාර්ශ්වකරුවෙකුම ආයතනයේ පාරිසරික ප්‍රතිපත්තිය සහ මෙම ප්‍රතිපත්තිය යටතේ ඔහුගේ/ඇයගේ බැඳීම් පැහැදිලිව අවබෝධ කර ගෙන පාරිසරික කළමනාකරණ පද්ධතියේ අන්තර්ගතයට අනුකූල ව කටයුතු කළ යුතුය.
- විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා පාරිසරික සේවාවන්හි තිරසර බව සහතික කිරීම සඳහා එවැනි සේවාවන්හි ආර්ථික වටිනාකම හඳුනාගෙන ඇත.

# උපායමාර්ග

- කාර්යක්ෂම භාවිතය, නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය (3R) ප්‍රවර්ධනය කිරීම මගින් අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම.
- කාබනික අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.
- ලෝහ, වීදුරු, ප්ලාස්ටික්/පොලිතීන් සහ කඩදාසි එකතු කර ඒවා නිතිපතා ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණය කරන්නන් හරහා බැහැර කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- අඛණ්ඩව බැහැර කිරීමක් නිර්මාණය කිරීම මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට පහසුකම් සැලසීම.
- වගකිවයුතු ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත යොමු කිරීම.
- රසායනාගාරවලින් රසායනික අපද්‍රව්‍ය එකතු කිරීමට සහ ගබඩා කිරීමට ප්‍රමිතිගත ක්‍රමවේදයක් ස්ථාපිත කර, එම අපද්‍රව්‍ය ලියාපදිංචි සමාගම් වෙත ප්‍රවාහනය කිරීම.
- ජෛව අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්වයංක්‍රීය ක්ලේවිං ක්‍රමය හඳුන්වා දීම.
- නව ඉදිකිරීම් සහ නවීකරණයන්හිදී තිරසර ඉදිකිරීම් මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ නව ඉදිකිරීම්වලදී හරිත ගොඩනැගිලි මූලධර්ම ප්‍රගුණ කිරීම.
- කාබන් කළමනාකරණ සැලැස්මක් ඇතුළුව, විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම අවම කිරීම.
- පරිසර හිතකාමී ප්‍රසම්පාදන සැලසුම් හරහා පාරිසරික බලපෑම අවම කිරීම.
- වාතයට විමෝචනය කිරීම් සහ ජලයට මුදා හැරීම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම මගින් දූෂණය වැළැක්වීම.
- වැසි ජලය රැස් කිරීමට පුරුදු වීම.
- ගෙවතු වගා කටයුතු සඳහා අපජලය එකතු කිරීම, පිරිපහදු කිරීම සහ නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම
- බලශක්තිය කාර්යක්ෂම භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් වනජීවී වාසස්ථාන නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- පාරිසරික අධ්‍යාපනය මූලික මෙවලමක් ලෙස යොදා ගනිමින් විශ්ව විද්‍යාල ප්‍රජාව සහ සමාජය අතර පරිසරය කෙරෙහි ගෞරවනීය හැසිරීම ප්‍රවර්ධනය කිරීම.

# SDG 01: දරිද්‍රතාවය පිටුදැකීම

## කටයුතු

කැලණිය විශ්වවිද්‍යාලය අඩු ආදායම්ලාභී පවුල්වල උපාධි අපේක්ෂක සිසුන්ගේ මූල්‍ය දුෂ්කරතා සමනය කිරීම සඳහා යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරයි. විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගම් සහ අනෙකුත් සුභ පතන්නන් විසින් පිරිනමන ශිෂ්‍යත්ව මේවාට ඇතුළත් වේ.

2022 දී, මානව ශාස්ත්‍ර පීඨයේ ලලිත කලා අධ්‍යයන අංශයේ (දෘශ්‍ය කලා සහ නිර්මාණ සහ රංග කලා ඒකකයේ) විශේෂයෙන් දක්ෂතා පිළිබිඹු කළ උපාධි අපේක්ෂකයෙකුට විද්‍යා පීඨයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් මසකට රුපියල් 5000 ක කුසලතා ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී. තවත් මූල්‍යමය වශයෙන් අභියෝග ඇති, නමුත් අධ්‍යාපනික වශයෙන් දස්කම් දක්වන උපාධි අපේක්ෂකයින් 51ක් දෙනෙකුට ත්‍යාගශීලී ආදි ශිෂ්‍ය සාමාජිකයින්ගේ සහාය හිමි විය: සිසුන් හතර දෙනෙකුට මසකට රුපියල් 5000 ක්, සිසුන් 22 දෙනෙකුට මසකට රුපියල් 2500 ක්, සිසුන් 03 දෙනෙකුට මසකට රුපියල් 1500 ක් සහ සිසුන් 16 දෙනෙකුට රුපියල් 6000 ක් වශයෙන් එක් වරක් පමණක් පිරිනැමෙන ශිෂ්‍යත්ව හිමි විය. "මහාචාර්ය සුදත් ආර්. ඩී. කාලිංගමුදලි සහ ඔහුගේ පවුලේ ශිෂ්‍යත්වය" නමින් නව ශිෂ්‍යත්ව ක්‍රමයක් 2022 දී හඳුන්වා දෙන ලදී. සිසුන් හය දෙනෙකුට ශිෂ්‍යත්වය පිරිනමන ලද අතර එක් අයෙකුට මසකට රුපියල් 5000 බැගින් ලැබේ.

# SDG 02: ශුන්‍ය කුසගින්න

## කටයුතු

පවතින ආර්ථික අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස සහ පුළුල් වූ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ගෘහස්ථ භෝග නිෂ්පාදනය කිරීමට පියවර ගෙන ඇත. තිරසාර විසඳුම සඳහා වූ මධ්‍යස්ථානය (SSC) භූ දර්ශන ඒකකය සමඟ එක්ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ එළවළු රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එළවළු භෝග වගා කිරීම සඳහා පවතින සීමිත ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින්, ඉඩම් සහ වගාව සකස් කිරීම භාරකරු, භූ දර්ශන අංශය සහ භූ දර්ශන අධීක්ෂකගේ මඟපෙන්වීම මත ආරම්භ කරන ලදී. රාගම ප්‍රදේශයේ අක්කර තුනකට වැඩි භූමි ප්‍රමාණයක් අස්වැද්දීමට ද වෛද්‍ය පීඨය පියවර ගෙන ඇත.

## පර්යේෂණය

SDG 2 හා සම්බන්ධ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ප්‍රතිදානයන්ට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- දරිද්‍රතාවය පිටුදැකීම" (SDG 1) "ශුන්‍ය කුසගින්න"(SDG 2) සහ "ගුණාත්මක අධ්‍යාපනය" (SDG 4) භාවිතා කරමින් ශ්‍රී ලාංකේය සන්දර්භය වෙත "ප්‍රමුඛ මානසික සිතියමක්" හැඩ ගැන්වීම.
- ශුන්‍ය කුසගින්න සඳහා ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම: ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය
- ආහාර සුරක්ෂිතතාවය මත විරැකියාවේ බලපෑම: ශ්‍රී ලංකාවෙන් සාක්ෂි
- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආදායම් උත්පාදනය සඳහා සැලසුම්ගත නැවත ස්ථානගත කිරීමේ බලපෑම ගවේෂණය කිරීම: Y දිස්ත්‍රික්කයේ නායයෑම් හේතුවෙන් නැවත පදිංචි කිරීමේ සිද්ධියක්.
- ජනගහනයේ බලපෑම, ආහාර සුරක්ෂිතතාවය මත ආර්ථික වර්ධනය - ශ්‍රී ලංකාවෙන් සාක්ෂි

# SDG 03: මනා සෞඛ්‍යය සහ යහපැවැත්ම

## කටයුතු

මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, විශ්ව විද්‍යාල සේවකයින් සහ සිසුන් අතර යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා (2022) දී විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී.

වෛද්‍ය පීඨයේ මනෝචිකිත්සක අංශය විසින් සංවිධානය කර ඔක්තෝම්බර් මාසයේදී සනාතන සභා ශාලාවේ පැවති සාකච්ඡාවක දී එහි ප්‍රධානතම කරුණක් වූයේ මානසික පීඩාවෙන් පෙළෙන උපාධි අපේක්ෂකයින් හඳුනා ගැනීම සහ ඔවුන් වෙත අවධානය යොමු කිරීම සහ ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ කාර්යභාරය පිළිබඳව ය. විශ්වවිද්‍යාල සිසුන් පීඩාවට පත්වන්නේ ඇයි; එවැනි සිසුන් හඳුනා ගත හැක්කේ කෙසේද; උපාධි අපේක්ෂකයින් අතර ද්‍රව්‍ය භාවිතය සහ අවධානය අඩුවීම/අධි ක්‍රියාකාරීත්වයේ ආබාධය (ADHD) සහ උපාධි අපේක්ෂකයින් අතර මුහුණ දීමේ කළමනාකරණ කුසලතා සහ මනා සිහි කල්පනාව වැඩි දියුණු කරගන්නේ කෙසේද යන්න පිළිබඳ ව සාකච්ඡාවේ දී අවධානය යොමු විය.

## පර්යේෂණය

මෙම තිරසර සංවර්ධන ඉලක්කවලට සම්බන්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්වලට ශ්‍රී ලංකාවේ මානසික යහපැවැත්ම මැනීමේ ව්‍යාපෘතියක් ඇතුළත් වේ: සිංහල කතා කරන ප්‍රජාවක් තුළ වෝවික් එඩින්බර් (Warwick Edinburgh) මානසික සුවතා පරිමාණය (WEMWBS) වලංගු කිරීම.

# SDG 05: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

## කටයුතු

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සැප්තැම්බර් මාසයේ දී පරිගණක හා තාක්ෂණ පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමානතා සහ සමානාත්මතා සමාජයේ 2 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2021/2022 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පළමු ජාතික සමුළුව ලෙස සැප්තැම්බර් මාසයේදී පැවැත්විණි. යුනෙස්කෝ කලාපයේ දකුණු ආසියානු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උපදේශක ආචාර්ය හුමා මසූඩ් මහත්මිය මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශකයා විය. සම්මේලනයේ 2 වැනි අදියර ප්‍රතිපත්ති සංසදයක් වූ අතර, එහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

ශිෂ්‍ය නේවාසිකාගාර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව උපාධි අපේක්ෂකයින් අතර දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද සැප්තැම්බර් - දෙසැම්බර් කාලසීමාව තුළ පවත්වන ලදී.

විශ්වවිද්‍යාලයේ සේවය කරන ආරක්ෂක නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන ප්‍රවාහය පිළිබඳ තවත් දැනුවත් කිරීමේ වැඩසටහනක් පෙබරවාරි මාසයේ දී පවත්වන ලදී. උපාධි අපේක්ෂකයින් සහ අනෙකුත් සිසුන් සමඟ සෘජු සම්බන්ධතා පවත්වන ආරක්ෂක නිලධාරීන්ගේ ස්ත්‍රී පුරුෂ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම මෙම සැසියේ අරමුණ විය.

කාන්තා තාක්ෂණවේදීන් දිරිමත් කිරීම සඳහා එක්දින කාන්තා ව්‍යවසායකත්ව ආරම්භක කඳවුරක් දෙසැම්බර් මාසයේ දී පැවැත්විණි. කැලණිය විශ්වවිද්‍යාලයෙහි කාන්තා ව්‍යවසායක තාක්ෂණවේදිනියන් සවිබල ගැන්වීම යන මැයෙන් පරිගණක සහ තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී සෛලය (IICFCT), විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා සෛලය (UBLC) සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් තාක්ෂණ නියෝජිතායතනය මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී.

## පර්යේෂණය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඒකාකෘති වෙනස්කම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා හැසිරීම් වෙනස් කිරීම: න්‍යායික ඉදිරිදර්ශනයක්
- කිසියම් ඩිජිටල් ස්ත්‍රී පුරුෂ භේදයක් තිබේද? ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායක තාක්ෂණවේදිනියන් මුහුණ දෙන අභියෝග ගවේෂණය කිරීම

## SDG 07: දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

### කටයුතු

තිරසාර විසඳුම් සඳහා වූ මධ්‍යස්ථානය (CSS), කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) සහ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පරිගණක මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද බලශක්ති ඉතිරිකිරීමේ ක්‍රමෝපායයන් හඳුන්වාදීම පිළිබඳ වැඩමුළුවක් තෝරා ගත් - අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා නොවැම්බර් මාසයේ දී පැවැත්විණි. මෙම සාමාජිකයින් මෙම පුහුණුව අවසන් කළ පසු, ඔවුන් විසින් අදාළ පීඨවල අනධ්‍යයන කාර්යමණ්ඩලය පුහුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. තවද, මෙම වැඩමුළුවේ ප්‍රතිඵල සහ අත්දැකීම් සිසුන් වෙත ව්‍යාප්ත කෙරෙන බලශක්ති කළමනාකරණ වැඩසටහන සඳහා මූලික අත්හදා බැලීමක් ලෙස ක්‍රියා කරනු ඇත.

### පර්යේෂණය

- තිරසර මානව පරිගණක සබඳතාවක් සඳහා ඉදිරි ගමන්මඟක්

## SDG 10: අසමානතා

### කටයුතු

විද්‍යා පීඨයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් ජීව විද්‍යා විෂය ධාරාවේ පළමු වසරේ සිසුවෙකුට විද්‍යුත් රෝද පුටුවක් පරිත්‍යාග කරමින් වසරේ පළමු උත්සවය පවත්වන ලදී.

### පර්යේෂණය

- ශාරීරිකමය (නොහැකියාවන්) හැකියාවන්: ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය පැවති කාලය තුළ ආබාධ සහිත කාන්තා උපාධි අපේක්ෂකයින් විසින් අධ්‍යාපනික පිළිවෙත් පිළිබඳ නැවත සාකච්ඡා කිරීම
- විශේෂිත ඉගෙනුම් ආබාධ සඳහා රෝග ලක්ෂණ, ආකල්ප සහ පන්තිකාමර ඉගැන්වීමේ උපාය මාර්ග පිළිබඳ ගුරුවරුන්ගේ දැනුම: ශ්‍රී ලංකාවේ නුවරඑළිය අධ්‍යාපන කලාපයේ දෙමළ කතා කරන ප්‍රාථමික පාසල් ගුරුවරුන් අතර අධ්‍යයනයක්
- ආහාර පරිසරයන් සහ ස්ථූලතාව: දකුණු ආසියා ජෛව බැංකුව, ආදායම් සහ ලිංගික අසමානතා පිළිබඳ භූගෝලීය විශ්ලේෂණයක්

# SDG 11: තිරසර නගර සහ ප්‍රජාවන්

## කටයුතු

විශ්වවිද්‍යාලයේ හරිත ආවරණය පුළුල් කිරීමේ අරමුණින් කැලණිය විශ්වවිද්‍යාලය සහ තලගොල්ල ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් පසුගිය සැප්තැම්බර් මාසයේ දී අත්සන් කරන ලදී. මෙම නව බිම් කොටස අක්කරයකට වඩා වැඩි වන අතර, එය පරිශ්‍රයන්හි සෞන්දර්යාත්මක වටිනාකම සහ ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීම සඳහා පීඨයේ හරිත ආවරණය වැඩි කිරීමට භාවිතා කෙරෙනු ඇත.

# SDG 07: වගකිව යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

## කටයුතු

විශ්වවිද්‍යාල සෞඛ්‍ය හා ආරක්ෂක සේවා (UHSS) මෙහෙයුම් කමිටුව විසින් සංවිධානය කරන ලද උත්සවයක දී කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ රසායනාගාර අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණ සහ බැහැර කිරීමේ අඩවිය සැප්තැම්බර් මස විවෘත කරන ලදී. එදින ම, ඔහු සහ (SDC) මගින් විශ්වවිද්‍යාලයේ රසායනාගාර කාර්යමණ්ඩල සාමාජිකයින්, තාක්ෂණික කාර්යමණ්ඩල සාමාජිකයින් සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත්, හරිත සංකල්ප අනුගමනය කිරීම, අපද්‍රව්‍ය සඳහා තිරසර විසඳුම්, රසායනාගාර රසායනික ද්‍රව්‍ය සහ අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය සහ ආරක්ෂිතව හැසිරවීම සහ බැහැර කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා, වෛද්‍ය සහ තාක්ෂණ විද්‍යාගාරවල ඇති අන්තරායකර අපද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම සහ ඉවත් කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය සහ සී/ස ඉන්සී ඉකෝ සයිකල් ලංකා (පුද්) සමාගම (INSEE ECO) (CYCLE LANKA Private Limited) අතර අවබෝධතා ගිවිසුමක් ද එදිනම පැවති සමගාමී උත්සවයක දී අත්සන් කරන ලදී. INSEE ECOCYCLE LANKA යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වෘත්තීය අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සපයන ආයතනයකි.

## පර්යේෂණය

- වනාන්තර ආවරණයේ අවකාශීය විචලනය පිළිබඳව දේශගුණික විපර්යාස සහ විචල්‍යතාවයේ බලපෑම; ලෝක උරුම සිංහරාජ වැසි වනාන්තරය, ශ්‍රී ලංකාව

# SDG 14: ජලයෙන් පහළ ජීවිතය

## පර්යේෂණය

- ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගෘහාශ්‍රිත පරිසරයන්හි ඊඩිස් ඊජිප්ටි (Aedes aegypti) සහ Aedes albopictus (ඊඩිස් ඇල්බොපික්ටස්) ඝනත්වයට අදාළව අභිජනන වාසස්ථානවල ජල තත්ත්ව ලක්ෂණ
- ශ්‍රී ලංකාවෙහි අනුරාධපුරයෙහි මහකනදරාව වැවේ මතුපිට රොන් බොර හා ජලයෙහි විෂ සහිත ලෝහ දූෂණය සමීක්ෂණය කිරීම;



# 11.
# මූල්‍ය ප්‍රකාශ
# 2022

UNIVERSITY OF
KELANIYA

# මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා රුපියල් වලිනි.

වගුව 41 : මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන | 2022 | 2021 (යළි ප්‍රකාශිත) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම** | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - වර්තන** | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 4 | 4,464,375,298.80 | 4,142,569,986.00 |
| මහපොළ ශිෂ්‍යත්වය සඳහා ප්‍රදාන | | 240,398,250.00 | 104,144,600.00 |
| ශිෂ්‍යාධාර සඳහා ප්‍රදාන | | 90,108,000.00 | 92,944,000.00 |
| ප්‍රදාන - STHRD ව්‍යාපෘතිය | | 19,525,676.33 | 24,843,201.00 |
| ප්‍රදාන - AHEAD ව්‍යාපෘතිය | | 76,171,166.47 | - |
| විදේශීය පර්යේෂණ ප්‍රදාන | | 138,740,068.67 | 62,167,470.00 |
| පරිත්‍යාග අරමුදල්වලින් ලද පරිත්‍යාග | | 1,736,566.83 | 1,441,800.00 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම** | | **5,031,055,027.10** | **4,428,111,057.00** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ප්‍රාග්ධන** | | | |
| භාණ්ඩාගාර අරමුදල්වලින් ලද ප්‍රාග්ධන ආයෝජනය | | 202,187,958.97 | 317,238,648.36 |
| CNCLD ගොඩනැගිල්ල සඳහා වන ප්‍රාග්ධන ආයෝජනය | | 89,355,180.30 | 48,348,995.64 |
| අතිරේක බඳවා ගැනීම්වලින් ලද ප්‍රාග්ධන ආයෝජනය | | 90,508,282.54 | - |
| තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියෙන් ලද ප්‍රාග්ධන ආයෝජනය | | 6,356,050.00 | - |
| ප්‍රාග්ධන ප්‍රදාන AHEAD | | 156,422,314.41 | 137,555,150.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන STHRD | | 2,564,388,775.58 | 2,206,160,126.00 |
| පරිත්‍යාග | | 1,460,511.26 | 3,358,562.34 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම - ප්‍රාග්ධන** | | **3,110,679,073.06** | **2,712,661,482.34** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම** | | **8,141,734,100.16** | **7,140,772,539.34** |
| **විනිමය ගනුදෙනුවලින් ලද ආදායම** | | | |
| ආයෝජනවලින් ලද පොලිය | | 689,716,923.69 | 232,349,230.09 |
| දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයෙන් ලද ආදායම | | 297,768,404.62 | 183,167,198.00 |
| ගාස්තු අය කෙරෙන පාඨමාලා/ විශේෂ සේවාවලින් ලද ආදායම | | 440,890,611.76 | 371,456,471.02 |
| අභ්‍යන්තර ආදායම | 5 | 1,114,697,139.38 | 482,945,385.82 |
| **විනිමය ගනුදෙනුවලින් ලද මුළු ආදායම** | | **2,543,073,079.45** | **1,269,918,284.93** |
| **ජාතික ආදායම** | | **10,684,807,179.61** | **8,410,690,824.27** |

# මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (ඉදිරියට)

| | සටහන | 2022 | 2021 (යළි ප්‍රකාශිත) |
|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | |
| **පුනරාවර්තන ආදායම** | | | |
| විනිමය නොවන | | 5,031,055,027.10 | 4,428,111,057.00 |
| විනිමය | | 2,543,073,079.45 | 1,269,918,284.93 |
| **මුළු ආදායම** | | **7,574,128,106.55** | **5,698,029,341.93** |
| **වියදම් - වර්තන (ප්‍රාග්ධන නොවන)** | | | |
| පෞද්ගලික පාරිතෝෂික | 6 | 4,289,329,577.61 | 3,994,238,762.36 |
| ගමන් වියදම් | 7 | 6,958,278.81 | 3,354,920.34 |
| සැපයුම් | 8 | 170,924,178.70 | 92,430,231.32 |
| නඩත්තු වියදම් | 9 | 85,541,250.44 | 28,126,174.23 |
| කොන්ත්‍රාත් සේවා | 10 | 431,820,801.79 | 321,308,833.78 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 11 | 101,339,393.94 | 82,111,375.12 |
| සංවර්ධන අරමුදල සඳහා වියදම් | 12 | 100,866,901.00 | 98,853,103.21 |
| ව්‍යාපෘති වියදම් | 13 | 95,696,842.33 | 22,362,731.00 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය සඳහා වියදම් | 14 | 89,225,438.29 | 37,936,664.00 |
| ගාස්තු අය කෙරෙන පාඨමාලා / විශේෂ සඳහා වියදම් | | 273,486,004.65 | 176,331,855.84 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 258,806,037.00 | 193,684,243.00 |
| වියදම් - ශිෂ්‍යාධාර | | 90,108,000.00 | 92,944,000.00 |
| වියදම් - මහපොළ | | 240,398,250.00 | 104,144,600.00 |
| විදේශීය පර්යේෂණ ප්‍රදාන | | 102,275,723.80 | 62,167,470.00 |
| **මුළු වියදම්** | | **6,336,776,678.36** | **5,309,994,964.20** |
| **කාලපරිච්ඡේදය සඳහා වර්තන අතිරික්තය / (හිඟය)** | | **1,237,351,428.19** | **388,034,377.73** |
| විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන | | 3,110,679,073.06 | 2,712,661,482.34 |
| **වියදම් - වර්තන (ප්‍රාග්ධන)** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානවල පුනරාවර්තන වියදම | 15 | 17,875,298.80 | 14,569,986.00 |
| ක්ෂය | | 720,427,953.30 | 732,488,639.00 |
| අසපෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | | 6,895,473.61 | 9,777,342.00 |
| **මුළු වියදම් - වර්තන (ප්‍රාග්ධන)** | | **745,198,725.71** | **756,835,967.00** |
| **ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගණනය කිරීමෙන් පසු කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිඟය)** | | **2,365,480,347.35** | **1,955,825,515.34** |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිඟය)** | | **3,602,831,775.54** | **2,343,859,893.07** |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

වගුව 42 : මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට රුපියල් වලිනි | සටහන | 2022 | 2021 (යළි ප්‍රකාශිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 16 | 13,462,431,833.71 | 12,693,326,975.95 |
| පුස්තකාල පොත් සහ ලෝගු | 17 | 13,566,094.43 | 19,954,553.32 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 18 | 5,014,813,850.00 | 2,513,229,837.83 |
| අස්පෘශ්‍ය වත්කම් | 19 | 14,533,961.31 | 9,022,163.76 |
| මූල්‍ය වත්කම් | 20 | 3,551,284,237.97 | 4,085,645,186.15 - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **22,056,629,977.42** | **19,321,178,717.01** |
| **ජංගම් වත්කම්** | | | |
| තොගය | 21 | 53,009,091.76 | 40,200,794.25 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 22 | 392,139,268.11 | 217,454,638.67 |
| කාර්යමණ්ඩලයට අත්තිකාරම් | 23 | 1,389,630.10 | 957,730.10 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 24 | 128,305,954.81 | 86,336,872.45 |
| මුදල් හා මුදල් සමාන දෑ | 25 | 683,668,228.58 | 429,229,657.71 |
| **මුළු ජංගම වත්කම්** | | **1,258,512,173.36** | **774,179,693.18** |
| **මුළු වත්කම්** | | **23,315,142,150.78** | **20,095,358,410.19** |
| **සාමාන්‍ය කොටස් හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය** | | | |
| සමුච්ත අරමුදල - අතිරික්තය/ (හිඟය) - වර්තන සහ ප්‍රාග්ධන | 26 | 8,536,685,387.26 | 5,368,452,808.69 |
| ප්‍රාග්ධන ප්‍රධාන -වැය නොකළ | 27 | 133,684,795.40 | 137,005,107.55 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ගොඩනැගිලි ව්‍යාපෘතිය | 28 | 1,227,570.00 | 1,011,848.00 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 8,298,179,471.25 | 8,129,394,471.00 |
| රඳවාගත් ඉපැයුම් | | 1,964,445,053.84 | 2,385,744,227.00 |
| **මුළු ප්‍රාග්ධනය** | | **18,934,222,277.75** | **16,021,608,462.24** |
| **සංචිත සහ සීමා කළ අරමුදල්** | | | |
| අභ්‍යන්තර සීමා කළ අරමුදල් | 29 | 1,388,762,440.09 | 1,334,781,125.45 |
| පරිත්‍යාග අරමුදල් | 30 | 27,900,790.53 | 22,875,781.70 |
| පර්යේෂණ ප්‍රදාන | 31 | 172,633,259.88 | 136,168,915.88 |
| අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම | 32 | 1,109,928,495.39 | 915,767,159.31 |
| **මුළු සංචිත සහ සීමා කළ අරමුදල්** | | **2,699,224,985.89** | **2,409,592,982.34** |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 33 | 1,373,753,062.89 | 1,371,839,011.29 |
| **ජංගම වගකීම්** | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 34 | 100,730,214.66 | 102,204,934.91 |
| උපචිත වියදම් සහ වෙනත් ගෙවිය යුතු දෑ | 35 | 207,211,609.59 | 190,113,019.41 |
| **මුළු ජංගම වගකීම්** | | **307,941,824.25** | **292,317,954.32** |
| **මුළු ප්‍රාග්ධනය සහ වගකීම්** | | **23,315,142,150.78** | **20,095,358,410.19** |

These Financial statements have been prepared & presented in compliance with Public Sector Accounting Standards issued by the Institute of Chartered Accountants of Sri Lanka.

U.T.M.I.D. Tennakoon
Bursar

The Council Members are responsible for the preparation & presentation of these Financial Statements. Signed for and on behalf of the Council.

Senior Prof. Nilanthi de Silva
Vice-Chancellor

Senior Prof. S.R.D. Kalingamudali
Council Member

Dr. P.N.D. Fenando
Council Member

University of Kelaniya.
February 28th 2023.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

වගුව 43 : මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 | 2021 (යළි ප්‍රකාශිත) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය (හිඟය)** | **1,237,351,428.19** | **388,034,377.73** |
| **ගැලපීම්** | | |
| ආයෝජනවලින් පොලිය | (689,716,923.69) | (232,349,230.09) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 258,806,037.00 | 193,684,243.00 |
| රජයේ ප්‍රදානය-පුනරුත්ථාපනය නඩත්තු කිරීම | (17,875,298.80) | (14,569,986.00) |
| විශ්වවිද්‍යාල අරමුදල් සඳහා ආදායම වෙන්කිරීම/ මූල්‍ය නොවන ගැලපීම් | (1,378,101,751.40) | (508,686,613.29) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(589,536,508.70)** | (173,887,208.65) |
| (බඩු ලේඛනවල අඩුවීම/ (වැඩිවීම) | (12,518,178.66) | 531,425.90 |
| විවිධ ණයකරුවන් සහ ලැබිය යුතු දේවල (වැඩිවීම)/ අඩුවීම | (94,424,909.54) | 2,377,531.00 |
| කාර්යමණ්ඩලයට ණය හා අත්තිකාරම්වල අඩුවීම/ (වැඩිවීම) | (18,678,120.69) | 11,704,494.58 |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම්වල අඩුවීම/ (වැඩිවීම) | (41,969,082.36) | 65,430,513.51 |
| උපචිත සහ වෙනත් ගෙවිය යුතු වියදම්වල (අඩුවීම)/ වැඩිවීම | 17,098,590.29 | 10,051,621.47 |
| නැවත ගෙවිය යුතු තැන්පතුවල (අඩුවීම)/වැඩිවීම | (1,474,720.25) | (40,973,881.38) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පසු මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(741,502,929.91)** | (124,765,505.57) |
| පාරිතෝෂික ගෙවීම් | (98,344,482.00) | (83,421,175.58) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(839,847,411.91)** | **(208,186,679.15)** |
| **ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම | (967,676,506.40) | (331,165,368.17) |
| ආයෝජන පොලිය | 609,457,204.12 | 406,345,872.09 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (137,346,762.77) | (117,669,681.88) |
| අස්පෘශ්‍ය වත්කම් | (12,407,271.17) | - |
| ආයෝජන | 552,607,168.87 | (344,864,615.77) |
| සීමා කළ අරමුදල් සහ ප්‍රදාන | 53,981,315.89 | 1,940,795.84 |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **98,615,148.54** | **(385,412,997.89)** |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| ආණ්ඩුවේ ප්‍රදානය - ප්‍රාග්ධන | 174,500,000.00 | 140,000,000.00 |
| වෙනත් විශේෂ ප්‍රදාන - වෙනත් මූලාශ්‍රවලින් ප්‍රාග්ධන දායකත්වය | 50,658,463.74 | 105,486,464.72 |
| බාහිර අරමුදල් උපයෝජනය | 41,489,352.83 | 336,198,369.93 |
| මුදල් නොවන දායකත්වය | 729,023,017.67 | 80,865,292.93 |
| **මුදල් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **995,670,834.24** | **662,550,127.58** |
| මුදල් හෝ මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | 254,438,570.87 | 68,950,450.54 |
| වර්ෂය මුල දී මුදල් හා මුදල් සමාන දේ | 429,229,657.71 | 360,279,207.17 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ** | **683,668,228.58** | **429,229,657.71** |

# සමකොටස්වල සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා රුපියල්වලින් | වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්ත ප්‍රාග්ධන අතිරික්තය/ හිඟය) | අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ගොඩනැඟිලි ව්‍යාපෘති | ප්‍රත්‍යාගණන අතිරික්තය | ප්‍රත්‍යාගණන අතිරික්තය | සංචිත සහ සීමා කළ අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | 5,379,052,650.89 | 217,312,289.70 | - | 17,272,548.70 | 8,129,394,471.25 | 354,822,006.67 | 2,071,588,542.08 | 16,169,442,509.29 |
| පෙර වසරේ ගැළපීම්වල ශුද්ධ චලනය | 81,629,447.78 | - | - | 134,726.00 | - | - | (134,726.00) | 81,629,447.78 |
| පරිත්‍යාග අරමුදල් වෙත මාරු කළ අරමුදල් | | | - | | | (500,000.00) | | (500,000.00) |
| **2021 ජනවාරි 01 දිනට ශේෂය - යළි ප්‍රකාශිත** | 5,460,682,098.67 | 217,312,289.70 | - | 17,407,274.70 | 8,129,394,471.25 | 354,322,006.67 | 2,071,453,816.08 | 16,250,571,957.07 |
| වසර සඳහා අතිරික්තය/ (හිඟය) | - | - | - | - | - | 115,872,244.00 | - | 115,872,244.00 |
| මාරු කිරීම් / ශුද්ධ සංචලන | (92,229,289.98) | (80,307,182.36) | - | (16,395,426.89) | - | (31,477,262.80) | 85,891,720.57 | (134,517,441.46) |
| MBBS ප්‍රදානය සඳහා අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (45,503,801.85) | 45,503,801.85 | - |
| ගාස්තු අය කරන පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (195,124,615.18) | 195,124,615.18 | - |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (10,177,227.69) | 10,177,227.69 | - |
| පරිත්‍යාග අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (1,441,800.00) | 1,441,800.00 | - |
| පෙර වර්ෂයේ ගැළපීම | - | - | - | - | - | 1,212,393,353.27 | - | 1,212,393,353.27 |
| PV-DBOවල තථ්‍ය(අත්කර ගත්) අලාභය | - | - | - | - | - | 129,869,998.59 | - | 129,869,998.59 |
| වෙනස් වූ ප්‍රාග්ධන ප්‍රදානය | - | - | - | - | - | 857,011,331.37 | - | 857,011,331.37 |
| **2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 5,368,452,808.69 | 137,005,107.34 | - | 1,011,847.81 | 8,129,394,471.25 | 2,385,744,226.38 | 2,409,592,981.37 | 18,431,201,442.84 |
| SLPSAS 11ට අනුව ප්‍රතිවර්ගීකරණය - ශුද්ධ චලන | | - | - | - | - | 2,712,661,482.34 | - | 2,712,661,482.34 |
| SLPSAS 11ට අනුව ප්‍රතිවර්ගීකරණය - සමුච්ත අතිරික්තය/ (හිඟය) - ප්‍රාග්ධනය | (2,712,661,482.34) | - | 2,712,661,482.34 | - | - | (2,712,661,482.34) | - | (2,712,661,482.34) |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (2,655,791,326.35) | - | 2,655,791,326.35 | - | - | - | - | - |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය - යළි ප්‍රකාශිත** | - | 137,005,107.34 | 5,368,452,808.69 | 1,011,847.81 | 8,129,394,471.25 | 2,385,744,226.38 | 2,409,592,981.37 | 18,431,201,442.84 |
| වසර සඳහා අතිරික්තය / (හිඟය) | - | - | - | - | - | 3,602,831,775.54 | - | 3,602,831,775.54 |
| මාරු කිරීම් / ශුද්ධ චලන | - | (3,320,311.94) | - | 215,722.19 | 168,785,000.00 | (799,763,334.02) | 53,838,413.52 | (580,244,510.44) |
| MBBS ප්‍රදානය වෙත අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (55,810,334.00) | 55,810,334.00 | - |
| **ගාස්තු අය කරන පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම්** | - | - | - | - | - | (167,404,607.00) | 167,404,607.00 | - |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (10,842,083.00) | 10,842,083.00 | - |
| පරිත්‍යාග අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | (1,736,567.00) | 1,736,567.00 | - |
| පෙර වසරේ ගැලපීම | - | - | 57,553,506 | - | - | 36,442,453.00) | - | 21,111,052.51 |
| PV-DBOවල තථ්‍ය(අත්කර ගත්) අලාභය | - | - | - | - | - | 158,547,503.00 | - | 158,547,503.00 |
| SLPSAS 11ට අනුව වර්ගීකරණය - සමුච්ත අරමුදල - ප්‍රාග්ධනය | - | - | 3,110,679,073.06 | - | - | (3,110,679,073.06) | - | - |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 133,684,795.40 | 8,536,685,387.26 | 1,227,570.00 | 8,298,179,471.25 | 1,964,445,053.84 | 2,699,224,985.89 | 21,633,447,263.45 |

වගුව 44 : සමකොටස්වල සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

# මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයකින් සමන්විත සටහන් සහ අනෙකුත් විස්තරාත්මක සටහන් - 2022

## ආයතනික තොරතුරු

### අ. වාර්තාකරණ ආස්ථිත්‍යය

කැලණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ඊට පසුකාලීනව සිදු කළ සංශෝධන යටතේ පිහිටුවන ලද පූර්ණ ව රජය සතු උසස් අධ්‍යාපන ආයතනයකි. මෙම විශ්වවිද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### ආ. මෙහෙයුම් කටයුතුවල ස්වභාවය සහ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කටයුතු

විශ්ව විද්‍යාලය පීඨ හතකින් සමන්විත වේ: ඒවා නම්, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, මානව ශාස්ත්‍ර පීඨය, සමාජ විද්‍යා පීඨය, විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය සහ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය යි.

තිරසාර සංවර්ධනය උදෙසා  දැනුම බිහි කිරීමේ සහ බෙදා හැරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම එහි දැක්ම වේ. ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම විශ්වවිද්‍යාලයේ මූලික ක්‍රියාකාරකම් වේ. විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වෙන පරිදි වේ:

- **උසස් ගුණාත්මක සහ නම්‍යශීලී ශික්ෂණ සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම**
- **විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම පිණිස උසස් ගුණාත්මක පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩනැඟීම.**
- **ගෝලීය ප්‍රමිතියෙන් යුත් බහු විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම**
- **ආර්ථික සහ සමාජීය සබඳතා නිරතවීම් පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.**
- **ඵලදායී හා කාර්යක්‍ෂම පරිපාලනයක් සහ මූල්‍ය කළමනාකරණයක් හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැඟීම.**

## ඈ. මූල්‍ය ප්‍රකාශ සඳහා බලය දීමේ දිනය

පාලක සභාවේ සාමාජිකයින් මගින් 2023 පෙබරවාරි 22 වැනි දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දෙන ලදී.

## ඉ. මූල්‍ය ප්‍රකාශනවල වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකරණයෙහි වගකීමක් වන අතර, වංචාවක් හේතුවෙන් හෝ වැරදීමකින් ඇති වන ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීමට හැකිවීම සඳහා කළමනාකාරිත්වය තීරණය කරන පරිදි අභ්‍යන්තර පාලනයක් අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශනවල සංරචක පහත පරිදි වේ:

- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
- මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
- ශුද්ධ වත්කම් / සම කොටස්වල වෙනස පිළිබඳ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයකින් සමන්විත සටහන් සහ අනෙකුත් විස්තරාත්මක සටහන්
- අයවැයගත සහ තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය

## ඊ. වාර්තාකරණ කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාල පරිච්ඡේදය 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක් නියෝජනය කරයි.

## මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

### අ. අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, / ශුද්ධ වත්කම්වල/ ප්‍රාග්ධනයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, අයවැයගත සහ තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශනය මෙන්ම, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වලින් සමන්විත සටහන් යනාදියෙන් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. මෙම ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති SLPSAS I, II සහ III වෙළුම අනුව සකස් කර ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මූල්‍ය චක්‍රලේඛ අංක (2/2018) මගින් සම්මත කර ඇත. අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමට නොමැති අවස්ථාවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS භාවිතා කර ඇත.

### ආ. තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර, අඛණ්ඩව යොදා ගනු ලැබේ. සාධාරණ වටිනාකමට අනුව මනිනු ලබන දේපළ, පිරියත සහ උපකරණ සහ ජීවගණන වටිනාකම් ක්‍රමය මත පදනම්ව මනිනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා හැරුණු කොට මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. විශේෂිත ප්‍රතිපත්තිය පසුව එළඹෙන සටහන්වල පැහැදිලි කර ඇත.

### ඇ. අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවතීය යන පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත. පාලක සභාව මගින් පූර්වේක්ෂණය කළ හැකි අනාගතයේ දී විශ්වවිද්‍යාලය අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදු කර ඇත. තවද, කෙරී ගෙන යන්නක් ලෙස විශ්වවිද්‍යාලයේ හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් මතු කළ හැකි වැදගත් කිසිවක් පිළිබඳව පාලක සභාව දැනුවත් නොවන අතර, ඔවුන් විශ්වවිද්‍යාලය ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරනු නොලැබේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනම මත දිගටම සකස් කර තිබේ.

## ඈ. ගිණුම්කරණය පිළිබඳ උපචිත පදනම

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය පිළිබඳ තොරතුරු හැරුණු කොට, මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණය පිළිබඳ උපචිත පදනම අනුගමනය කරමින් සකස් කර ඇත.

## ඉ. කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

විශ්වවිද්‍යාලය විසින් භාවිත කරනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

## ඊ. වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයන් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙනම ඉදිරිපත් කර ඇත.

## උ. සංසන්දනාත්මක තොරතුරු

මෙයට පෙර මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ අදාළ වන පරිදි ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමඟ තුලනය කිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

## ඌ. වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වල අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකට දක්වා ඇති විට හැරුණු කොට ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

## එ. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනුවල දිනට පවතින හුවමාරු වටිනාකම භාවිත කරමින් හෝ අයිතම ප්‍රති මිනුම් වටිනාකම අනුව විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු කෘත්‍ය ව්‍යවහාර මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත.එවැනි ගනුදෙනු නිරවුල් කිරීමේ සහ විදේශ මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වසර අවසානයේ ඇති හුවමාරු අනුපාතිකයකට සිදු කරන ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සිදු වන විදේශ ව්‍යවහාර මුදල් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

# වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

## අ. SLPSAS යොදා ගැනීම

කැලණිය විශ්වවිද්‍යාලය 2022 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී SLPSAS අනුගමනය කර ඇත.

## ආ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ එක් වෙනසක් හැර ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනස්කම් සිදු නොවීය. විශේෂයෙන් ම, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණය ප්‍රතිකර්මය 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන විනිමය නොවන ගනුදෙනු - ප්‍රාග්ධනය සිට ආදායම දක්වා වෙනස් කර ඇත. ශ්‍රීලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය වන විනිමය නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම (බදු සහ ස්ථාන මාරු) SLPSAS 11 හි දක්වා ඇති පරිදි, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් අනුගමනය කිරීමෙන් මෙම වෙනස සිදු කෙරිණි. මෙම වෙනසෙහි ප්‍රතිඵලයක් ලෙස, සියලුම සංසන්දනාත්මක සංඛ්‍යා නැවත දක්වා ඇත.

මින් පෙර, බජ්ජ් භාවිතයේ නොතිබුණු බැවින්, LKAS 20 ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියට මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රාග්ධන වියදම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ඉදිරිපත් කිරීම අයත් විය. LKAS 20 ට අනුව, ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ විලම්භිත ආදායමක් ලෙස සටහන් කර, පසුව වත්කමේ ඵලදායී ජීව කාලය මත හිලව් කර ඇත.

ප්‍රාග්ධන ප්‍රදාන සඳහා අලුතින් සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමඟින්, ප්‍රාග්ධන වියදම් සඳහා වන රජයේ ප්‍රදාන දැන් SLPSAS 11 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන ප්‍රදානවලින් ලැබෙන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් ලෙස හඳුනාගෙන එය සමුච්චිත අරමුදල - අතිරික්ත ප්‍රාග්ධන ගිණුම වෙත මාරු කරනු ලැබේ. අනතුරුව මෙම මුදල පසුව මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සංචිත ගිණුමක් ලෙස පෙන්වන අතර, එය සමුච්චිත මුදලක් නියෝජනය කරයි.

## ඇ. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයෙහි මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී කළමනාකරණයට මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අවිනිශ්චිත වත්කම් සහ අවිනිශ්චිත වගකීම් හෙළිදරව් කිරීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට අවශ්‍ය වේ.

## ඇ. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### දේපළ, පිරියත සහ උපකරණ

විශ්වවිද්‍යාලය සේවා සැපයීමේ දී හෝ පරිපාලන කාර්යයන් සඳහා සහ වසරකට වැඩි කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කරමින් භාවිත කරනු ලබන හා දරනු ලබන හෝ එහි හිමිකාරත්වය ඇති වත්කම් සඳහා වගකීමේ දී 'දේපළ පිරියත සහ උපකරණ' සම්බන්ධයෙන් ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 07හි අවශ්‍යතාවන් අදාළ කරයි. දේපළ, පිරියත සහ උපකරණ සඳහා ඉඩම්, ගොඩනැඟිලි හා වැඩි දියුණු කිරීම්, ගෘහ භාණ්ඩ හා උපකරණ, රසායනාගාර සහ ශික්ෂණ උපකරණ, මෝටර් රථ, ජලය හා විදුලි සම්පාදන යෝජනා ක්‍රම, පුස්තකාල පොත් හා වාර සඟරා, ලෝගු, යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් ඇතුළත් වේ.

### හඳුනා ගැනීමේ පදනම

වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම්, ඒවා දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනී.

### මුල් හඳුනා ගැනීම

දේපළ, පිරියත සහ උපකරණ මූලික හඳුනා ගැනීමෙන් පසුව වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් තත්ත්වයට පත් කිරීමට, ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා දැරූ කිසියම් ආනුශංගික වියදම් ඇති ව මිල දී ගැනීමේ දී දැරූ පිරිවැය ඇතුළුව පිරිවැයට මූලිකව ම හඳුනා ගන්නා අතර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත අපවය වීම් අලාභ සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසු දරන ලද පිරිවැයට මනිනු ලැබේ.

<u>මූල්‍ය නොවන වත්කම් වාර්තාකරණය සඳහා උපරිම සීමාව</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකාරීත්වයේ පහසුව සඳහා සහ අඩු මූල්‍ය වටිනාකම් සහිත අයිතම විශාල සංඛ්‍යාවක් සඳහා ගිණුම් පවත්වාගෙන යාමට දැරීමට සිදුවන අධික පිරිවැය සහ වැඩි කාලසීමාව අවම කිරීමට සහ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එහි පහසුව සඳහා රුපියල් 15,000 ක උපරිම සීමාවක් හඳුන්වා දී ඇත. ඒ අනුව, පුස්තකාල පොත් සහ වාර සඟරා හැර රුපියල් 15,000 හෝ ඊට වැඩි වත්කම් මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන වාර්තා කළ යුතුය.

### පසු කාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණයක අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි

පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් අයිතමයේ ධාරණ අගයට හඳුනා ගනු ලැබේ. පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිස්ථාපිත කොටසේ ධාරණ අගය හඳුනා නොගනී.

දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා වන පිරිවැය දැරූ පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

## හඳුනා නොගැනීම

දේපළ, පිරියත සහ උපකරණයක අයිතමයක ධාරණ අගය එය බැහැර කරන විට හෝ එහි භාවිතාවෙන් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) හඳුනා නොගැනීම පිළිබඳ කිසියම් ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. ලාභ ආදායම ලෙස වර්ගීකරණය නොකරයි.

## ක්ෂය වීම්

සින්නක්කර ඉඩම් හැර වෙනත් දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක එක් එක් අංගය මත සරල රේඛීය පදනමක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ. වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ඇති විට සහ එම වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද පෙර දිනයේ සහ වත්කම හඳුනා නොගත් දිනයයි. වත්කමක් භාවිතය සඳහා ඇති අවස්ථාවේ සිට වත්කමේ ක්ෂයවීම් ආරම්භ වන අතර වත්කම අලෙවි කිරීම සඳහා දරා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින අතුරින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වේ.

ප්‍රවර්තන සහ තුලනාත්මක කාලපරිච්ඡේද සඳහා ඇස්තමේන්තු කළ ඵලදායී ජීව කාලය පහත දැක්වෙන පරිදි වේ:

වගුව 45 : වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීව කාලය

| මුළු වත්කම් ප්‍රමාණය | ඇස්තමේන්තු කළ ඵලදායී ජීව කාලය |
|---|---|
| ගොඩනැඟිලි සහ වැඩිදියුණු කිරීම් | 20 |
| කාර්යාල ගෘහභාණ්ඩ | 10 |
| කාර්යාල උපකරණ | 05 |
| රසායනාගාරය සහ ඉගැන්වීමේ උපකරණ | 05 |
| මෝටර් රථ වාහන | 05 |
| ජලය සහ විදුලිය සැපයුම් යෝජනා ක්‍රමය | 10 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 05 |
| ලෝගු | 05 |
| යන්ත්‍රසූත්‍ර | 05 |
| වෙනත් වත්කම් | 05 |

වත්කමේ ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ ආපසු ලබා ගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමේ ධාරණ අගය වහාම එහි ලබා ගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමේ ධාරණ අගය වහාම එහි ආපසු ලබා ගත හැකි අගයට ලියා හරින වත්කමේ අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය, යෝග්‍ය වන්නේ නම්, සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේ දී ම සමාලෝචනය කර ගළපනු ලැබේ.

බැහැර කිරීම් පිළිබඳ ලාභය සහ අලාභය ධාරණ අගයෙන් ලබන මුදල සැසඳීම මගින් තීරණය කරනු ලබන අතර, ලාභය (අලාභය) විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනවල හඳුනා ගනී.

## දේපළවලට එරෙහිව පවතින නඩු විභාග

නිරපේක්ෂ අයිතිය කැලණිය විශ්වවිද්‍යාලයට පැවරී තිබුණද, විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන ලද පහත සඳහන් ඉඩම් කැබලි දෙකට එරෙහිව අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී.

වගුව 46 : නඩු විභාග

| දේපළ | නඩු විභාගය |
|---|---|
| දුම්මලදෙණිය දම්මින්නගහවත්තේ B දරණ බිම් කැබැල්ල (පරිත්‍යාග) | දිසා අධිකරණය මාරවිල නඩුව අංක 1538/L |
| විශාලත්වය – රූඩ්:01 පර්චස්:23.33 | විශ්වවිද්‍යාලයට අයත් වෙන්නපුව ප්‍රදේශයේ පිහිටි දුම්මලදෙණිය නම් ඉඩමට හිමිකම් කියමින් විශ්වවිද්‍යාලයට සහ ලේඛකාධිකාරීවරයාට එරෙහිව තුන්වැනි පාර්ශ්වයක් විසින් ගොනු කර ඇත. නඩු කටයුත්තෙහි වටිනාකම රු. 4,005,000/- වේ. |
| රාගම තලගොල්ලහි තලගොල්ලවත්ත ඉඩම (පරිත්‍යාගය) | ගම්පහ දිසා අධිකරණයේ නඩු අංක 1225/L |
| විශාලත්වය˚ හෙක්ටයාරඃ 4.5916 | විශ්වවිද්‍යාලයට, උපකුලපතිවරයාට සහ ලේඛකාධිකාරීවරයාට එරෙහිව බාහිර පාර්ශ්වයක් විසින්, විශ්වවිද්‍යාලය සඳහා ජාඇල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් විශ්වවිද්‍යාලයට පවරා දී ඇති රජයේ ඉඩමක් වන රාගම වෛද්‍ය පීඨයේ දේපළවලින් කොටසකට හිමිකම් පාමින් ගොනු කරන ලද නඩුව. නඩු කටයුත්තෙහි වටිනාකම රු.1,000.00/- වේ. |

## උරුම වත්කම්

සමාජ විද්‍යා පීඨයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද පුරාවිද්‍යා කැණීම්වලදී හමුවූ ඓතිහාසික කෞතුක වස්තු වැනි උරුමයන් කිහිපයක් කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ. ප්‍රධාන පුස්තකාලයේ ඇති පැරණි කාසි සහ පොත් එකතුවක් සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පෞරාණික පුස්කොළ පොත්පත් එකතුවකි.

## පිරිවැය ආකෘතිය

හඳුනාගැනීමෙන් පසු ඉඩම් කාණ්ඩය හැර අනෙකුත් සියලුම දේපළ පිරියත සහ උපකරණ එහි පිරිවැය සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු අගයට පවත්වා ගෙන යනු ලැබේ. ඉඩම් එහි පිරිවැයට ගෙන යනු ලැබේ.

## ප්‍රත්‍යාගණන ආකෘතිය

දේපල පිරියත සහ උපකරණවල (ඉඩම්, ගොඩනැගිලි, ලෝගු, මෝටර් වාහන) පහත දැක්වෙන මූලික කාණ්ඩ හඳුනාගැනීමෙන් අනතුරුව, ඒවායෙහි සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකි ප්‍රත්‍යාගණිත අගයන්ගෙන් ගෙන ගොස් ඇති අතර, එනම් ප්‍රත්‍යාගණනය කළ දිනයට සාධාරණ වටිනාකමින් යම් පසුකාලීන සමුච්චිත ක්ෂය වීම් සහ පසුකාලීන සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පසු අගයයි. මෙම වත්කම් කාණ්ඩ සෑම වසර පහකටම වරක් සංඛ්‍යාතයකින් ප්‍රත්‍යාගණනය කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය, හානිකරණය පිළිබඳ යම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනයක දී සමාලෝචනය කෙරේ. එවැනි ඇඟවීමක් තිබේ නම්, ආපසු ලබාගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ අලාභයක් ලෙස හඳුනා ගැනේ.

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ විස්තර පහත පරිදි වේ:

වගුව 47 : ප්‍රත්‍යාගණන වත්කම්

| වත්කම් | ප්‍රත්‍යාගණනය කළ දිනය | ප්‍රත්‍යාගණනය කරන ලද්දේ | වත්කම්වල ධාරණ අගය | වත්කම්වල ප්‍රත්‍යාගණනය කළ අගය | ප්‍රත්‍යාගණන අතිරික්තය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 31.12.2018 | තක්සේරු දෙපාර්තමේන්තුව | 1,155,750,767 | 4,204,580,000 | 3,048,829,233 |
| ඉඩම් | 01.01.2019 | -do - | - | 700,210,000 | 700,210,000 |
| ගොඩනැගිලි | 31.12.2018 | -do - | 2,845,249,161 | 5,375,839,000 | 2,530,589,839 |
| ගොඩනැගිලි | 01.01.2019 | -do - | - | 118,599,000 | 118,599,000 |
| ලෝගු | 31.12.2018 | -do - | 884,446 | 12,020,320 | 11,135,874 |
| මෝටර් වාහන | 01.01.2018 | -do - | 27,838,603 | 114,940,000 | 87,101,397 |
| ඉඩම් | 31.12.2020 | -do - | 58,514,788 | 547,160,000 | 488,645,212 |
| ගොඩනැගිලි | 31.12.2020 | -do - | 39,826,218 | 62,850,000 | 23,023,782 |
| මෝටර් වාහන | 31.12.2022 | -do - | - | 168,785,000 | 168,785,000 |
| එකතුව | | | | | 7,176,919,337 |
| 2018.01.01 දිනට ප්‍රත්‍යාගණනය කළ අතිරික්ත ශේෂය | | | | | 1,121,260,134 |
| 2022.12.31 දිනට ප්‍රත්‍යාගණනය කළ අතිරික්ත ශේෂය | | | | | 8,298,179,471 |

දේපල බැහැර කරන අවස්ථාවේ දී ප්‍රත්‍යාගණන අතිරික්තය පොදු සංචිතයට මාරු කරනු ලැබේ.

## ආයෝජන

ආයෝජන ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජනයක් නියෝජනය කරයි. මෙම ආයෝජන SLFRS 09 ට අනුකූලව ගිණුම්ගත කර ඇත. ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජනය SLFRS 09 ට අනුව ක්‍රමක්ෂගත පිරිවැයට වර්ගීකරණය කර ඇත. ඒවා ආරම්භයේ දී සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, පසුව SLFRS 09 මගින් අවශ්‍ය වන පරිදි සඵලදායී පොලී අනුපාතයක් භාවිත කරමින් සාධාරණ වටිනාකමකින් ක්‍රමක්ෂය පිරිවැය අඩුකළ පසු අගයට මනිනු ලැබේ.

## කාර්යමණ්ඩල ණය

කාර්යමණ්ඩල ණයවලට ආපදා ණය, පරිගණක ණය, විශේෂ ආපදා ණය, වාහන ණය, කාර්යමණ්ඩල ණය සහ උපකුලපති අරමුදල් ණය ඇතුළත් වේ. කාර්ය මණ්ඩල ණය SLFRS 09 ට අනුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. SLFRS 09 හි නියම කර ඇති පරිදි ඕනෑම කාර්යමණ්ඩල ණයක් හානිකරණ අලාභයක් අපේක්ෂිත පිරිවැය ක්‍රමය මත හඳුනාගෙන ඇත.

## කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

වාර්තාකරණ දිනට සම්පූර්ණ නොකළ දේපළ, පිරියත සහ උපකරණ සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම්, කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, ප්‍රාග්ධන කෙරී ගෙන යන වැඩ සඳහා දැරූ පිරිවැය භාවිතය සඳහා පවතින විට දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කරනු ලැබේ.

## අස්පෘශ්‍ය වත්කම්

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායයට ගලා ඒමේ සම්භාවිතාව සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට පරිගණක මෘදුකාංග සහ මාර්ගගත සඟරා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පසු අගයට ප්‍රකාශ කෙරේ. මෙම පිරිවැයන් වසර 5 ක කාලයක් තුළ ක්‍රමක්ෂය කර ඇත.

## ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ පරිභෝජනය කිරීමට බලාපොරොත්තු වන ඒවා වන අතර, ඒවා වාර්තා කළ දිනට පසුව මාස දොළහක් ඇතුළත උපලබ්ධි වන හෝ මුදල් හෝ ඊට සමාන දෑ වේ.

### තොගය

තොගය පිරිවැයට ප්‍රකාශ කර ඇති අතර, පෙර පැමිණි පෙර නිකුතු FIFO පදනම මත තීරණය වේ. තොගය ප්‍රධාන වශයෙන් ලිපි ද්‍රව්‍යය සහ අමතර කොටස්වලින් සමන්විත වේ. තොගය පරිභෝජනය සඳහා මිස නැවත විකිණීම සඳහා නොවේ.

### මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල්වලට සමාන දෑ ලෙස අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි නොසැලකිය යුතු වෙනස් වීමේ අවදානමකට යටත්වන කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන අර්ථ දක්වා ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල්වලට සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවල තැන්පතු ඇතුළත් වේ. අත්පත් කරගත් දින සිට මාස හයක් හෝ ඊට අඩු කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන ද මුදල් හා සමාන දෑ ලෙස සලකනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත පදනම්ව සකස් කර ඇත.

## ආ. ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදානවලට ගිණුම් තැබීම

### පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිළිගනු ලැබේ. දේපළ පිරියත සහ උපකරණ පුනරුත්ථාපනය කිරීමේ පිරිවැය සහ ඉදිකිරීම් සහ නව වැඩ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන කෙරී ගෙන යන වැඩ ලෙස හෝ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනා ගනු ලැබේ.

### ප්‍රාග්ධන ප්‍රදාන

SLPSAS - 11 අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

## ඇ. බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය

ජනනය කරන ලද අරමුදල්වලින් සහ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් මිල දී ගත් දේපල පිරියත සහ උපකරණවල වටිනාකම "බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය " ලෙස පෙන්වා ඇත.

## ඈ. අභ්‍යන්තරිකව සීමා කළ අරමුදල්

අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල්වලට විශේෂිත අරමුණු සඳහා කැප කළ අරමුදල් ඇතුළත් වේ. සංවර්ධන අරමුදල් මගින් වසර අවසානයේ ශුද්ධ වියදම් නොකළ ශේෂයන් සහිතව විශ්වවිද්‍යාල/ පීඨ/ දෙපාර්තමේන්තු අරමුදල්වල සමුච්චිත තත්ත්වය නියෝජනය කෙරේ.

## ඉ. උපප්‍රදාන අරමුදල

පරිත්‍යාග අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග සහ පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත කරන ලද විවිධ අරමුණුවලට අනුකූලව භාවිතා කරන පරිත්‍යාග අරමුදල්වලින් ජනනය කරන ලද ආයෝජන ප්‍රතිලාභ ඇතුළත් වේ.

## ඊ. බදු

### ආදායම් බද්ද

පවතින බදු රෙගුලාසිවලට අනුව සාමාන්‍ය ව්‍යාපාරයේ ආදායම මත ආදායම් බදු ගෙවීමට විශ්වවිද්‍යාලය වගකීමෙන් බැඳී නොමැත.

### එකතු කළ අගය මත බද්ද

පවතින බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් කර ඇත.

### අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු (APIT)

විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවන ආදායම් බදු ගෙවීමට බැඳී සිටින සේවකයන්ගේ මාසික වැටුප්වලින් අඩු කරන ලද APIT බද්ද වර්තමානයේ දී විශ්වවිද්‍යාලය විසින් ප්‍රේෂණය කරනු ලබයි. එබැවින්, APIT බදු ගෙවීම විශ්වවිද්‍යාල ගිණුම්වල ගිණුම්ගත නොවේ.

## උ. සේවක ප්‍රතිලාභ

### නිර්වචනය

**<u>කෙටි කාලීන සේවක ප්‍රතිලාභ</u>**

සපයනු ලබන අදාළ සේවයත් සමඟ කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වැය කෙරේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන

නෛතික හෝ සාධනීය බැඳීමක් තිබේ නම්, ගෙවීමට අපේක්ෂා කරන මුදල සඳහා වගකීමක් හඳුනා ගැනෙන අතර, වගකීම විශ්වාසදායක ලෙස තක්සේරු කළ හැකිය.

## නිර්වාචිත දායකත්ව සැලැස්ම

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) දායක මුදල්, සේවක භාර අරමුදල (ETF), විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සේවකයින් සුදුසුකම් ලබන අතර, දායකත්ව මුදල් අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූල වේ. කැලණිය විශ්වවිද්‍යාලය විසින් මූලික පෞද්ගලික පාරිශ්‍රමික සහ ජීවන වියදම් දීමනා, අධ්‍යයන දීමනා සහ  විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක භාර අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල වෙත  සේවකයින්ගේ මාසික හිලව් ගෙවීම් මත ස්ථිර දායකත්වයන් ගෙවනු ලබන අතර, තවදුරටත් මුදල් ගෙවීම සඳහා නීතිමය හෝ ඵලදායී බැඳීමක් නොමැත. මෙම බැඳීම රැකියා ප්‍රතිලාභ පිළිබඳ SLPSA 19 හි අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ විෂය පථයට අයත් වේ. නිර්වචනය කරන ලද දායක සැලැස්මට දායක වීමේ වගකීම ආශ්‍රිත සේවාව සපයනු ලබන පරිදි ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

## නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව, සේවකයින්ට නිශ්චිත ප්‍රතිලාභ වගකීමක් සඳහා වගකීමක් පැන නඟී. එවැනි නිශ්චිත ප්‍රතිලාභ වගකීමක් යනු 'සේවක ප්‍රතිලාභ' පිළිබඳ SLPSAS-19 විෂය පථයට අයත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳියාවකි.

## නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මැනීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු වාර්තාකරණ දිනයේ දී නිර්වාචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකමයි. ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් සුදුසුකම්ලත් ආයුගණකයෙකු විසින් ගණනය කිරීම වාර්ෂිකව සිදු කෙරේ. ආයුගණක ලාභ සහ අලාභවලින් සමන්විත වන, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් නැවත මැනීම, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ එකෙණෙහි ම හඳුනා ගැනේ. විශ්වවිද්‍යාලය විසින් සේවකයින් විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂය තුළ සපයනු ලබන සේවාවන් (ප්‍රවර්තන සේවා පිරිවැය) සඳහා ආරෝපණය කළ හැකි නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්ල ඉහළ යෑම  හඳුනා ගනු ලැබේ. වට්ටම් අනුපාතය ව්‍යුත්පන්න කර ඇති අතර, අනාගත වගකීම් වට්ටම් කිරීමට වසරකට 18% ක දිගු කාලීන පොලී අනුපාතයක ආසන්න අගයක්  2021 - 11.5%  භාවිතා කර ඇත. වගකීමට බාහිරව අරමුදල් සපයනු නොලැබේ.

## ගිණුම්කරණ ඇස්තමේන්තුව

ජීවගණක තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතික පිළිබඳ උපකල්පන ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණත්වය, සලකා බලන උපකල්පන සහ එහි දිගු කාලීන ස්වභාවය, නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳියාව මෙම උපකල්පනවල වෙනස්කම්වලට

දැඩි වශයෙන් සංවේදී වේ. සියලුම උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදී ම සමාලෝචනය කෙරේ.

**<u>විශ්‍රාම පාරිතෝෂිකයේ ආයුගණක තක්සේරුව</u>**

වෘත්තීය ආයුගණකයන්ගෙන් සමන්විත ආයතනයක් වන, ආයුගණක සහ කළමනාකරණ විශේෂඥයෝ පුද්. සමාගම Actuarial Management Consultants (Pvt) Ltd විසින් 2022 දෙසැම්බර් 31 වන දිනට ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. ආයුගණක තක්සේරුවේ සාරාංශගත වාර්තාව පහත පරිදි වේ:

වගුව 48: විශ්‍රාම පාරිශ්‍රමිකවල ආයුගණක තක්සේරුව

| උපකල්පනය | 2022 | 2021 |
|---|---|---|
| **මූල්‍ය** | | |
| වට්ටම් අනුපාතිකය | වසරකට 18% | වසරකට 18% |
| **වැටුප් වර්ධක අනුපාතිකය** | | |
| අධ්‍යයන | මූලික වැටුප සහ දීමනා: 2022 වසර සඳහා 16.00% | මූලික වැටුප සහ දීමනා: 2021 වසර සඳහා 10.00% |
| අනධ්‍යයන | මූලික වැටුප සහ දීමනා: වසරකට 14.00% | මූලික වැටුප සහ දීමනා: වසරකට 8.00% |
| **ජනවිකාශ** | | |
| මරණ අනුපාතිකය | ලන්ඩනයේ Actuaries ආයතනය විසින් නිකුත් කරන ලද 1967/70 මරණ අනුපාතික වගුව. | |
| **විශ්‍රාම යෑමේ වයස** | | |
| අධ්‍යයන | වසර 65 | වසර 65 |
| අනධ්‍යයන | වසර 60 | වසර 62 |
| **කාර්යමණ්ඩල පිරිවැටුම්** | | |
| අධ්‍යයන | වයස අවු. 54 තෙක් මණ්ඩලය පුරා වසරකට 1.00% සහ ඉන් අනතුරුව ශූන්‍යයි. | වයස අවු. 54 තෙක් මණ්ඩලය පුරා වසරකට 1.00% සහ ඉන් අනතුරුව ශූන්‍යයි. |
| අනධ්‍යයන | වයස අවු. 54 තෙක් මණ්ඩලය පුරා වසරකට 0.50% සහ ඉන් අනතුරුව ශූන්‍යයි. | වයස අවු. 54 තෙක් මණ්ඩලය පුරා වසරකට 0.50% සහ ඉන් අනතුරුව ශූන්‍යයි. |
| **දුබලතාව** | | |
| අධ්‍යයන සහ අනධ්‍යයන | මරණ අනුපාතික වගුවෙන් 10% | මරණ අනුපාතික වගුවෙන් 10% |

**<u>සංවේදිතා විශ්ලේෂණය</u>**

නිර්වාචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමනාත අගයේ සංවේදිතා විශ්ලේෂණය (රුපියල්වලිනි)

වට්ටම් අනුපාතිකයෙහි ප්‍රතිශතාංක එකකින් ඉහළ යෑම (+1%) = 1,272,398,261

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාතිකයෙහි ප්‍රතිශතාංක එකකින් පහළ යෑම (-1%) | = | 1,489,560,224 |
| වැටුප් වර්ධක අනුපාතිකයෙහි ප්‍රතිශතාංක එකකින් ඉහළ යෑම (+1%) | = | 1,490,910,998 |
| වැටුප් වර්ධක අනුපාතිකයෙහි ප්‍රතිශතාංක එකකින් පහළ යෑම (-1%) | = | 1,269,713,555 |

## අ. වගකීම් සහ ප්‍රතිපාදන

### ජංගම වගකීම්

ජංගම වගකීම් ඒවායෙහි පොත් අගයට සඳහන් කෙරේ.

### ප්‍රතිපාදන

විශ්වවිද්‍යාලයට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැඳීමක් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යෑමක් අපේක්ෂා කරන බැඳීම් ඇති විට සහ බැඳීමේ අගය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වා ඇත. විශ්වවිද්‍යාලය බොහෝ දුරට ඇති විය හැකි ප්‍රතිඵලය පිළිබඳ ඇගයීමක මත පදනම් ව ඇස්තමේන්තුවකට එළඹෙයි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දැනුවත් ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

## ආ. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකම් අතීත සිදුවීමක් වැඩසටහනේ පාලනයෙන් බැහැර අනපේක්ෂිත අනාගත අවස්ථා එකක් හෝ වැඩි සංඛ්‍යාවක් සිදුවීමෙන් හෝ සිදු නොවීමෙන් මතුවන බැඳීමක් හෝ බැඳීම නිරවුල් කිරීම සඳහා සම්පත් පිටතට ගලා යෑමක් අවශ්‍ය විය හැකි බවට නිශ්චිත නොවීම හේතුවෙන් හඳුනා නොගන්නා වර්තමාන බැඳීමක් වේ.

| පීටර් සිල්වා ශිෂ්‍යත්ව අරමුදල - පොළිය | 25,304.73 | 21,494.15 |
| මහාචාර්ය පී. රණසිංහ ශිෂ්‍යත්ව අරමුදල - පොළිය | 147,161.98 | 84,801.32 |
| මහාචාර්ය එච්.එච්. කොස්තා අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල - පොළිය | 343,488.11 | 221,608.05 |
| මහාචාර්ය ශෙල්ටන් ගුණරත්න අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල - (පොළිය) | 1,531,984.97 | 1,116,754.84 |
| මහාචාර්ය මංගල ඉලංගසිංහ - පොළිය | 24,344.76 | - |
| රාජමන්ත්‍රී ශිෂ්‍යත්ව අරමුදල පොළිය | 197,457.92 | 145,650.00 |
| රත්නාකාර ශිෂ්‍යත්ව අරමුදල - (පොළිය) | 149,292.78 | 110,856.25 |
| එස්. ජයවර්ධන ශිෂ්‍යත්ව අරමුදල - පොළිය | 198,447.95 | 157,525.50 |
| ශිෂ්‍ය භාර ශිෂ්‍යත්ව අරමුදල (මානව සම්පත් කළමනාකරණය) - පොළිය | 483,713.23 | 426,112.41 |
| සුදත් කාලිංගමුදලි ශිෂ්‍යත්වය පොළිය | 45,984.59 | - |
| ඩබ්ලිව් එස්. කරුණාතිලක ශිෂ්‍යත්ව අරමුදල - පොළිය | 292,565.14 | 200,980.97 |
| **එකතුව** | **6,919,187.77** | **5,022,395.77** |

| 31 | පර්යේෂණ ප්‍රදාන | උප ලේඛන අංකය | 2022 | 2021 |
|---|---|---|---|---|
| | ජාතික විද්‍යා පදනමෙන් ලැබූ ප්‍රදාන | 31-1 | 6,167,550.50 | 7,857,197.00 |
| | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබූ ප්‍රදාන | 31-2 | 518,557.49 | 1,356,284.88 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබූ ප්‍රදාන | 31-3 | 1,953,111.90 | 1,223,112.00 |
| | වෙනත් ආයතනවලින් ලැබූ ප්‍රදාන | 31-4 | 151,433,649.55 | 115,176,822.00 |
| | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 31-5 | 12,560,390.44 | 10,555,500.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **172,633,259.88** | **136,168,915.88** |

| 31.1 | ජාතික විද්‍යා පදනමෙන් ලැබූ ප්‍රදාන (NSF) | 2022 | 2021 |
|---|---|---|---|
| | වසරේ ආරම්භක ශේෂය | 7,857,197.00 | 12,991,606.00 |
| | <u>**එකතු කළා**</u> | | |
| | වසර තුළ දී  ලද ප්‍රධාන | 1,242,108.00 | 2,208,545.00 |
| | <u>**අඩු කළා**</u> | | |
| | වසර තුළ දී සිදු කළ ගෙවීම් | 2,931,754.00 | 7,342,954.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,167,551.00** | **7,857,197.00** |

| 31.2 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබූ ප්‍රදාන | 2022 | 2021 |
|---|---|---|---|
| | වසරේ ආරම්භක ශේෂය | 1,356,284.88 | 1,512,798.00 |
| | <u>**එකතු කළා**</u> | | |
| | වසර තුළ දී ලද ප්‍රදාන | - | 800,000.00 |
| | <u>**අඩු කළා**</u> | | |
| | වසර තුළ දී සිදු කළ ගෙවීම් | 837,727.39 | 956,513.12 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **518,557.49** | **1,356,284.88** |

| 31.3 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පදනමෙන් ලැබූ ප්‍රදාන (UGC) | 2022 | 2021 |
|---|---|---|---|
| | වසරේ ආරම්භක ශේෂය | 1,223,111.90 | 463,912.00 |
| | <u>**එකතු කළා**</u> | | |
| | වසර තුළ දී ලද ප්‍රදාන | 745,000.00 | 1,584,800.00 |
| | <u>**අඩු කළා**</u> | | |
| | වසර තුළ දී සිදු කළ ගෙවීම් | 15,000.00 | 825,600.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,953,111.90** | **1,223,111.90** |

| 31.4 | වෙනත් ආයතනවලින් ලැබූ ප්‍රදාන | 2022 | 2021 |
|---|---|---|---|
| | වසරේ ආරම්භක ශේෂය | 115,176,822.00 | 90,205,987.00 |
| | <u>**එකතු කළා**</u> | | |
| | වසර තුළ දී ලද ප්‍රදාන | 132,074,212.40 | 75,021,847.00 |
| | <u>**අඩු කළා**</u> | | |
| | වසර තුළ දී සිදු කළ ගෙවීම් | 95,817,384.85 | 50,051,012.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **151,433,649.55** | **115,176,822.00** |

| 31.5 | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 2022 | 2021 |
|---|---|---|---|
| | වසරේ ආරම්භක ශේෂය | 10,555,500.00 | 10,853,844.00 |
| | **එකතු කළා** | | |
| | වසර තුළ දී ලද ප්‍රදාන | 4,678,747.69 | 2,693,047.00 |
| | **අඩු කළා** | | |
| | වසර තුළ දී සිදු කළ ගෙවීම් | (2,673,857.56) | 2,991,391.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **12,560,390.13** | **10,555,500.00** |

| 32 | අත්තිකාරම් ලෙස ලැබූ ආදායම | 2022 | 2021 |
|---|---|---|---|
| | බාහිර විභාග - විභාග ගාස්තු | 296,341,290.68 | 207,668,050.00 |
| | බාහිර විභාග - සම්මන්ත්‍රණ ගාස්තු | 65,724,777.77 | 68,633,777.77 |
| | ගාස්තු අය කරන පාඨමාලා - ඩිප්ලෝමා සහ සහතික | 229,953,997.39 | 145,660,621.74 |
| | ගාස්තු අය කරන පාඨමාලා - වෛද්‍ය | 5,647,877.90 | 5,049,269.90 |
| | ගාස්තු අය කරන පාඨමාලා - පශ්චාද් උපාධි | 438,649,289.63 | 360,578,191.80 |
| | ගාස්තු අය කරන පාඨමාලා - වෙනත් | 4,628,424.06 | 15,010,497.09 |
| | වෙනත් අභ්‍යන්තර වැඩසටහන් | 40,279,824.94 | 50,565,872.01 |
| | වෙනත් | 28,703,013.02 | 62,600,878.00 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,109,928,495.39** | **915,767,159.31** |

| 33 | විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම | 2022 | 2021 |
|---|---|---|---|
| | ජනවාරි 01 දිනට PV/DBO ප්‍රතිපාදනය | 1,371,839,011.29 | 1,391,445,943 |
| | PV/DBO මත ජීවගණක (ලාභය)/ අලාභය | (158,547,503.00) | (129,869,998.59) |
| | කාලපරිච්ඡේදය සඳහා ප්‍රවර්තන ප්‍රවර්තන සේවා පිරිවැය | 83,604,471.00 | 82,368,567.45 |
| | කාලපරිච්ඡේදය සඳහා පොළී පිරිවැය | 157,761,486.00 | 111,315,675.36 |
| | අඩු කළා: වසර තුළ සිදු කළ ගෙවීම් | (98,344,482.00) | (83,421,176.58) |
| | පසුගිය සේවා පිරිවැය | 17,440,079.00 | - |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,373,753,062.89** | **1,371,839,011.29** |

| 34 | ආපසු ගෙවිය හැකි තැන්පතු | 2022 | 2021 |
|---|---|---|---|
| | පුස්තකාල තැන්පතු | 43,129,645.97 | 58,267,445.97 |
| | වෙනත් තැන්පතු | 17,550.00 | - |
| | ආරක්ෂණ තැන්පතු | 56,429,168.69 | 43,336,311.19 |
| | ටෙන්ඩර් තැන්පතු | 1,153,850.00 | 601,177.75 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **100,730,214.66** | **102,204,934.91** |

| 35 | උපචිත වියදම් සහ වෙනත් ගෙවීම් | 2022 | 2021 |
|---|---|---|---|
| | උපචිත විගණන ගාස්තු | 1,687,000.00 | 5,110,000.00 |
| | කොන්ත්‍රාත් සේවා සඳහා උපචිත ගාස්තු | 27,853,999.67 | 41,788,535.55 |
| | ගාස්තු අය කරන පාඨමාලා සඳහා උපචිත ගාස්තු | 7,882,717.09 | 3,278,064.00 |
| | උපචිත නඩත්තු වියදම් | 36,138,903.45 | 5,603,869.24 |
| | උපචිත වෙනත් පුනරාවර්තන වියදම් | 16,496,424.40 | 54,051,812.41 |
| | උපචිත පෞද්ගලික පාරිශ්‍රමික | 57,552,599.82 | 38,436,395.71 |
| | උපචිත ගබඩා සැපයුම් | 15,004,477.14 | 18,273,786.93 |
| | උපචිත සැපයුම් වියදම් | 1,180,350.00 | 2,379,161.68 |
| | උපචිත ප්‍රවාහන වියදම් | 96,044.20 | 526,005.96 |
| | වෙනත් | 15,257,085.19 | 1,907,483.60 |
| | කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන | 4,081,354.32 | 4,111,481.32 |
| | කාර්යමණ්ඩල ආරක්ෂණ තැන්පතු | 65,448.65 | 63,490.12 |
| | මුද්දර තැන්පතු | 64,175.00 | 64,175.00 |
| | විවිධ ණයහිමියෝ | 8,912,654.00 | 3,180,194.28 |
| | විවිධ තැන්පතු | 14,938,376.65 | 11,338,564.46 |
| | **එකතුව** | **207,211,609.59** | **190,113,020.26** |

# 2022 අයවැයගත සහ තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය - 2022

වගුව 52 : අයවැයගත සහ තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය

රුපියල්වලින්

| ප්‍රවර්ගය | අයවැය - 2022 අ | අයවැය - 2022 ආ | විචලනය ඇ = අ - ආ | විචලනයෙන් % C/A*100 |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 4,510,000,000.00 | 4,464,375,298.80 | 45,624,701.20 | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 225,000,000.00 | 174,750,000.00 | 50,250,000.00 | |
| අභ්‍යන්තර ආදායම | 1,005,393,000.00 | 1,688,371,633.44 | (682,978,633.44) | |
| සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම් | 150,000,000.00 | 854,701,446.01 | 704,701,446.01) | |
| **මුළු ආදායම** | **5,890,393,000.00** | **7,182,198,378.25** | **(1,291,805,378.25)** | **-22%** |
| **වියදම්** | | | | |
| **පෞද්ගලික පාරිශ්‍රමික** | | | | |
| අධ්‍යයන කාර්යමණ්ඩලය | 3,204,023,000.00 | 3,209,918,483.80 | (5,895,483.80) | |
| අනධ්‍යයන කාර්යමණ්ඩලය | 1,105,977,000.00 | 1,079,411,093.81 | 26,565,906.19 | |
| **එකතුව** | **4,310,000,000.00** | **4,289,329,577.61** | **20,670,422.39** | **0%** |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | 500,000.00 | 372,187.50 | 127,812.50 | |
| විදේශීය | 9,500,000.00 | 6,587,491.31 | 2,912,508.69 | |
| **එකතුව** | **10,000,000.00** | **6,959,678.81** | **3,040,321.19** | **30%** |
| **සැපයුම්** | | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 53,058,000.00 | 58,438,244.36 | (5,380,244.36) | |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 25,112,000.00 | 34,329,639.32 | (9,217,639.32) | |
| නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 12,902,000.00 | 7,419,302.15 | 5,482,697.85 | |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 1,000,000.00 | 1,128,267.00 | (128,267.00) | |
| රසායනික සහ වීදුරු භාණ්ඩ | 9,329,000.00 | 14,203,708.75 | (4,874,708.75) | |
| වෛද්‍ය සැපයුම් | 593,000.00 | 1,491,537.20 | (898,537.20) | |
| වෙනත් සැපයුම් | 50,000,000.00 | 61,277,226.83 | (11,277,226.83) | |
| **එකතුව** | **151,994,000.00** | **178,287,925.61** | **(26,293,925.61)** | **-17%** |
| **නඩත්තු වියදම්** | | | | |
| වාහන | 15,920,000.00 | 19,462,196.50 | (3,542,196.50) | |
| දේපළ පිරියත සහ උපකරණ | 34,406,000.00 | 68,133,461.34 | (33,727,461.34) | |
| ගොඩනැගිලි සහ ව්‍යුහ | 800,000.00 | 777,301.00 | 22,699.00 | |
| ලී බඩු | 2,000,000.00 | 1,746,650.00 | 253,350.00 | |
| වෙනත් | 100,000.00 | 84,635.05 | 15,364.95 | |
| **එකතුව** | **53,226,000.00** | **90,204,243.89** | **(36,978,243.89)** | **-69%** |

| ප්‍රවර්ගය | අයවැය - 2022<br>අ | අයවැය - 2022<br>ආ | විචලයය<br>ඇ = අ - ආ | විචලයයෙන්<br>% C/A*100 |
|---|---|---|---|---|
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 100,000.00 | 48,565.00 | 51,435.00 | |
| විදුලි සංදේශ | 61,323,000.00 | 71,400,181.34 | (10,077,181.34) | |
| තැපැල් ගාස්තු | 5,000,000.00 | 4,955,314.00 | 44,686.00 | |
| විදුලි | 94,500,000.00 | 97,986,253.34 | (3,486,253.34) | |
| ආරක්ෂක සේවා | *21,000,000.00* | *56,755,370.08* | *(35,755,370.08)* | |
| ජලය | 5,000,000.00 | 32,193,367.08 | (27,193,367.08) | |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 56,247,000.00 | 63,682,595.30 | (7,435,595.30) | |
| කුලී සහ කුලී ගාස්තු | 39,576,000.00 | 45,847,534.67 | (6,271,534.67) | |
| පළාත් පාලන ආයතන වෙත ගාස්තු සහ බදු | 67,724,000.00 | 3,320,045.58 | 64,403,954.42 | |
| මුද්‍රණය සහ ප්‍රචාරණය | 45,149,000.00 | 55,640,582.61 | (10,491,582.61) | |
| වෙනත් | 15,100,000.00 | 15,283,483.45 | (183,483.45) | |
| **එකතුව** | **410,719,000.00** | **447,113,292.45** | **(36,394,292.45)** | **-9%** |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | |
| විශේෂ සේවා - සභාව සහ කාරක සභා | 7,327,000.00 | 7,032,076.74 | 294,923.26 | |
| විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් ගාස්තු | 195,000.00 | 164,100.00 | 30,900.00 | |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | 5,098,000.00 | - | 5,098,000.00 | |
| අධ්‍යයන පර්යේෂණය | 2,000,000.00 | 1,628,664.69 | 371,335.31 | |
| කාර්යමණ්ඩල සංවර්ධනය | 2,135,000.00 | 1,659,614.20 | 475,385.80 | |
| නිවාඩු, වරෙන්තු සහ වාර ප්‍රවේශපත් | 2,531,000.00 | 2,949,603.67 | (418,603.67) | |
| විනෝදාස්වාද වියදම් | 4,500,000.00 | 3,897,597.62 | 602,402.38 | |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 2,162,000.00 | 2,855,327.98 | (693,327.98) | |
| උපාධි ප්‍රදානය | 45,200,000.00 | 37,478,514.50 | 7,721,485.50 | |
| විභාග | 127,578,000.00 | 90,350,069.40 | 37,227,930.60 | |
| වෙනත් | 41,651,000.00 | 15,230,032.31 | 26,420,967.69 | |
| **එකතුව** | **240,377,000.00** | **163,245,601.11** | **50,710,431.20** | **21%** |
| **මුළු පුනරාවර්තන වියදම** | **5,123,090,000.00** | **5,084,936,075.59** | **11,732,956.72** | **0%** |
| **ප්‍රාග්ධන වියදම** | | | | |
| පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් | 80,000,000.00 | 62,103,609.90 | 17,896,390.10 | |
| වත්කම් අත්පත් කර ගැනීම් | 112,646,000.00 | 92,092,766.60 | 20,553,233.40 | |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 30,750,000.00 | 47,991,582.47 | 17,241,582.47) | |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 1,604,000.00 | 2,725,129.38 | (1,121,129.38) | |
| පර්යේෂණය ශක්තිමත් කිරීම | - | 50,000.00 | (50,000.00) | |
| **මුළු ප්‍රාග්ධන වියදම** | **225,000,000.00** | **204,963,088.35** | **20,036,911.65** | **9%** |
| **මුළු වියදම** | **5,348,090,000.00** | **5,289,899,163.94** | **31,769,868.37** | **1%** |

# විගණන තොරතුරු

UNIVERSITY OF KELANIYA

# විගණකාධිපතිවරයාගේ වාර්තාව



Council Memo No. 515/20/12

51

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } WPCG/GP/D/1/22/18

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජුනි 12 දින

13 JUN 2023
Registrar's Office
University of Kelaniya

16 JUN 2023

උපකුලපති,

කැලණිය විශ්වවිද්‍යාලය.

කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ජේ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

52

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

13 JUN 2023

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | WPCG/GP/D/UOK/1/22/18 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதි / Date |

R,B
Circulate to Council
13/6/2023

16 JUN 2023

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

DIA Circulated among the council on 13/06/2023 (515 Mtg) FNA 2023/06/16 R

කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

53

## 1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානය යොමුව | නිරීක්ෂණ |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, | |
| (i) මුදල් රෙගුලාසි 371 | 2015 – 2022 කාලය තුල විශ්වවිද්‍යාලය විවිධ කාර්යයන් සඳහා අවස්ථා 89 කදී ලබා දී තිබුණු එකතු වටිනාකම රු.6,875,758 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර 02 කට වැඩි කාලයක සිට පවතින එකතු වටිනාකම රු.31,150,036 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු ද වසර 05 කට වැඩි කාලයක සිට පවතින පුස්තකාල තැන්පතු රු.6,059,000 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඖ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) නිලධාරීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,021,205 ක් වූ ණය මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණය හිමියන් යටතේ දක්වා තිබුණු 2019 ජනවාරි සිට 2022 ජූනි දක්වා කාලයට අදාළ එකතු වටිනාකම රු.5,837,960 ක් වූ අවලංගු කළ චෙක්පත් 359 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීමෙන් පසුව බැඳුම්කර කඩකළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 36 දෙනෙකුගෙන් එකතුව රු.331,889,180 ක් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. නිලධාරීන් 11 දෙනෙකුට අදාළව එකතුව රු.148,125,179 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකර නොතිබුණි.

(ඈ) වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයට මහල් 10 කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන සේවා සපයන ආයතනය වෙනුවෙන් 2020 හා 2021 වර්ෂ වලදී එකතුව රු.15,013,437 ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණු නමුත් අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

57

(ඉ) 2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අතරමගදී අවසන් කිරීමට 2021 ජූනි 21 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) ගේ ලිපියේ උපදෙස් පරිදි කටයුතු කර දෙපාර්ශවයේ එකඟතාවය මත ගිවිසුම් අවලංගු කිරීමට සිදුවීම නිසා කොන්ත්‍රාත්කරු වෙත අමතරව ගෙවීම් ලෙසට රු.4,029,430 ක් ගෙවීමට සිදු වී තිබුණි. තවද අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.32,698,197 ක වැඩ අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ඊ) ශිෂ්‍යත්ව හා ත්‍යාග මුදල් ආයෝජනය මත සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.3,691,428 ක් වූ පොලී ආදායමින් රු.402,986 ක් පමණක් අදාළ අරමුණු වෙනුවෙන් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,575,335 ක් වූ පොලී ආදායමක් අදාළ අරමුණ වෙනුවෙන් වැයකර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලයේ අංශ 22 ක් සඳහා හදිසි අවශ්‍යතාවයන් ලෙසට දක්වමින් වටිනාකම රු.4,726,000 ක් වූ බහු ප්‍රක්ෂේපන යන්ත්‍ර 34 ක් මිලදී ගැනීමට ක්‍රියාකර එම යන්ත්‍ර 2022 අප්‍රේල් 21 දින ගබඩාවට ලැබී තිබුණි. ගබඩාවට ලැබී මාස 2කට වැඩි කාලයකින් පසු එනම් 2022 ජූලි 05 සිට නොවැම්බර් 24 දක්වා අතර කාලය තුළ ඉන් යන්ත්‍ර 28 ක් පමණක් ඉල්ලුම්කළ අංශ වෙත බෙදාදී තිබුණි.

(ඌ) බාහිර උපාධි පාඨමාලා වෙනුවෙන් 2016 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ පාඨමාලා ආරම්භ කිරීම 2019 මාර්තු දක්වාත් 2017, 2018, 2019 අධ්‍යයන වර්ෂ තුන වෙනුවෙන් 2022 ජූනි දක්වාත් ප්‍රමාද වී තිබුණි. අධ්‍යයන වර්ෂ සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ප්‍රමාදවීම, නියමිත කාලයට විභාග පැවැත්වීමට නොහැකිවීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට වැඩි කාලයක් ගතවීම ආදී කරුණු නිසා බාහිර උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලියාපදිංචි සිසුන්ට වැඩි කාලයක් ගත වී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.6,472,850 ක් භාවිතා කර පර්යේෂණ කාර්යයන් 22ක් සිදුකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් පර්යේෂණ කාර්යයන් 4ක් සඳහා රු. 390,025ක් පමණක් වැයකර තිබුණි.

(ඒ) අධ්‍යයන පීඨ 6 සඳහා අනුමත ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය 814 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යමණ්ඩලය 679 ක් විය. ඉන් 135 දෙනකු සප්ත වාර්ෂික නිවාඩු හා අධ්‍යයන නිවාඩු ලබා ගැනීම නිසා විශ්වවිද්‍යාලයේ 14532 ක් වූ ශිෂ්‍යයන්ට සක්‍රිය ලෙස අධ්‍යයන කටයුතු සිදු කිරීමට හා විෂය නිර්දේශ ආවරණය කිරීමට බාහිර දේශකයින්ගේ සහය ලබා ගෙන තිබූ අතර 2022 වර්ෂය තුලදී පමණක් බාහිර දේශක ගාස්තු ලෙස රු.28,103,205 ක් ගෙවා තිබූ අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 56 ක වැඩිවීමක් විය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය

මගේ අංකය :- UK/IA/04/WPCG/GP/D/UOK/1/22/18/Final

ඔබේ අංකය :- WPCG/GP/D/UOK/1/22/18

2023 සැප්තැම්බර් 18 දින

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

ඔබගේ ඉහත සමාංකය සහ 2023 ජූනි 12 දින දරන කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත ඉදිරිපත් කෙරේ.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

(i) මුදල් රෙගුලාසි 371

2015-2022 කාලය තුල විශ්වවිද්‍යාලය අවස්ථා 89 කදී ලබා දී තිබූ රු. 6,875,758.22 ක් වූ අත්තිකාරම් ශේෂයට අදාළ අත්තිකාරම්වල වර්තමාන තත්ත්වය පහත දැක්වේ.



University of Kelaniya, Kandy Road, Dalugama, Kelaniya 11600, Sri Lanka.
Web: www.kln.ac.lk | Email: info@kln.ac.lk
+94 11 2 911391, +94 11 2 911397, +94 11 2 910164, +94 11 2 911407, +94 11 2 913854-8

| අත්තිකාරම | 2022/12/31 දිනට ශේෂය රු. | පියවීම් රු. | 2023/07/07 දිනට ශේෂය රු. | පැහැදිලි කිරීම |
|---|---|---|---|---|
| 2305051 | 1,684,345.00 | 1,619,110.00 | 65,235.00 | ලබා ගත් අත්තිකාරම් මුදලින් රු. 1,619,110.00 ක පියවීම් සිදු කර ඇත. ඉතිරි රු. 65,235 ක මුදල සඳහා අත්තිකාරම් පියවීම් වවුචර්පත් ලැබී තිබුනුත් එම වවුචර්පත්වල අඩුපාඩු සකස් කිරීම සඳහා නැවත අදාළ අංශ වෙත යොමු කර ඇත. |
| 2305001 | 2,662,673.93 | 2,633,673.93 | 29,000 | මිශ්‍ර අත්තිකාරම් යටතේ පෙන්වා ඇති රු.2,662,672.93 ක මුදලින් මේවන විට රු.2,633,672.93 මුදලක් පියවා ඇති අතර ඉතිරිව ඇත්තේ රු.29,000.00 මුදලක් පමණි. එම අත්තිකාරම් පියවීම සම්බන්ධව සිහිකැඳවීම් ලිපියක් 2023/03/10 වන දින යවා ඇත.<br>• එම්.එම්. පෙරේරා - රු.29,000.00 |
| 2305004 | 47,050.00 | - | 47,050.00 | රු. 47,050.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගත් කේ.වී.ඩී.ඒ.එස්. ගුණරත්න මහතා සේවය අතහැර විදේශගත වී ඇති බැවින් එම මුදල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 2305053 | 937,290.36 | 710,075.36 | 227,215.00 | අත්තිකාරම් මුදල වන රු.937,290.36 ක මුදලින් රු.710,075.36 ක් පියවීම් කර ඇති අතර රු. 227,215.36 ක මුදලක් සඳහා පියවීම් වවුචර්පත් ලැබුන ද අඩුපාඩු ඇති හෙයින් එම අඩුපාඩු සකස් කිරීමට අදාළ අංශවලට ආපසු යවා ඇත. |
| 2305055 | 354,151.00 | 128,102.15 | 226,048.85 | රු. 354,151.00 අත්තිකාරම් වලින් රු. 128,102.15 ක් පියවීම් සිදු කර ඇත. ඉතිරි අත්තිකාරම් පියවීම් සඳහා වවුචර්පත් ලැබුන ද එම වවුචර්පත් වල අඩුපාඩු නිරීක්ෂණය වූ බැවින් අඩුපාඩු සකස් කිරීම සඳහා නැවත අදාළ අංශ වෙත යොමු කර ඇත. |
| 2305002 | 393,350.00 | 393,350.00 | - | ලෙජර් ගිණුම්අංක 2305002 දරන ගිණුම තුළ 2022.12.31 දිනට වූ රු.393,350.00 ක් වූ ශේෂයට අදාළ සියලුම අත්තිකාරම් පියවීම කටයුතු මේ වනවිට සිදු කර අවසන්ය. |
| 2305054 | 385,148.93 | 365,148.93 | 20,000.00 | 2305054 දරණ අත්තිකාරම් ගිණුමේ 2022/12/31 දින පැවති රු.385,148.93 ක් වූ ශේෂයෙන් රු. 20,000.00 ක හැර ඉතිරි සියල්ල මේ වන විට පියවා ඇත. නොපියවූ රු. 20,000.00 පිළිබඳ සිහි කැඳවීම් යවා ඇත. |
| 2305045 | 233,250.00 | 233,250.00 | - | 2305045 දරණ අත්තිකාරම් ගිණුමේ 2022/12/31 දින පැවති රු.233,250.00 ක ශේෂය මේ වනවිට පියවා ඇත. |
| 2302009 | 280,500.00 | - | 280,500.00 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වෛද්‍ය පීඨයට අදාළ 2302009 යන විදුලිය සඳහා රු. 280,500.00 ක තැන්පතුව සටහන් අංක 24.1 මිශ්‍ර අත්තිකාරම් යටතේ පෙන්වා ඇති අතර, එම තැන්පතු මුදල සටහන් අංක 24.3 තැන්පතු යටතේ ඇතුලත් කළ යුතු බැවින් 2023 වර්ෂය වෙනුවෙන් ගිණුම් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සැකසීමේදී එය නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදී. |
| 2305052 | (102,000.00) | (102,000.00) | - | සේවයෙන් විශ්‍රාම ගත් පහත සඳහන් අයගෙන් අයවිය යුතුව තිබූ මුදල් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගෙන දෝෂ සහගත ලෙස 60 වන සංවත්සර අත්තිකාරම් ගිණුමට බැර කර ඇත. මේ හේතුවෙන් මෙම ගිණුමෙහි බැර ශේෂයක් දැක්වුණු අතර මේ වන විට අදාළ වරද නිවැරදි කර ඇත.<br><br>අනුර ජයතිලක මහතා රු. 2,000<br>S.H. තිසේරා මහතා රු. 100,000 |
| එකතුව | 6,875,758.22 | 5,980,709.37 | 895,048.85 | |

(ii) මුදල් රෙගුලාසි 571

පුස්තකාල තැන්පතු රු. 22,406,500.00 ක් විවිධ ආදායමට මාරු කිරීම සඳහා 2023.02.02 දිනැති 2023/01 වන මුදල් කමිටු නිර්දේශය මත 2023.02.14 දිනැති 511 වන පාලක සභා අනුමැතිය ලබා ගෙන ඇත.

ඒ අනුව පුස්තකාල තැන්පතු ගිණුමේ 2016 වර්ෂය දක්වා පැවති රු. 22,406,500.00 ක මුදල 2022 වර්ෂයේ ජ්නල් අංක (301) FGS මගින් විශ්වවිද්‍යාලයේ මිශ්‍ර ආදායම් ගිණුමට මාරු කරන ලදී. 2017 වර්ෂයට අදාළ සිසුන් අධ්‍යයන කටයුතු අවසන් කර පුස්තකාල තැන්පතු ආපසු ලබා ගැනීම සඳහා මේ වන විට ඉල්ලුම් කරමින් පවතී. ඉදිරියේදී මෙම මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් ගෙවීම් කිරීමට හැකිවනු ඇත.

ටෙන්ඩර් තැන්පතු සහ ආරක්ෂක තැන්පතු විවිධ ආදායමට මාරු කිරීම සඳහා ඉදිරි මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

2.3 වෙනත් කරුණු

(අ) නිලධාරීන් 18 දෙනෙකු වෙත ලබාදී ඇති ණය මුදල් අයකර ගත හැක්කේ ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිදහස් කරනු ලබන අවස්ථාවේදීය.

පේරාදෙනිය විශ්වවිද්‍යාලයට ස්ථාන මාරු ලබා සිටින පුද්ගලයින් දෙදෙනෙකුගේ ණය මුදල් 2023 වසරේ සිට වාරික වශයෙන් අඩුකිරීම් සිදුවේ. මේ වන විට තවත් කාර්යමණ්ඩල සාමාජිකයකුගේ අර්ථසාධක අරමුදල් 2023 වර්ෂයේදී නිදහස් කර ඇති අතර එම අයගේ අර්ථසාධක ණය ශේෂය වන රු. 133,312.00 ක් සහ පරිගණක ණය මුදල් රු.9,500.00 ක් අර්ථසාධක අරමුදලින් අයකරගනු ඇත.

(ආ) 2022.12.31 දිනට අවලංගු කල යුතු චෙක්පත් රිසිට් අංක 1071, 1072, 1070, සහ 1069 මගින් 2023.05.18 දින නිවැරදි කර ඇත.

(ඇ) අනධ්‍යයන කාර්යමණ්ඩලයේ එක් අයෙකුගෙන් බැඳුම්කර කඩවීම මත රු. 1,167,436 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතුව පැවති අතර අදාළ මුදල අයකර ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී. එම අය නමින් බැරවුන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය (ණය ශේෂ අඩු කළ පසු වටිනාකම) මගින් මෙම බැඳුම්කරයේ සැලකිය යුතු වටිනාකමක් අයකර ගැනීම සඳහා මෙම සාමාජිකයාගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත.

බැඳුම්කර මුදල් අයවිය යුතු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් 11 දෙනාගෙන් තිදෙනෙකුට නඩු පවරා ඇති අතර එම අයගෙන් එක් කාර්යමණ්ඩල සාමාජිකයකු නඩු කටයුතු වලින් ඉවත් වී සම්පූර්ණ ගෙවීම සිදු කර ඇත. එසේම තවත් තිදෙනෙකු ගෙවා අවසන් කර ඇත. ඒ අනුව මුළු කාර්යමණ්ඩල සාමාජිකයයින් 11 දෙනාගෙන් 4 දෙනෙකු සම්පූර්ණ බැඳුම්කර මුදල් ගෙවා අවසන් කර ඇත. තවත් කාර්යමණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකු එම අයගේ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් බැඳුම්කරය පියවීම වෙනුවෙන් ලබා දීමට කැමැත්ත දී ඇති බැවින් එම කටයුතු සිදු කරගෙන යන අතර ඉතිරි මුදල් ඔවුන් විසින් ගෙවා අවසන් කර ඇත. එක් අයෙකුට ගෙවීම් ආරම්භ කරන ලෙස දන්වා අවසාන සිහි කැඳවීම් ලිපි යවා ඇත.

(ඈ) වාණිජ හා කළමනාකරණ පීඨයේ මහල් 10කින් යුතු පීඨ ගොඩනැගිල්ල සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 1,417 ක් වන අතර මිහිඳු කීර්තිරත්න ඇසෝසියේට් ආයතනය වෙත උපදේශන සේවාව සඳහා රු.51,110,300+VAT අගයට උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. මෙතෙක් උපදේශන ආයතනය වෙත ගෙවා ඇති මුදල රු.15,013,437.50 වේ. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 04/2022 අනුව රජයේ ඉදිකිරීම් කටයුතු නවතා දමන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් අදාළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නවතා ඇත.

(ඉ) මහල් 4කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම සිව්මහල් ගොඩනැගිල්ලේ වැඩ සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගෙවීම් කර ඇත.

(ඊ) ශිෂ්‍යත්ව අරමුදල් හා ත්‍යාග අරමුදල් විද්‍යාර්ථීන්ට ප්‍රදානය කිරීම සඳහා ඒ ඒ අරමුදල් වල නිර්නායකයන්ට අනුව අදාළ අධ්‍යයන අංශය මගින් සුදුසුකම් ලබන විද්‍යාර්ථීන් නම්කර ඒ සඳහා පළමුව පීඨ මණ්ඩල, සනාතන සභා සහ පාලක සභා අනුමැතිය ලබා ගත යුතුය. එම අරමුදල් පිරිනැමිය හැක්කේ අදාළ අධ්‍යයන අංශ මගින් ඉහත අනුමැතීන් ලබා ගැනීමෙන් පසුවය. මෙම බොහෝ අරමුදල් සඳහා සුදුස්සන් තෝරා ගන්නේ ප්‍රථම වසර හෝ අවසන් වසර විභාග ප්‍රතිඵල මතය. එම නිසා අධ්‍යයන වර්ෂය අවසන් වනතෙක් මෙම නිර්දේශ ඉදිරිපත් නොවන අතර අධ්‍යයන වර්ෂය මූල්‍ය වර්ෂය හා සමගාමී නොවේ. එය ද ඇතැම් ශිෂ්‍යත්ව 2022 මූල්‍ය වර්ෂය ඇතුලත ප්‍රදානය කිරීමට හේතුවක් විය හැක.

ඒ අනුව **2022.06.02 දින සිට 2023.06.26** දින තෙක් ඉහත පටිපාටිය අනුගමනය කිරීමෙන් අනතුරුව ශාස්ත්‍රීය අංශය මගින් ප්‍රදානය කර ඇති ශිෂ්‍යත්ව අරමුදල්, ත්‍යාග අරමුදල් හා වෙනත් අරමුදල්හි ප්‍රදානය කිරීම්හි තොරතුරු පහත දැක්වේ.

| No. | Name of the Scholarship | Date of Scholarship awarded | Type of Scholarship | Amount Rs. | Student No. |
|---|---|---|---|---|---|
| 01 | P.A.P.A.Chandrasekara Prize Fund | 02/06/2022 | Cash | 20,000.00<br>20,000.00<br>20,000.00<br>20,000.00<br>20,000.00<br>20,000.00<br>20,000.00 | HS/2016/2046<br>HS/2017/0976<br>HS/2017/0980<br>HS/2017/0500<br>HS/2015/0861<br>HS/2015/0883<br>HS/2018/1506 |
| 02 | Derick De Souza Memorial Prize Fund | 13/05/2022 | Cash | 1,200.00 | HS/TE18/0034 |
| 03 | Rev.Sik Vin Sin Prize Fund | 02/06/2022 | Cash | 5,000.00<br>5,000.00<br>5,000.00<br>5,000.00 | HS/2018/0904<br>HS/2018/0230<br>HS/2018/0051<br>HS/2018/0864 |
| 04 | Hawanpola Sri Rathanasara Scholarship Fund | 02/06/2022 | Cash | 10,000.00 | HS/2017/0107 |
| 05 | Rev.Kudawelle Wangeesa Prize Fund | 27/06/2022 | Cash | 10,000.00 | HS/2018/0513 |
| 06 | Prof.W.S.Karunathilaka Scholarship Fund | 28/06/2022 | Cash | 8,036.50<br>8,036.50<br>8,036.50<br>8,036.50 | HS/2018/0513<br>HS/2017/0070<br>HS/2016/0349<br>HS/2015/1181 |
| 07 | F.R.Jayasooriya | 05/07/2022<br>19/12/2022 | Cash<br>Gold Plated Medal | 1,000.00<br>4,500.00 | HS/2018/0942<br>HS/2015/0581 |
| 08 | S.Jayawardena Scholarship Fund | 27/06/2022 | Plated Gold Medal | 3,500.00 | BS/2014/222 |
| 09 | S.B.P.Wickramasooriya Scholarship | 16/08/2022 | Cash | 5,000.00 | PS/2015/175 |
| 10 | Botany Society Scholareship | 12/09/2022 | Cash | 5,000.00<br>5,000.00<br>5,000.00 | BS/2017/182<br>BS/2016/066<br>BS/2016/142 |
| 11 | Prof.Leenas Silva Scholarship | 25/08/2022 | Pated Gold Medal | 5,000.00 | CM/2015/054<br>CM/2014/142 |
| 12 | F.R.Jayasooriya | 12/09/2022 | Plated Gold Medal | 4,500.00 | HS/2015/1024 |
| 13 | Egnas Peduru | 29/12/2022 | Cash | 5,000.00 | BS/2018/143 |
| 14 | Prof.Leenas Silva | 25/08/2022 | Two plated Gold Medal | 10,000.00 | CM/2015/054<br>CM/2014/142 |
| 16 | Prof.H.H.Costa | 18/05/2023 | Cash | 36,000.00<br>36,000.00 | BS/2020/171<br>BS/2020/179 |
| 17 | Botany Socity | 12/09/2022<br><br><br>29/12/2022 | Cash<br><br><br>Cash | 5,000.00<br>5,000.00<br>5,000.00<br>5,000.00 | BS/2017/182<br>BS/2016/066<br>BS/2016/142<br>BS/2017/182 |
| 18 | J.K.P.Ariyarathne | 29/09/2022 | Cash | 3,000.00 | BS/2016/002 |
| 19 | Prof.Piyadasa Ranasinghe | 01/10/2022 | Two plated Gold Medal | 9,000.00 | HS/2014/0591<br>HS/2015/1259 |
| 20 | Prof.D.J.Wijerathna Scholarship | 20/06/2023 | Plated Gold Medal | 4,500.00 | HS/2016/113 |
| | **Total** | | | **393,846.00** | |

තවද 2022 මූල්‍ය ප්‍රකාශන විමසීමෙන් අනතුරුව සැලකිය යුතු පොලී ශේෂයක් එම ශිෂ්‍යත්ව අරමුදල් වල උපරිම භාවිතයෙන් තොරව පවතින බැවින් සියළු පීඨාධිපතිවරුන් හා අංශාධිපතිවරුන්ගේ අවධානයට යොමු කර විද්‍යාර්ථීන්ට ප්‍රතිලාභ වැඩිපුර ලබා ගත හැකි පරිදි එම නිර්නායක සංශෝධනය කිරීමට කටයුතු කරන ලදි.

ඒ අනුව ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් 07 ක නිර්නායක සංශෝධනය කර මේ වන විටත් සනාතන සභා අනුමැතිය ලැබී ඇත. මේ අනුව විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති තත්ත්වය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බැවින් ඉදිරියේදී මෙම උපයෝජනය වඩා ඵලදායක වනු ඇත.

(උ) මෙම බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 34 ගබඩාවට ගෙවිත් දුන් පසු තොරතුරු හා තාක්ෂණ මධ්‍යස්ථානය මගින් ඒවාහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමට පත් වූ පසු අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, 2022.12.12 වන විට ගබඩාව වෙත භාර දුන් බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 34 ම අදාළ අංශ වෙත නිකුත් කර ඇත.

(ඌ) 2012/13 අධ්‍යයන වර්ෂයේ දී ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව, ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව, වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් 27,700 ක් පමණ සුදුසුකම් ලැබූ අතර සුදුසුකම් සැපිරූ සියලුම සිසුන් බඳවා ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කැලණිය විශ්වවිද්‍යාලය වෙත උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට හා විශ්වවිද්‍යාලයට කළමනාකරණය කළ නොහැකි තරම් අධික සිසුන් ප්‍රමාණයක් ලියාපදිංචි කිරීමට සිදුවිය. එහි දී එම සිසුන් හට අදාළ සම්මන්ත්‍රණ ප්‍රාදේශීය වශයෙන් පැවැත්වීම සහ අධ්‍යයන සහාය ලබා දීම කණ්ඩායම් වශයෙන් සිදුකරන ලදී. මේ හේතුවෙන් දිගින් දිගටම ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු 2014/2015/2016 අධ්‍යයන වර්ෂවලදී ප්‍රමාද විය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිසුන් ලියාපදිංචිය තාවකාලිකව නවතා දැනට පවතින පාඨමාලා සහ විෂය සංශෝධනයක් සිදුකර නැවත ලියාපදිංචිය ආරම්භ කරන ලෙස නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව සිසුන් ලියාපදිංචි කිරීම තාවකාලිකව නවතා තිබූ අතර 2017,2018 හා 2019 අධ්‍යයන වර්ෂ තුන සඳහා 2021 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව නැවත සිසුන් ලියාපදිංචි කිරීම සිදුකරන ලදී. ඒ අනුව 2019 අධ්‍යයන වර්ෂයට අදාළව ලියාපදිංචි වූ සිසුන්ගේ අධ්‍යයන වර්ෂය ආරම්භ වූ දින සිට වසරකින් පසු ප්‍රථම පරීක්ෂණය පවත්වා දැනට විෂයයන් කිහිපයක ප්‍රතිඵල නිකුත් කර ඇත.

(එ) 2022 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත පර්යේෂණ ව්‍යාපෘති 22 ක් අතුරින් පර්යේෂකවරුන්ගේ ඉල්ලීම් මත 2023.07.07 දිනට පර්යේෂණ ව්‍යාපෘති 13 ක් සඳහා දැනට රු.1,659,463.92 ක් මුදාහැර ඇති අතර පර්යේෂකවරුන්ගේ අවශ්‍යතාවය මත හා පර්යේෂණ පවත්වාගෙන යන කාලය තුළ දී වරින් වර මෙම මුදල් මුදාහැරීමට කටයුතු කෙරෙනු ඇත.

(ඒ) අධ්‍යයන පීඨ 06 සඳහා අනුමත ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය 829 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 677 කි. මේ වන විට සියළුම පීඨ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩළය බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා අවසන් කර ඇත. මෙම බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතියට යොමු කරන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් විශ්වවිද්‍යාල වෙත යොමු කර ඇති 2022.02.22 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බැවින් අනුමැතිය ලැබුණු විගස එම පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**විගණන විමසුම සඳහා කරන ලද ඉහත දැක්වෙන සියළුම පැහැදිලි කිරීම් නිවැරදි බවට මා විසින් පෞද්ගලිකවම සහතික වෙමි.**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
**උපකුලපති**

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් :- | 01 | ලේකම් | :- | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | 02 | ලේකම් | :- | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| | 03 | සභාපති | :- | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

# විගණන කමිටු වාර්තාව

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
05 SEP 2023
3212

**විගණන කමිටු වාර්තාව - 2022**

**විගණන කමිටුවේ සංයුතිය**

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2022 වසරේ දී පහත සඳහන් සාමාජිකයින් විගණන කමිටු කාර්යයන්හි නියුක්ත වූහ.

| සාමාජික | 2022 වසරේ දී කමිටුවට සහභාගී වීම (සහභාගී වීම/සහභාගී වීමට නියමිත) |
|---|---|
| 1. එල්.ඒ. සුසන්ත සිල්වා මහතා (සභාපති) | 4/4 |
| 2. සංජය බණ්ඩාර මහතා | 3/4 |
| 3. උපාලි විජේවීර මහතා | 4/4 |

ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව ජාතික විගණන කාර්යාලයේ සාමාජිකයින්ටද නිරීක්ෂකයින් ලෙස සහභාගී වීම සඳහා ආරාධනා කරන ලදී.

**රැස්වීම**

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී./31 අනුව වසරකට සිව් වතාවක් කමිටුව රැස් විය යුතුය. සලකා බලන ලද වර්ෂය තුළ කමිටුව සිව් වතාවක් රැස් වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටු වාර්තා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා දෙන ලදී.

**මූලික වගකීම්**

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා පාලක සභාවට සහාය වීමයි.

මූලික වගකීම් වනුයේ,

1. මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතු වලට අදාළ ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.
3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සහ වැඩසටහන් අනුමත කිරීම.
4. අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරීම.
5. බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම.
6. අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායී ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම, අනුකූලතාවය පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම.
7. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් නීතිරීති රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න සොයා බැලීම.

8. පිරිවැය ඵලදායීත්වය ඇතිකිරීම සහ අනවශ්‍ය වැය කපාහැරීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට වරක් ආයතනයේ ක්‍රියාකාරීත්වය ඇගයීම.

**වසර තුළ ක්‍රියාකාරකම්**

විමර්ශනයට ලක් කරන ලද වසර තුළ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

**1. අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩ සටහන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.**

2022 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන, කමිටුව අනුමත කර වසර මුළුල්ලේම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාවය, විමසුම් වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සිදු කර ඇත.

**2. නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය.**

බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සමාලෝචනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, පාරිතෝෂිත ගෙවීම, විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම සහ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම යනාදී ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීම පිළිබඳව තවදුරටත් කමිටුව විසින් පසුවිපරම් කරන ලදී.

**3. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අඛන්ඩ සමාලෝචනය සහ අධීක්ෂණය.**

බැඳුම්කර කඩකරන ලද කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව කමිටුව විසින් සමාලෝචනය සහ අධීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ බැඳුම්කර කඩකරනු ලැබූ පුද්ගලයින්ගෙන් රුපියල් මිලියන 67.4 කට ආසන්න මුදලක් විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට හැකියාව ලැබුණි. 2022 වර්ෂය ආරම්භයේ බැඳුම්කර කඩවූවන් 28 දෙනෙකු සිටින ලදී. 5 දෙනෙකුගෙන් මුළු බැඳුම්කර වටිනාකම වර්ෂය තුළ අයකර ගැනීමට හැකියාව ලැබුණි. 6 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් වාරික වශයෙන් නිසි පරිදි ගෙවමින් සිටින අතර ගෙවීම් පැහැරහැර ඇති 03 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත. වාරික මුදල් ගෙවීම ප්‍රමාද වූ පුද්ගලයන් 06 දෙනෙකුට මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත.

**4. අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත් කිරීම.**

ස්ථාවර වත්කම් පාලනය, කොන්ත්‍රාත් කටයුතු සඳහා වියදම් ක්‍රමවත් කිරීම, පුස්තකාල පොත් බැහැර දීම්, වාර්ෂික ගබඩා තොග සමීක්ෂණ/ස්ථාවර වත්කම් සමීක්ෂණ, බැඳුම්කර මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම, හඳුනා නොගත් සහ අයකර ගත නොහැකි ණය ශේෂයන් විසඳීම හා පෞද්ගලික ආරක්ෂක අංශයේ කටයුතු පරීක්ෂා කිරීම යන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දෙන ලදී. තවද විගණකාධිපති විසින් 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන වාර්තා හා විගණන විමසුම් වලින් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් නිවැරදි කිරීමට ගනු ලැබූ පියවරයන් පිළිබඳව අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

## 5. විගණන කමිටු රැස්වීම.

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර තුළ විගණන කමිටුව සිව් වතාවක් රැස් විය. විගණන කමිටු සාමාජිකයින් සෑම විගණන කමිටුවක් සඳහාම ක්‍රියාකාරී ලෙස දායක විය. ආරාධිත නිරීක්ෂකයකු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගී විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයින්ට අවශ්‍ය වූ විට පැමිණීම සඳහා ආරාධනා කරන ලදී. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

## 6. ගබඩා තොග පරීක්ෂාව

2022 වර්ෂය තුළ කාර්තුමය ගිණුම් පරීක්ෂාවට අනුකූලව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ප්‍රධාන ගබඩාවන් සහ, රාගම වෛද්‍ය පීඨ පරිශ්‍රයේ පිහිටි ගබඩාවෙහි 2022 සැප්තැම්බර් 30 දිනට පැවති තොග ශේෂ සහ 2022 දෙසැම්බර් 19 දිනට පැවති තොග ශේෂ සත්‍යාපනය කිරීමට කටයුතු කරන ලදී. ඒ ඒ තොග සමීක්ෂණයට අදාළව තොග සමීක්ෂණ වාර්තාවන් ද නිකුත් කරන ලදී.

## 7. කාර්තුමය ගිණුම් පරීක්ෂාව

පාලක සභා තීරණයක් අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ සෑම කාර්තුවක් සඳහාම පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලද අතර එම පරීක්ෂා කිරීම් වලට අදාළව පිළියෙළ කරන ලද වාර්තා විගණන කමිටුවට හා පාලක සභාව වෙතද ඉදිරිපත් කරන ලදී. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව මගින් 2022.12.31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව සත්‍ය හා සාධාරණ මතයක් ලබාදී ඇත.

## නිගමනය

2022 වසර තුළ කමිටුව විසින් සළකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබාදෙන ලද නිර්දේශ මත පසුවිපරම් කටයුතු සිදුකිරීමේ සාර්ථකත්වය පිළිබඳව කමිටුව සෑහීමකට පත්විය.

සභාපති,
විගණන කමිටුව,
කැලණිය විශ්වවිද්‍යාලය

